# 131 වන අධිකාරය
# කාර්මික ආරාවුල් පනත

කාර්මික ආරාවුල් වැළැක්වීම, විමර්ශණය කිරීම සහ නිරවුල් කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික හෝ කරුණු සඳහා ද විධිවිධාන සැළැස්වීම පිණිස වූ පනතකි.

පනත්
1950 අංක 43
1956 අංක 25
1957 අංක 14
1957 අංක 62
1962 අංක 4
1966 අංක 27
1968 අංක 39
ජාතික රාජ්‍ය සභා පනත්
(1973 අංක 53
1983 අංක 12)

(1951 සැප්තැම්බර් 01)

## I වන කොටස

ප්‍රාරම්භය

ලුහුඬු නාමය

1. මේ පනත කාර්මික ආරාවුල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## II වන කොටස

කොමසාරිස්වරයාගේ කාර්ය භාරය සහ සමාදාන කිරීමෙන් හෝ බේරුම්කරුවකු මගින් බේරුම් කිරීමෙන් හෝ කාර්මික අධිකරණයක් මගින් හෝ නිරවුල් කිරීම සඳහා කාර්මික ආරාවුල් යොමු කළ යුත්තේ කවර අවස්ථා වලදී ද යන වග

(1968 අංක 39, 2 වන වගන්තිය
1966 අංක 27 2 වන වගන්තිය)

කාර්මික ආරාවුල් විෂයෙහි කොමසාරිස්වරයා සතු කාර්ය.

2. (1) කාර්මික ආරාවුලක් පවත්නා බවට හෝ කාර්මික ආරාවුලක් ඇතිවීමට ඉඩ තිබෙන බවට හෝ, තමා වෙත කරන ලද දැන්වීමකින් නැතහොත් අන්‍යාකාරයකින් කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, ආරාවුලට විෂය වී ඇති කරුණු පරීක්ෂා කර බැලීම සහ මේ පනතේ සඳහන් ක්‍රම අනුව වුව ද නැතහොත් අන්‍යාකාරයකින් වුව ද ඒ ආරාවුල නිරවුල් කිරීමේ අරමුණ පෙරදැරි කොට ගෙන, අවශ්‍ය යයි තමාට හැඟෙන වෙනත් පියවර ගැනීම කොමසාරිස්වරයා සතු කාර්යය වේ.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "කොමසාරිස්වරයා" යන්නට කම්කරු නිළධාරියෙක් ද ඇතුළත් වේ.

(1962 අංක 4 2 වන වගන්තිය)

කාර්මික ආරාවුල් විෂයෙහි කොමසාරිස්වරයා සතු බලය.

3. (1) යම් කාර්මික ව්‍යාපාරයක කාර්මික ආරාවුලක් පවත්නා බවට හෝ යම් කාර්මික ව්‍යාපාරයක කාර්මික ආරාවුලක් ඇති වීමට ඉඩ තිබෙන බවට හෝ කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක දී, ඔහු විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළ හැකිය :-

(අ) ඒ කාර්මික ව්‍යාපාරයේ ඇති වන ආරාවුල් නිරවුල් කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක්, ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු සේවායෝජකයන් ද සේවකයන් ද පිළිවෙලින් නියෝජනය වන සංවිධාන අතර වූ යම් ගිවිසුමක් ප්‍රකාර ඇති කරගෙන තිබේ නම්, ඒ කාර්මික ආරාවුල එකී වැඩ පිළිවෙළට අනුකූලව නිරවුල් කර ගැනීම සඳහා යොමු කිරීම; හෝ

නියමයක් මගින් යොමු කළ හැකිය.

(2) යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා, අමාත්‍යවරයා විසින් ලිඛිත නියමයක් මඟින් එය කාර්මික අධිකරණයක් වෙත යොමු කළ හැකිය.

(ආ) සමාදාන කිරීමෙන් ඒ කාර්මික ආරාවුල නිරවුල් කිරීමට ප්‍රයත්න දැරීම; හෝ

(ඇ) සමාදාන කිරීමෙන් නිරවුල් කිරීම සඳහා යම් බලයලත් නිලධරයකු වෙත ඒ කාර්මික ආරාවුල යොමු කිරීම; හෝ

(ඈ) ඒ කාර්මික ආරාවුලේ පාර්ශව හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ එකඟ වන්නේ නම් , ඒ පාර්ශව නැතහොත් ඔවුන්ගේ නියෝජිතයන් විසින් සාමූහික ව නම් කරනු ලබන බේරුම්කරුවකු වෙත හෝ, එවැනි නම් කිරීමක් කර නොමැති අවස්ථාවක දී කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබූ බේරුම්කරුවකු නැතහොත් බේරුම්කාර මණ්ඩලයක් වෙත හෝ කම්කරු විනිශ්වය අධිකාරයක් වෙත හෝ, ඒ ආරාවුල, නිරවුල් කිරීම සඳහා , ලිඛිත නියමයක් මගින් යොමු කිරීම.

(1957 අංක 62, 2 වන වගන්තිය)

(1962 අංක 4, 3 වන වගන්තිය)

(2) (1) වන උප වගන්තියේ (ඈ) ඡේදය යටතේ පත් කරන ලද බේරුම්කාර මණ්ඩලයක් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) සේවායෝජකයන් විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක්;

(ආ) සේවකයන් විසින් නම් කරනු ලැබූ තැනැත්තෙක් සහ

(1962 අංක 4, 3 වන වගන්තිය)

(ඇ) සභාපති වශයෙන් ක්‍රියා කිරීමට , සේවායෝජකයන් සහ සේවකයන් විසින් සාමූහිකව නම් කරනු ලැබූ හෝ , එවැනි නම් කිරීමක් නොමැති විට , කොමසාරිස්වරයා විසින් නම් කරනු ලැබූ හෝ තැනැත්තෙක්,

යම් කරුණක් සම්බන්ධයෙන් බේරුම්කාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ බහුතර මතය ඒ කරුණ සම්බන්ධයෙන් ඒ මණ්ඩලයේ මතය ලෙස සැළකිය යුතු ය.

(3) කොමසාරිස්වරයා විසින් (1) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේද අතුරින් කවරක් හෝ යටතේ ගන්නා ලද ක්‍රියා මාර්ගයක ප්‍රතිඵලයක් වශයෙන් යම් කාර්මික ආරාවුලක් නිරවුල් නොවූ විට , උචිත යයි කොමසාරිස්වරයා අදහස් කරන්නේ නම්, අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන වාර ගණනක් එකී ඡේද වලින් කවරක් වුව ද යටතේ ඒ ආරාවුල සම්බන්ධයෙන් නැවත නැවත ක්‍රියා කිරීම ඔහු විසින් කළ හැකි ය.

4. (1) යම් කාර්මික ආරාවුලක් සුළු ආරාවුලක් බව අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් , ඒ ආරාවුලේ පාර්ශව හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ කැමති නොවුව ද ඒ නොතකා, එම ආරාවුල බේරුම්කරුනකුගේ මාර්ගයෙන් නිරවුල් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් පත් කරන ලද බේරුම්කරුවකු වෙත හෝ කම්කරු විනිශ්වය අධිකාරයක් වෙත හෝ අමාත්‍යවරයා විසින් ලිඛිත

කාර්මික ආරාවුල් විෂයෙහි අමාත්‍යවරයා සතු බලතල

(1957 අංක 62,
3 වන වගන්තිය)

එසේ වුව ද , ඒ කාර්මික ව්‍යාපාරයේ සේවයේ නියුක්ත කර සිටින සේවකයන්ගේ සේවා කොන්දේසි හා නියමයන්ට අදාළ විධිවිධාන එම ගිවිසුමෙහි ඇතුළත් වේ නම් , එම සේවා කොන්දේසි හා නියමයන් ඒ දිස්ත්‍රික්කයේ පිහිටි එම වර්ගයේ ම හෝ ඊට සමාන හෝ කාර්මික ව්‍යාපාරයක නියුතු වෙනත් සේවකයින්ට අදාළ සේවා කොන්දේසි වලට හා නියමයන්ට වඩා අඩු වාසිදායක නොවන බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන්නේ නම් මිස එම ගිවිසුම ප්‍රසිද්ධ කිරීමට කොමසාරිස්වරයා විසින් කටයුතු නොයෙදිය යුතු ය.

## III වන කොටස

## සාමූහික ගිවිසුම් නිරවුල් කිරීම්, තීරණ සහ ඒවායේ බලපෑම

### (අ) සාමූහික ගිවිසුම්

5.* (1) මේ පනතෙහි “සාමූහික ගිවිසුම” යන්නෙන්_

(අ) (i) යම් සේවායෝජකයෙකු නැතහොත් සේවායෝජකයන් සහ

(ii) සේවකයන් කිසිවකු හෝ සේවකයින්ගෙන් සමන්විත යම් වෘත්තිය සමිතියක් නැතහොත් වෘත්තිය සමිති අතර

ඇති කර ගත් ගිවිසුමක් වන්නා වූ සහ

(ආ) සේවකයන් කිසිවකු සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා නියමයන්ට අදාළ ගිවිසුමක් වන්නා වූ හෝ , යම් සේවායෝජකයකුගේ හෝ සේවායෝජකයන්ගේ හෝ සේවකයන් කිසිවකුගේ හෝ සේවකයන්ගෙන් සමන්විත යම් වෘත්තිය සමිතියක නැතහොත් වෘත්තිය සමිති වල හෝ වරප්‍රසාද වලට, අයිතිවාසිකම් වලට හෝ කාර්ය වලට අදාළ ගිවිසුමක් වන්නා වූ හෝ, යම් කාර්මික ආරාවුලක් නිරවුල් කර ගත යුතු ආකාරය පිළිබඳ ගිවිසුමක් වන්නා වූ ගිවිසුමක් අදහස් වේ.

(2) සාමූහික ගිවිසුමක් අදාළ වන පාර්ශව සහ වෘත්තිය සමිති කවරේ ද යන වග ද සේවායෝජකයන් සහ සේවකයන් කවරහු ද යන වග ද එම ගිවිසුමෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

“සාමූහික ගිවිසුම” යන්නෙහි අර්ථකථනය

6. යම් දිස්ත්‍රික්කයක පිහිටි යම් කාර්මික ව්‍යාපාරයක් සම්බන්ධයෙන් සාමූහික ගිවිසුමක් ලියා එම ගිවිසුමේ දෙපාර්ශවය ම විසින් හෝ ඒ එක් එක් පාර්ශවයේ නියෝජිතයන් විසින් හෝ එය අත්සන් කොට ඇති කල්හි , ඒ කවර පාර්ශවයන් විසින් හෝ, එවැනි යම් පාර්ශවයක් සමන්විත වන්නා වූ නැතහොත් එවැනි යම් පාර්ශවයකට ඇතුළත් වන්නා වූ යම් වෘත්තිය සමිතියක් විසින් හෝ සේවායෝජකයකු විසින් හෝ එම ගිවිසුම කොමසාරිස්වරයා වෙත යැවිය හැකිය. එවිට එම ගිවිසුම නොපමාව ම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීමට කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතු ය.

(1957 අංක 62
4 වන වගන්තිය)

* 4 අ වගන්තිය 1968 අංක 39 දරණ පනත මගින් ඉවත් කරන ලදි.

සාමූහික ගිවිසුම් කොමසාරිස්වරයා වෙත යැවීම සහ ඒ ගිවිසුම් ප්‍රසිද්ධ කිරීම.

(1957 අංක 62,
5 වන වගනතිය)

(1957 අංක 62
5 වන වගන්තිය)

මේ වගන්තියේ කාර්ය සඳහා , වෙනත් යම් සාමූහික ගිවිසුමක අඩංගු සේවා කොන්දේසි හා නියමයන්, එම ගිවිසුම මේ වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ හා තත් කාලයෙහි වලංගුව ඇත්තේ නම් මිස , කිසිඳු සේවකයෙකුට අදාළ වන්නනාක් සේ නොසැළකිය යුතු ය.

7. (1) 6 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ සෑම සාමූහික ගිවිසුමක් ම, එම ගිවිසුම එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයේ සිට හෝ එම ගිවිසුමෙහි තත් කාර්යය සඳහා නිශ්චිත ව සඳහන් කර ඇති වෙනත් දිනයක් නොහොත් ඒ දිනයේ සිට හෝ බලාත්මක වන්නේ ය.

(2) යම් සාමූහික ගිවිසුමක් යම් කාල සීමාවක් සඳහා හෝ ඒ ගිවිසුමෙහි නිශ්චිත ව සඳහන් දිනයක් දක්වා හෝ බලාත්මක ව පවතින්නේ යයි එම ගිවිසුමෙහි සඳහන් කර ඇති අවස්ථාවක එම 9 වන වගන්තියෙන් විධිවිධාන සළස්වා ඇති ආකාරයට එහි බලපෑම කලින් නතර නොවුවහොත් මිස ගිවිසුම (1) වන උපවගන්තියෙහි විධිවිධාන සළස්වා ඇති පරිදි බලාත්මක වන දිනයෙහි සිට, එසේ විධිවිධාන සළස්වා ඇති කාලසීමාව අවසන් වන තෙක් හෝ එසේ නිශ්චිත ව සඳහන් දිනය තෙක් හෝ, බලාත්මකව පවතින්නේ ය.

(3) යම් සාමූහික ගිවිසුමක් බලාත්මකව පැවතිය යුතු කාලසීමාව හෝ එය බලාත්මකව පැවතිය යුත්තේ යම් දිනයක් දක්වා ද ඒ දිනය හෝ එම ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී (1) වන උප වගන්තියෙන් විධිවිධාන සළස්වා ඇති පරිදි එය බලාත්මක වන දිනයේ සිට 9 වන වගන්තියෙන් විධිවිධාන සළස්වා ඇති පරිදි එහි බලපෑම නතර වන තෙක් එය බලපවත්වන්නේ ය.

8. (1) යම් සාමූහික ගිවිසුමක් තත් කාලයෙහි වලංගුව පවතී ද , 5 (2) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එම ගිවිසුමෙහි සඳහන් පාර්ශව, වෘත්තිය සමිති, සේවායෝජකයෝ සහ සේවකයෝ මේ පනතේ කාර්ය සඳහා එම ගිවිසුමෙන් බැඳී සිටින්නෝ ය . තව ද එවැනි ගිවිසුමක නියමයන් එම ගිවිසුමෙන් බැඳී සිටින සේවායෝජකයන් සහ සේවකයන් අතර ඇති කර ගන්නා ලද සේවා නියෝග ගිවිසුමේ ව්‍යාපිත නියමයන් වන්නේ ය.

(2) සාමූහික ගිවිසුමකින් බැඳුනු සේවකයන් කිසිවකු යම් කාර්මික ව්‍යාපාරයක සේවයේ නියුක්ත කර සිටිත් නම් , ඒ ගිවිසුමේ සඳහන් ව ඇති සේවා කොන්දේසි හා නියමයන්ට අඩු වාසිදායක නොවන සේවා කොන්දේසි හා නියමයන් ඒ කාර්මික ව්‍යාපාරයේ යොදවා සිටින සෙසු සේවකයන් සම්බන්ධයෙන් ද, ඒ ගිවිසුමේ ඊට පටහැනි විධිවිධානයක් ඇත්නම් මිස , ඒ කාර්මික ව්‍යාපාරයේ සේවායෝජකයා විසින් අනුගමනය කළ යුතු ය.

9. (1) සාමූහික ගිවිසුමකින් බැඳී සිටින යම් පාර්ශවයක් හෝ වෘත්තිය සමිතියක් හෝ සේවායෝජකයෙකු හෝ විසින්, නියමිත ආකෘතිය අනුව වූ ලිඛිත දැන්වීමක් කොමසාරිස්වරයාට හා ඒ ගිවිසුමෙන් බැඳී සිටින අනෙක් සියළු පාර්ශව වලට , වෘත්තිය සමිති වලට සහ සේවායෝජකයන්ට භාර දීමෙන් එම ගිවිසුම ප්‍රතික්ෂේප කළ හැකි ය.

සාමූහික ගිවිසුමක් බලාත්මක බවට පත් වන දිනය සහ එම ගිවිසුම බලපවත්නා කාලය

විසින් දෙන ලද ප්‍රතික්ෂේප කිරීමේ යම් දැන්වීමක් වේ නම් එය මේ පනතේ කාර්ය සඳහා වලංගු දැන්වීමක් නොවන්නේ ය.

(2) සාමූහික ගිවිසුමක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් කොමසාරිස්වරයා වෙත ලැබුණු අවස්ථාවක දී , මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධාන වලට යටත්ව,

සාමූහික ගිවිසුමක බලපෑම.

(1957 අංක 62
6 වන වගන්තිය)

(අ) කොමසාරිස්වරයා වෙත එම දැන්වීම ලැබුණු මාසයට පසුව එළඹෙන මාසය අවසාන වූ විට, ඒ දැන්වීම අදාළ ගිවිසුම අවසාන වන්නේ ය ; එහි බලපෑම නතර වන්නේ ය . තව ද

සාමූහික ගිවිසුමක් අවසාන කිරීම.

(ආ) එකී ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම, (අ) ඡේදයේ විධිවිධාන පරිදි ගිවිසුම අවසාන වන වේලාව පිළිබඳ ප්‍රකාශයක් ද සමඟ, ගැසට් පත්‍රයේ

එසේ වුව ද, එවැනි ගිවිසුමකින් බැඳී සිටින පාර්ශවයන් වන හෝ පාර්ශවයන්ට ඇතුළත් වන හෝ වෘත්තිය සමිතියක සාමාජිකයෙකු වන්නා වූ යම් සේවායෝජකයකුට එම වෘත්තිය සමිතියෙන් ස්වාධීනව එම ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමේ හිමිකම නොමැත්තේ ය. එසේ ස්වාධීනව එවැනි යම් සේවායෝජකයකු

ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය.

එසේ වුව ද යම් ගිවිසුමක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් , එම ගිවිසුමේ පාර්ශවයකට ඇතුළත් වන සියලු වෘත්තිය සමිති හෝ සියලු සේවායෝජකයන් හෝ විසින් නොව , ඉන් එක් වෘත්තිය සමිතියක් නැතහොත් වෘත්තිය සමිති කීපයක් විසින් හෝ එක් සේවායෝජකයකු නැතහොත් සේවායොජකයන් කීපදෙනෙකු විසින් හෝ පමණක් භාරදෙනු ලැබ ඇති අවස්ථාවක දී , එම ගිවිසුමේ බලපැවැත්වීම, ඒ දැන්වීම භාරදුන් එක් එක් වෘත්තිය සමිතිය විෂයෙහි හා ඒ වෘත්තිය සමිතියේ සාමාජිකයන් විෂයෙහි නැතහොත් ඒ දැන්වීම භාරදුන් එක් එක් සේවායෝජකයා විෂයෙහි පමණක් නතර වන අතර, ඒ හැර එම ගිවිසුම තවදුරටත් වලංගුව හා බල සහිතව පවතින්නේ ය.

10. (1) බලපවත්නා සාමූහික ගිවිසුමක පාර්ශව , යම් කාර්මික ව්‍යාපාරයක සේවායෝජකයන්ගෙන් සමන්විත වෘත්තිය සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් ද ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු සේවකයන්ගෙන් සමන්විත වෘත්තිය සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් ද වන අවස්ථාවක දී , එම පාර්ශව මගින්, ඒ දිස්ත්‍රික්කයේ ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු හෝ ශ්‍රී ලංකාවේ ඒ කාර්මික ව්‍යාපාරයේ නියුතු හෝ_

(අ) සේවායෝජකයන් හා සේවකයන් හෝ
(ආ) සේවායෝජක පන්තියක් හෝ සේවක පන්තියක්, හෝ
(ඇ) සේවායෝජකයන් හෝ සේවක පන්තියක්, හෝ
(ඈ) සේවායෝජක පන්තියක් හා සේවකයන් හෝ

ප්‍රමාණයන් පරිදි නියෝජනය වන්නේ යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන්නේ නම් , ඒ දිස්ත්‍රික්කයේ ඒ කාර්මික ව්‍යාපාරයේ හෝ ශ්‍රී ලංකාවේ ඒ කාර්මික ව්‍යාපාරයේ හෝ නියුතුව සිටින්නා වූ ද 8 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ ගිවිසුමින් බැඳී නොසිටින්නා වූ ද සැම සේවායෝජකයකු ම සම්බන්ධයෙන් නැතහොත් ඒ සේවායෝජක පන්තියට අයත් සැම සේවායෝජකයකුම සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ නියමයන් අමාත්‍යවරයා විසින් කළ හැකිය.

(2) යම් දිස්ත්‍රික්කයක හෝ ශ්‍රී ලංකාවෙහි හෝ පිහිටියා වූ ද (1) වන උපවගන්තියෙහි සඳහන් පරිදි වූ සාමූහික ගිවිසුමක් අදාළ වන්නා වූ ද යම් කාර්මික ව්‍යාපාරයක නියුතු වූ සහ 8 වන වගන්තියේ විධිවිධාන පරිදි ඒ ගිවිසුමෙන් බැඳී නොසිටින්නා වූ සැම සේවායෝජකයකු ම හෝ යම් පන්තියක සැම සේවා යෝජකයකු ම හෝ

8 වන වගන්තියේ විධිවිධාන පරිදි ඇතැම් සාමූහික ගිවිසුම් මගින් බැඳීමකට යටත් නොවන සේවායෝජකයන් සම්බන්ධයෙන් වූ නියමයන්.

(1957 අංක 14
2 වන වගන්තිය)

විසින්, ඒ ගිවිසුමෙහි ඇතුළත් (මෙහි මින් මතු “පිළිගත් කොන්දේසි හා නියමයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) කොන්දේසි හා නියමයන් හෝ පිළිගත් කොන්දේසි වලට හා නියමයන්ට වඩා අඩු වාසිදායක නොවන කොන්දේසි හා නියමයන් හෝ, පිළිපැදිය යුතු බවට (1) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව අමාත්‍යවරයා විසින් නියමයක් කළ හැකි ය. 2 වන වගන්තිය)

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි ද එක් සිංහල පුවත්පතක ද එක් දෙමළ පුවත්පතක සහ එක් ඉංග්‍රීසි පුවත්පතක ද ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර, එසේ ප්‍රසිද්ධ කරනු ලැබූ විට ඊට නීතියේ බලය ලැබෙන්නේ ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(4) (2) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර_

(අ) එවැනි නියමයක් කිරීමට අමාත්‍යවරයා අදහස් කරන බවට දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ එක් සිංහල පුවත්පතක ද එක් දෙමළ පුවත්පතක ද සහ එක් ඉංග්‍රීසි පුවත්පතක ද ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැළැස්විය යුතු අතර, යෝජිත නියමයන්ට විරුද්ධ ව ඉදිරිපත් කරනු ලබන විරෝධතා කිසිවක් වේ නම් ඒ විරෝධතා කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුත්තේ කවර දිනක ද නැතහොත් කවර දිනකට පෙර ද යන්න එම දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය යුතු ය; තව ද

(1957 අංක 14
2 වන වගන්තිය)

(ආ) කොමසාරිස්වරයා වෙත ලැබෙන විරෝධතා ඔහු විසින් තම නිරීක්ෂණ ද සමඟ අමාත්‍යවරයාගේ සැළකිල්ලට භාජන කරනු සඳහා අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය.

(5) යෝජිත නියමයට විරුද්ධ ව ඇති සියලු විරෝධතා අමාත්‍යවරයා විසින් සලකා බැලිය යුතු අතර ඉන්පසු එම නියමය නොකිරීම නැතහොත් එම නියමය අදාළ කිරීම සම්බන්ධයෙන් යම් සීමා කිරීමක් සහිත ව හෝ රහිත ව හෝ එම නියමය කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකිය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(6) (1) වන උපවගන්තියේ යේ සඳහන් පරිදි වූ යම් සාමූහික ගිවිසුමක පාර්ශවයක්

(1957 අංක 14

විසින්, ඒ ගිවිසුම සම්බන්ධයෙන්, (2) වන උපවගන්තිය යටතේ නියෝගයක් කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(7) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් පරිච්ඡින්න කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සළකන්නේ නම් එම නියමය එසේ පරිච්ඡින්න කළ හැකි ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(8) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් අදාළ වන්නා වූ සාමූහික ගිවිසුමක් බලපැවැත්වීම 7 වන වගන්තියේ විධිවිධාන අනුව අවසාන වූ කල්හි, යට කී නියමයන් බලපෑම ද අවසන් වන්නේ ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(9) යම් දිස්ත්‍රික්කයක හෝ ශ්‍රී ලංකාවෙහි හෝ පිහිටි යම් කාර්මික ව්‍යාපාරයකට අදාළ පිළිගත් කොන්දේසි හා නියමයන්හි ස්වාභාවය, විෂය පථය හෝ බලපෑම සම්බන්ධයෙන් නැතහොත්, පිළිගත් කොන්දේසි හා නියමයන් හෝ එකී පිළිගත් කොන්දේසි හා නියමයන්ට වඩා අඩු වාසිදායක නොවන කොන්දේසි හා නියමයන් හෝ යම් සේවායෝජකයකු විසින් පිළිපදිනු ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් මතු වුවහොත් , නියමිත කාලය තුළ දී නියමිත ආකාරයට කාර්මික අධිකරණයක් වෙත අභියාචනය කරනු ලැබීමට යටත් ව , කොමසාරිස්වරයා විසින්, ඒ ප්‍රශ්නය පිළිබඳ තීරණයක් දිය යුතුය . තවද ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වන්නේ ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

(1957 අංක 14
2 වන වගන්තිය)

(10) (2) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝගයක් ඇතුලත් ගැසට් උද්ධෘතයක් හෝ , ඒ උපවගන්තිය යටතේ නියමයක් කිරීමේ අධ්‍යාශය පිළිබඳ ව ප්‍රසිද්ධ කරන ලද්දා වූ ද ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරවන ලදැයි සළකනු ලබන්නා වූ ද දැන්වමක් හෝ එවැනි නියමයක නැතහොත් දැන්වීමක සත්‍ය පිටපතක් බවට කොමසාරිස්වරයා විසින් සහතික කරනු ලැබූ පිටපතක් , එවැනි නියෝගයක් නැතහොත් දැන්වීමක් පිළිබඳ සාක්ෂි වශයෙන් කවර අධිකරණයකට වුව ද ඉදිරිපත් කළ හැකි ය.

(1957 අංක 14
2 වන වගන්තිය)

සාමූහික ගිවිසුම්වල අර්ථ නිරූපනය

10 අ. යම් සාමූහික ගිවිසුමක අර්ථ නිරූපණය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් මතු වුවහොත් ඒ ප්‍රශ්නය නිරාකරණය කළ යුත්තේ කවුරුන් විසින්ද යන්න සම්බන්ධයෙන් විධිවිධාන කිසිවක් එම ගිවිසුමෙහි නොමැති නම් , එම ප්‍රශ්නය පිළිබඳ ව තීරණයක් කිරීම සඳහා ඒ ගිවිසුමේ කවර පාර්ශවයක් විසින් වුවද එය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය . එවිට කොමසාරිස්වරයා විසින් ඒ ප්‍රශ්නය පිළිබඳ තීරණයක් කළ යුතුය.

(1957 අංක 62
7 වන වගන්තිය)

සාමූහික ගිවිසුමකින් බැඳී සිටින සේවායෝජකයකු විසින්, ඒ ගිවිසුමේ විධිවිධාන ඇතුළත් ඒ ගිවිසුමේ විධිවිධාන දැන්වීමක් ප්‍රදර්ශණය කර තැබිය යුතු බව

10 ආ. සාමූහික ගිවිසුමකින් බැඳී සිටින සෑම සේවායෝජකයකු ම විසින්, ඒ ගිවිසුමේ විධිවිධාන කවරේ දැයි දැක්වෙන සිංහල භාෂාවෙන් ද දෙමළ භාෂාවෙන් ද ඉංග්‍රීසි භාෂාවෙන් ද වූ දැන්වීමක්, ඒ ගිවිසුමට අදාළ කාර්මික ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ ප්‍රකටව පෙනෙන සේ ප්‍රදර්ශනය කර තැබිය යුතු ය.

(1957 අංක 62
7 වන වගන්තිය)

(4) යම් කාර්මික ආරාවුලක් නිරවුල්කිරිමට කොමාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධරයකු හෝ ප්‍රයත්න දරන ලද නමුත් එය නිරවුල් කිරිමට ඔහුට නොහැකි වූ විටක, තම විමර්ශනය අවසන් වූ පසු කොමසාරිස්වරයා හෝ ඒ බලයලත් නිලධරයා හෝ විසින් ඒ ආරාවුල පිළිබඳ ව සම්පූර්ණ

(ආ) සාමාදාන කිරිමෙන් නිරවුල් කිරිම

11. (1) 3 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් කාර්මික ආරාවුලක් සමාදාන කිරිමෙන් නිරවුල් කිරිමට කොමසාරිස්වරයා විසින් ප්‍රයත්න දරන විට හෝ එසේ නිරවුල් කිරිම සඳහා කාර්මික ආරාවුලක් යම් බලයලත් නිලධරයකු වෙත යොමු කර ඇති විට , ආරාවුලට තුඩු දුන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයයි කොමසාරිස්වරයා හෝ ඒ නිලධරයා හෝ අදහස් කරන විමර්ශණ පැවැත්වීමෙන් පසු ඒ ආරාවුල නිරවුල් කිරිමට ප්‍රයත්න දැරීම, කොමසාරිස්වරයාගේ හෝ ඒ නිලධාරියා ගේ හෝ යුතුකම වන්නේ ය . ආරාවුල සම්බන්ධයෙන් සාධාරණ වුත් සමාදානයෙන් කරගන්නා වුත් නිරවුල් කිරිමක් ආරාවුලට සම්බන්ධ පාර්ශව අතර ඇති කරවීම සඳහා ඒ පාර්ශව පොළඹවා ගැනිමට උචිත යයි ඔහු විසින් සළකනු ලබන සියලු පියවර ඉහත සඳහන් කාර්ය උදෙසා ඔහු විසින් ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ විමර්ශනයක් පවත්වන කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයකු හෝ විසින්, ඒ විමර්ශනය පැවත්විමේ දි තමා විසින් අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටිය කවරේ දැයි, මේ පනතේ 39(1)(ඊ) වගන්තිය යටතේ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි නියෝග වලට යටත් ව නිශ්වය කරනු ලැබීය හැකි ය.

(3) කාර්මික ආරාවුලක් සමාදාන කිරිමෙන් නිරවුල් කිරිම කාර්යය සඳහා වු සෑම විමර්ශනයක් ම ඒ විමර්ශනය ආරම්භ කරන දින සිට මාසයක් ඇතුළත දි අවසන් කරනු ලැබි ය යුතු ය.

එසේ වුවද, ඒ විමර්ශනය අවසන් කිරිම සඳහා නියමිත කාලය කොමසාරිස් වරයා විසින් දිර්ඝ කළ හැකි ය.

කාර්මික ආරාවුල් සමාදාන කිරීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයකු හෝ සතු කාර්ය හා බලතල සහ එවැනි ආරාවුල් පිළිබඳ විමර්ශණය අවසන් කළ යුතු කාලසීමාව

(1957 අංක 62
8 වන වගන්තිය)

12. (1) කාර්මික ආරාවුලක් නිරවුල් කිරිමට කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයකු හෝ සමත් වු විට කොමසාරිස්වරයා විසින් හො ඒ නිලධරයා විසින් හෝ එකි නිරවුල් කිරිමේ කොන්දේසි පත්‍රයක් පිළියෙල කල යුතු අතර, ආරාවුලට සම්බන්ධ දෙපාර්ශ්වය ම විසින් හෝ ඒ එක් එක් පාර්ශ්වයේ නියෝජතයන් විසින් හෝ සටහන් පත්‍රය අත්සන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියා පිළියෙල කරන ලද සෑම නිරවුල් කිරිමේ කොන්දේසි පත්‍රයකම එය අදාළ වන පාර්ශ්ව සහ වෘත්තිය සමිති ද සේවා යෝජකයන් සහ සේවකයන් ද කවරහු දැයි සඳහන් කරනු ලැබිය යුතු ය.

(1957 අංක 62
8 වන වගන්තිය)

(3) යම් ආරාවුලක් බලයලත් නිලධරයකු විසින් නිරවුල්කරන ලද අවස්ථාවක එම නිරවුල් කිරිමේ කොන්දේසි පත්‍රය, ඔහු විසින් නොපමාව ම කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

(1957 අංක 62
8 වන වගන්තිය)

නිරවුල් කිරීමේ සටහන් පත්‍රය සහ ආරාවුලට අදාළ වාර්තාව ආදිය

(7)(අ) (4)
වන
උපව
ගන්ති
ය
යටතේ
තේ
වාර්තා
තාවක්
පිළියෙ
යෙල
කරනු
ලැබූ
විට,
ඒ
වාර්තා
තාව
අදාළ
වන
කාර්මි
මික
ආරාවු
වුල
නිරවු
ල්
කිරීම
ට
ප්‍රයත්
න
දැරීමේ
මේදී ,
ඒ
ආරාවු
වුල
නිරවු
ල
කිරීම
සම්බ
න්ධයෙ
යෙන්
වූ තම
නිර්දේ
දේශ ,
ඒ
වාර්තා
තාව
පිළියෙ
යෙල
කළ

වාර්තාවක් පිළියෙළ කළ යුතු අතර , එම ආරාවුල විමර්ශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහා තමා විසින් ගන්නා ලද පියවර ද ඒ ආරාවුල නිරවුල් කිරීම සඳහා තමා ඉදිරිපත් කරන නිර්දේශ ද එම වාර්තාවෙහි දැක්විය යුතු ය.

නිරවුල් කිරීම පිළිබඳ ව එසේ ඉදිරිපත් කරනු ලබන නිර්දේශයෙහි, එම නිරවුල් කිරීම අදාළ වන පාර්ශව සහ වෘත්තිය සමිති ද සේවායෝජකයන් සහ සේවකයන් ද කවරහු දැයි සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) බලයලත් නිලධරයකු විසින් (4) වන උප වගන්තිය යටතේ වාර්තාවක් පිළියෙළ කරන ලද විටෙක ඔහු විසින් එම වාර්තාව නොපමාව ම කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

(6) කොමසාරිස්වරයාගේ මතය අනුව බැරෑරුම් කාර්මික ආරාවුලක් වන යම් කාර්මික ආරාවුලකට අදාල නිරවුල් කිරීමේ සෑම කොන්දේසි පත්‍රයක් ම නොපමාව ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැළැස්විය යුතු ය.

නිලධරයා විසින්, ඒ ආරාවුලේ දෙපාර්ශවය හෝ ඒ දෙපාර්ශවයේ නියෝජිතයන් හෝ විසින් සලකා බලනු ලැබීම සඳහා ඔවුන් වෙත ඉදිරිපත් කර නොතිබුණේ නම් කොමසාරිස්වරයා විසින් ඒ වාර්තාවේ පිටපතක් ඒ පාර්ශව වලට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ ලබා දිය යුතු අතර , ඒ වාර්තාවෙහි නිර්දේශ කර ඇති නිරවුල් කිරීම ඔවුන් පිළිගන්නේ ද ප්‍රතික්ෂේප කරන්නේ ද යන වග , තත් කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින්න් නියම කරනු ලබන දිනයක සිට දින දහහතරක් ඇතුළත දී තමා වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලෙස ඔවුන්ට නියම කළ යුතු ය . ඉහත සඳහන් දින දහහතර ඇතුළත දී ඒ පාර්ශව වලින් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් හෝ පිළිතුරක් නොලැබුනහොත් ඒ නිරවුල් කිරීම ඔවුන් විසින් පිළිගනු ලැබී යයි සැළකිය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් නිර්දේශිත නිරවුල් කිරීම , එම නිරවුල් කිරීමට අදාළ කාර්මික ආරාවුලකට සම්බන්ධ දෙපාර්ශවය විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ පිළිගන්නා ලද අවස්ථාවක දී නැතහොත් පිළිගනු ලැබී යයි එකී ඡේදයට අනුව සළකනු ලබන අවස්ථාවක දී_

(i) ඒ නිරවුවුල්ල් කිරීම ඇතුළත් වාර්තාතාව සහ, එ

කී පාර්ශව විසින් නැතහොත් ඔවුන්ගේ නියෝජිතයන් විසින් එය පිළිගත්බව කියවෙන ප්‍රකාශය හෝ , එම නිරවුල් කිරීම පිළිගත් බවට ඉහත (අ) ඡේදය යටතේ සළකනු ලබන්නේ නම් ඒ බවට කොමසාරිස්වරයාගේ ප්‍රකාශයක් හෝ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැළැස්විය යුතු ය; තව ද

(ii) එම නිරවුල් කිරීම , එය අදාළ වන කාර්මික ආරාවුලට සම්බන්ධ දෙපාර්ශවය ම විසින් නැතහොත් ඔවුන්ගේ නියෝජිතයන් විසින් අත්සන් කරන ලද්දක් පරිද්දෙන් බලාත්මක වන්නේ ය. ඒ අනුව, එම නිරවුල් කිරීම ඇතුළත් වාර්තාව, ඒ ආරාවුල නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයක් වූ පරිද්දෙන් 13 වන වගන්තිය ඊට අදාල වන අතර 12(2) වන වගන්තිය පිළිබඳව 14 වන වගන්තියෙහි කර ඇති සඳහන 12(4) වන වගන්තිය පිළිබඳ ව ඇති සඳහනක් වූ පරිද්දෙන් සලකා 14 වන වගන්තිය එම නිරවුල් කිරීමට අදාළ වන්නේ ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් නිර්දේශිත නිරවුල් කිරීම අදාළ වන කාර්මික ආරාවුලට සම්බන්ධ දෙපාර්ශවය ම හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් එම නිරවුල් කිරීම පිළිනොගෙන ඇති අවස්ථාවක නැතහොත් ඔවුන් විසින් එය පිළිගනු ලැබී යයි එම ඡේදය යටතේ සළකනු නොලබන අවස්ථාවක එම වාර්තාව ප්‍රසිද්ධ කළ යුතු යයි කොමසාරිස්වරයා අදහස් කරන්නේ නම් , ඒ වාර්තාවෙන් නිර්දේශ කර ඇති නිරවුල් කිරීම ඒ පාර්ශව විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ පිළිගනු ලැබී යයි මේ උප වගන්තියේ (අ) ඡේදය යටතේ සළකනු නොලබන බවට වන ප්‍රකාශයක් ද සමඟ එම වාර්තාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැළැස්විය යුතු ය.

නිරවුල් කිරීමක් ක්‍රියාත්මක වන දිනය සහ එය වලංගුව පවත්නා කාලය

13. (1) 12(6) වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සෑම නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයක් ම එම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දිනයන්හි දී හෝ ඒ සටහන් පත්‍රයෙහි තත් කාර්යය සඳහා නිශ්චිතව සඳහන් යම් දිනයක් වේ නම් ඒ දිනයෙහි දී, හෝ බලාත්මක වන්නේ ය . ඒ වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු නොලැබූ සෑම නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයක් ම ඒ ආරාවුලට සම්බන්ධ පාර්ශව විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ එම සටහන් පත්‍රය අත්සන් කරන ලද දිනයේ දී හෝ තත් කාර්යය සඳහා ඒ

සටහන් පත්‍රයේ යම් දිනයක් සඳහන් වේ නම් ඒ දිනයේ දී හෝ බලාත්මක වන්නේ ය.

(2) නිරවුල් කිරීම , එහි නිශ්චිත ව සඳහන් දිනයක් දක්වා හෝ එසේ සඳහන් කාලසීමාවක් හෝ බලසහිතව පැවතිය යුතු බවට නිධිවිධාන එම නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයෙහි සලස්වා ඇති අවස්ථාවක 15 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි, එහි බලපෑම කලින් නතර වුවහොත් මිස (1) වන උපවගන්තියේ විධිවිධාන සළස්වා ඇති පරිදි එම කොන්දේසි පත්‍රය බලාත්මක වන දිනයෙහි සිට යට කී පරිදි නිශ්චිතව සඳහන් දිනය තෙක් හෝ එසේ සඳහන් කාලය අවසන් වන තෙක් හෝ එම කොන්දේසි පත්‍රය බලසහිත ව පවතින්නේ ය.

(3) නිරවුල් කිරීම බල සහිතව පැවතිය යුත්තේ කවර දිනයක් තෙක් ද නැතහොත් කවර කාලයක් ඉකුත් වන තෙක් ද යනුවෙන් කාලසීමාවක් හෝ දිනයක් හෝ යම් කොන්දේසි පත්‍රයක නිශ්චිතව සඳහන් කර නොමැති අවස්ථාවක දී (1) වන උපවගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි ඒ නිරවුල් කිරීම බල සහිත වූ දිනයේ සිට 15 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර එම බලාන්විතභාවය අවසන් වන තෙක්, එය බලසහිතව පවතින්නේ ය.

14. තත් කාලයෙහි බල සහිතව පවත්නා සෑම නිරවුල් කිරීමක් ම මගින් , මෙම පනතේ කාර්ය සඳහා, 12(2) වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව , ඒ නිරවුල් කිරීමෙහි සඳහන් පාර්ශව, වෘත්තිය සමිති, සේවායෝජකයන් සහ සේවකයන් විෂයෙහි බැඳීමක් ඇති කරවන අතර ඒ නිරවුල් කිරීමේ නියමයන් , ඒ නිරවුල් කිරීමෙන් බැඳී සිටින සේවායෝජකයන් සහ සේවකයන් අතර ඇති සේවා ගිවිසුමෙහි ව්‍යවස්ථාපිත නියමයන් වන්නේ ය.

15. (1) මේ පනත යටතේ නිරවුල් කිරීමකින් බැඳී සිටින පාර්ශවයක්, යම් වෘත්තිය සමිතියක්, සේවායෝජකයකු හෝ සේවකයකු විසින්, නියමිත ආකෘතියට අනුව වූ ලිඛිත දැන්වීමක් කොමසාරිස්වරයා වෙත සහ ඒ නිරවුල් කිරීමෙන් බැඳී සිටින අනෙක් සෑම පාර්ශවයක්, වෘත්තිය සමිතියක්; සේවායෝජකයකු සහ සේවකයකු ද වෙත යැවීමෙන් එම නිරවුල් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

එසේ වුව ද_

(අ) ඒ නිරවුල් කිරීමෙන් බැඳී සිටින පාර්ශවයක් වන නැතහොත් එවැනි පාර්ශවයකට ඇතුළත් වන වෘත්තිය සමිතියක සාමාජිකයෙකු වන්නා වූ යම් සේවායෝජකයෙකුට හෝ සේවකයෙකුට ඔහුගේ වෘත්තිය සමිතියෙන් ස්වාධීනව ඒ දැන්වීම යැවීම අවශ්‍ය නොවන්නේ ය.

(ආ) ඒ නිරවුල් කිරීමෙන් බැඳී සිටින පාර්ශවයක් වන නැතහොත් එවැනි පාර්ශවයකට ඇතුළත් වන වෘත්තිය

සමිති යක සාමාජිකයෙයෙකු වන්නානා වූ යම් සේවායෝජකයකුකුට හෝ සේවකයෙකුට ඒ වෘත්තිතිය සමිතියෙන් ස්වාධීන ව ඒ නිරවුල් කිරීම ප්‍රතික්ෂේප කිරීමේමේ අයිතියක් නැත්තේ ය. එවැනිනි සේවායෝජකයකුකු හෝ සේවකයකුකු විසින් එසේ ස්වාධී

නව කරන ලද ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීමක් මේ පනතේ කාර්ය සඳහා

වලංගු
දැන්වීමක්
නොවන්නේය.

(2)

නිරවුල් කිරීමක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් කොමසාරිස්වරයා වෙත ලැබුනු අවස්ථාවක දී, මෙයින් මින් මතු සළස්වා ඇති විධිවිධාන වලට යටත්ව_

නිරවුල් කිරීමක බලපෑම

නිරවුල් කිරීම අවසාන වීම

(අ)

ඒ දැන්වීම අදාළ වන නිරවුල් කිරීම, ඒ දැන්වීම කොමසාරිස්වරයා වෙත ලැබුණු මාසයට පසුව එළඹෙන මාසය

ඉකුත් වීමේ දී අවසන් වන අතර එහි බලපෑම නතර වන්නේ ය.

(ආ) ඡේදයේ සඳහන් පරිදි ඒ නිරවුල් කිරීමෙහි බලපෑම නතරවන කාලය පිළිබඳ ප්‍රකාශයක් ද සමඟ , එකී ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැළැස්විය යුතු ය.

එසේ වුව ද, යම් නිරවුල් කිරීමක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් කර ඇත්තේ ඒ නිරවුල් කිරීමේ පාර්ශවයකට ඇතුලත් සියළුම වෘත්තිය සමිති , සියළුම සේවායෝජකයන් හෝ සියළුම සේවකයන් විසින් නොව ඉන් එකක් නැතහොත් එක් අයකු හෝ කීපයක් නැතහොත් කීපදෙනෙකු හෝ පමණක් විසින් වන අවස්ථාවක එම නිරවුල් කිරීමේ බලපෑම ඒ දැන්වීම කළ එක් එක් වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා සම්බන්ධයෙන් සහ එවැනි වෘත්තීය සමිතියක සාමාජිකයන් සම්බන්ධයෙන් පමණක් නතර වන අතර, ඒ හැරෙන විට ඒ නිරවුල් කිරීමේ වලංගුභාවය හා බලපෑම නොවෙනස්ව පවතින්නේ ය.

(ඇ) බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම

15 අ. මේ පනතේ මින් මතු දක්වා ඇති විධිවිධාන වල එන "බේරුම්කරු" යන යෙදුමට කම්කරු විනිශ්චය අධිකාරයක් ද ඇතුළත් වේ.

"බේරුම්කරු" යන්නෙහි අර්ථ නිරූපණය

(1957 අංක 62, 9 වන වගන්තිය)

16. කාර්මික ආරාවුලක් බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ බේරුම්කාර මණ්ඩලයක් වෙත (යම් කාර්මික ආරාවුලක්, යම් බේරුම්කරුවකු වෙත යොමු කර ඇති අවස්ථාවක දී , ඒ බේරුම්කරු ගැන කරනු ලබන සඳහනක් ලෙස ද හෝ , එවැනි ආරාවුලක් යම් බේරුම්කාර මණ්ඩලයක් වෙත යොමු කර ඇති අවස්ථාවක දී ඒ බේරුම්කාර මණ්ඩලය ගැන කරනු ලබන සඳහනක් ලෙස හෝ "බේරුම්කරු" යන යෙදුම, මේ පනතේ මින් මතු තේරුම් ගත යුතු ය .) යොමු කරමින් 3(1) (ඇ) වන වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක් ම හෝ , ඒ ආරාවුල බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත යොමු කරමින් 4(1) වන වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක් ම හෝ සමඟ , ඒ පාර්ශව අතර ඇති ආරාවුලට විෂය වී ඇතැයි කොමසාරිස්වරයාගේ දැනීමේ හැටියට ඔහු විසින් සළකනු ලබන එක් එක් කරුණ සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් පිළියෙල කළ ප්‍රකාශයක් ද යැවිය යුතු ය.

ආරාවුලට විෂය වීඇති කරුණු නිශ්චය වශයෙන් දැක්වෙන ප්‍රකාශය.

(1957 අංක 62, 10 වන වගන්තිය)

(1963 අංක 4, 4 වන වගන්තිය)

යට කී නියමය කරන ලද දිනයට පෙර, ඒ ආරාවුලට සම්බන්ධ පාර්ශව අතර ඒ ආරාවුලට විෂය වී තිබුණ කරුණක් බවට ඒ ආරාවුල යොමු කරනු ලැබූ බේරුම්කරු සෑහීමට පත්වන පරිදි පෙන්නුම් කරන ලද්දා වූ යම් කරුණක් , කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයෙහි සඳහන් කරුණකට

සම්බන්ධ නම් නැතහොත් එවැනි කරුණකින් උද්ගත වන්නේ නම් ඒ කරුණ පිළිගැනීම, සළකා බැලීම සහ ඒ පිළිබඳ ව තීරණයක් දීම සම්බන්ධයෙන් බේරුම්කරු සතු බලතල හීන කිරීමක් මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන වල ඇතුළත් කිසිවකින් සිදු වේ යයි නොසැළකිය යුතු ය.

බේරුම්කරුගේ යුතුකම් සහ බලතල.

(1957 අංක 62, 11 වන වගන්තිය)

17. (1) යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා 3(1) (ඈ) වන වගන්තිය හෝ 4(1) වන වගන්තිය හෝ යටතේ බේරුම්කරුවකු වෙත යොමු කර ඇති අවස්ථාවක දී, ඒ ආරාවුල සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔහු විසින් සළකනු ලබන සියළු පරීක්ෂණ පැවැත්වීම ද, ආරාවුලට සම්බන්ධ පාර්ශව විසින් ඉදිරිපත් කරනු ලබන සියළු සාක්ෂි විභාග කිරීම ද, ඉන්පසු, සාධාරණ සහ යුක්ති සහගත යයි ඔහුට පෙනී යන තීරණයක් දීම ද ඔහු විසින් කළ යුතු ය . බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලද කාර්මික ආරවුලක් නිරවුල් කිරීම සඳහා වන නීති කෘත්‍ය වලට විනිශ්වය සභාව විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය.

(2) බේරුම්කරුවකුගේ සෑම ප්‍රදානයක් ම ඒ තීරණය අදාළ වන්නා වූ පාර්ශව සහ වෘත්තිය සමිති ද සේවායෝජකයන් සහ සේවකයින් ද කවුරුන් දැයි සඳහන් කරනු ලැබිය යුතු ය.

තීරණය ප්‍රසිද්ධ කිරීම, එය බලාත්මක වන දිනය හා එය බලපවත්නා කාලය

18. (1) බේරුම්කරුවකුගේ තීරණය , කොමසාරිස්වරයා වෙත යැවිය යුතු අතර එම ප්‍රදානය, කොමසාරිස්වරයා විසින් නොපමාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැළැස්විය යුතු ය.

(2) බේරුම්කරුවකුගේ සෑම තීරණයක් ම , ඒ ප්‍රදානය දුන් දිනයේ දී හෝ ඒ තීරණය හා සම්බන්ධ කාර්මික ආරාවුල මුලින් ම උද්ගත වූ දිනයට පූර්ව දිනයක් නොවන වෙනත් දිනයක් ඒ ප්‍රදානයෙහි නිශ්චිත ව සඳහන් වේ නම් ඒ දිනයේ දී හෝ බලාත්මක වන්නේ ය.

(3) බේරුම්කරුවකුගේ යම් ප්‍රදානයක් ඒ ප්‍රදානයේ නිශ්චිතව සඳහන් යම් කාල සීමාවකට හෝ යම් දිනයක් දක්වා හෝ බල සහිතව පැවතිය යුතු බවට ඒ ප්‍රදානයෙන් විධිවිධාන සළස්වා ඇති අවස්ථාවක, 20 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි එහි බලපෑම කලින් නතර වුවහොත් මිස, (2) වන උප වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි එම ප්‍රදානය බලාත්මක වන දිනයෙහි සිට, ඉහත කී නිශ්චිත කාලසීමාව අවසන් වන තෙක් හෝ එකී නිශ්චිත දිනය තෙක් හෝ ඒ ප්‍රදානය බලාත්මක ව පවතින්නේ ය.

(4) යම් ප්‍රදානයක් බලාත්මක ව පැවතිය යුතු කාලසීමාව වශයෙන් හෝ එය බලාත්මක ව පැවතිය යුත්තේ කවර දිනයක් තෙක් ද යන වශයෙන් කාලසීමාවක් හෝ දිනයක් හෝ යම් ප්‍රදානයක නිශ්චිත ව සඳහන් නොමැති අවස්ථාවක, 20 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි එහි බලපෑම කලින් නතර වුවහොත් මිස, (2) වන උපවගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි ඒ ප්‍රදානය බලසහිත වූ දින සිට ඉදිරියට බලාත්මකව පවතින්නේ ය.

(ආ) (අ) ඡේදයෙහි සදහන් පරිදි ඒ ප්‍රදානයේ බලපෑම නතර වන කාලය පිළිබඳ ප්‍රකාශයක් ද සමඟ එම දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවීමට කොමසාරිස්වරයා විසින් සැලැස්විය යුතු ය.

19. කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් බේරුම්කරුවකු විසින් දෙන ලද්දා වූ තත් කාලයෙහි වලංගුව ඇත්තා වූ ද , සෑම ප්‍රදානයක් ම , මෙම පනතේ කාර්යය සඳහා, 17(2) වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඒ ප්‍රදානයෙහි සඳහන් පාර්ශව, වෘත්තිය සමිති, සේවායෝජකයන් සහ සේවකයන් විෂයෙහි බැඳීමක් ඇති කරන ප්‍රදානයක් වන්නේ ය . තව ද ඒ තීරණයෙහි ඇතුළත් නියමයන් ඒ ප්‍රදානයෙන් බැඳී සිටින සේවා යෝජකයන් සහ සේවකයින් අතර ඇති සේවා ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයක් වන්නේ ය.

20. (1) මේ පනත යටතේ බේරුම්කරුවකු විසින් දෙන ලද ප්‍රදානයකින් බැඳී සිටින යම් පාර්ශවයක්, වෘත්තිය සමිතියක්, සේවා යෝජකයකු හෝ සේවකයකු විසින්, නියමිත ආකෘතිය අනුව එවූ ලිඛිත දැන්වීමක් කොමසාරිස්වරයා වෙත සහ ඒ ප්‍රදානයෙන් බැඳී සිටින අනෙක් සෑම පාර්ශවයක්, වෘත්තිය සමිතියක්, සේවායෝජකයකු සහ සේවකයකු වෙත යැවීමෙන් ඒ ප්‍රදානය ප්‍රතික්ෂේප කළ හැකි ය :-

එසේ වුව ද_

බේරුම්කරුවකුගේ තීරණයක බලපෑම.

(අ) ඒ ප්‍රදානයෙන් බැඳී සිටින පාර්ශවයක් වන නැතහොත් එවැනි පාර්ශවයකට ඇතුළත් වන වෘත්තිය සමිතියක සාමාජිකයකු වන්නා වූ යම් සේවායෝජකයෙකුට හෝ සේවකයකුට ඔහුගේ වෘත්තිය සමිතියෙන් ස්වාධීනව ඒ දැන්වීම යැවීම අවශ්‍ය නොවන්නේ ය; තව ද

(ආ) ඒ ප්‍රදානයෙන් බැඳී සිටින පාර්ශවයන් වන නැතහොත් එවැනි පාර්ශවයකට ඇතුළත් වන වෘත්තිය සමිතියක සාමාජිකයකු වන්නා වූ යම් සේවායෝජකයෙකුට හෝ සේවකයකුට ඒ වෘත්තිය සමිතියෙන් ස්වාධීනව ඒ ප්‍රදානය ප්‍රතික්ෂේප කිරීමේ අයිතියක් නොමැත්තේ ය . එවැනි සේවායෝජකයකු හෝ සේවකයකු හෝ විසින් එසේ ස්වාධීන ව කරන ලද ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීමක් මේ පනතේ කාර්යය සඳහා වලංගු දැන්වීමක් නොවන්නේ ය.

බේරුම්කරුවකුගේ තීරණයක් අවසන් වීම.

(2) ප්‍රදානයක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් කොමසාරිස්වරයා වෙත ලැබුණු අවස්ථාවක දී, මෙහි මින් මතු සලස්වා ඇති විධිවිධාන වලට යටත් ව_

(අ) එම දැන්වීම කොමසාරිස්වරයා වෙත ලැබුනු මාසයට පසුව එළඹෙන මාස තුන අවසාන වන දිනය ද 18(2) වන වගන්තියෙන් විධිවිධාන සළස්වා ඇති පරිදි ඒ ප්‍රදානය බලාත්මක වූ දින සිට දොළොස් මසක් අවසාන වන දිනය ද යන මේ දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී, ඒ දැන්වීමට අදාළ ප්‍රදානයේ බලපෑම නතර වන්නේ ය; තව ද

එසේ වුව ද, යම් ප්‍රදානයක් ප්‍රතික්ෂේප කිරීමේ වලංගු දැන්වීමක් කර ඇත්තේ ඒ ප්‍රදානයෙන් බැඳී සිටින පාර්ශවයකට ඇතුළත් වන සියලු ම වෘත්තිය සමිති, සියලුම සේවායෝජකයන් හෝ සියලුම සේවකයන් විසින් නොව ඉන් එකක් නැතහොත් එක අයකු හෝ කීපයක් නැතහොත් කීපදෙනෙකු හෝ පමණක් විසින් වන අවස්ථාවක එම ප්‍රදානයේ බලපෑම නතර වනුයේ ඒ දැන්වීම කළ එක් එක් වෘත්තිය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා සම්බන්ධයෙන් සහ එවැනි වෘත්තිය සමිතියක සාමාජිකයන් සම්බන්ධයෙන් පමණක් වන අතර ඒ හැරෙන විට ඒ ප්‍රදානයේ වලංගුභාවය හා බලපෑම නොවෙනස් ව පවතින්නේ ය.

21. බේරුම් කිරීමේ ආඥාපනතේ විධිවිධාන සහ බේරුම් කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ එන විධිවිධාන මේ පනත , යටතේ යම් බේරුම්කරුවකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍යය කෙරෙහි බල නොපාන්නේ ය.

## IV වන කොටස

### කාර්මික අධිකරණ

*22. (1) මේ පනතේ කාර්යය සඳහා, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට කාර්මික අධිකරණ සංස්ථාපනය කිරීම සඳහා ඩනාධිපතිවරයා විසින්, කලින් කල , පස් දෙනෙකුට නොඅඩු තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත මූල මණ්ඩලයක් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සෑම තැනැත්තකු ම විසින්, ඔහු කලින් තම ධූරයෙන් ඉවත් වුවහොත් මිස, ඔහු පත් කරනු ලබන අවස්ථාවේ දී ජනාධිපතිවරයා විස්න නිශ්චය කරනු ලබන , වර්ෂ තුනකට නොවැඩි කාලයක් තම ධූරය දැරිය යුතු ය.

එසේ වුව ද , එවැනි යම් තැනැත්තකුගේ පත්වීමේ කාලසීමාව අවසාන වන දිනයේ දී , මේ පනත යටතේ පරීක්ෂණයක් පවත්වාගෙන යන සම් කාර්මික අධිකරණයක සාමාජිකයෙකු ලෙස ඔහු ක්‍රියා කරමින් සිටී නම් , ඒ පරීක්ෂණය අවසාන කොට ඒ පිළිබඳව නිශ්චයක් කරන තෙක් හෝ තීරණයක් දෙන තෙක් ඒ තැනැත්තා විසින් තම ධූරය දැරිය යුතු ය.

තමාගේ ධූර කාලය අවසාන වීම හේතු කොට ගෙන තම ධූරය හිස් කරන (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තෙකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වේ.

(3) මේ පනත යටතේ වූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ යම් කාර්යයක් කිරීම සඳහා හෝ යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා හෝ කාර්මික අධිකරණයක් සංස්ථාපනය කිරීම සඳහා, අමාත්‍යවරයා විසින්, තම අභිමතය අනුව නිශ්චය කරනු ලබන පරිදි, එක් තැනැත්තකු හෝ තැනැත්තන් තිදෙනෙකු, ඒ මූල මණ්ඩලයෙන් තෝරා ගත යුතු ය.

* 21 අ සිට 21 ඇ දක්වා වූ වගන්ති 1968 අංක 39 දරණ පනත මගින් ඉවත් කරන ලදි.

අධිකරණයේ සාමාජිකයකු සභාපති වශයෙන් ක්‍රියා කළයුතු ය.

(5) මේ පනත යටතේ කාර්මික අධිකරණය වෙත කාර්මික ආරාවුල්, ඉල්ලීම් සහ ප්‍රශ්ණ යොමු කළ යුත්තේ කවර ආකෘතියකින් සහ කවර ආකාරයකට ද යන්න සහ, මේ පනත යටතේ එම අධිකරණ වලට අභියාචන ඉදිරිපත් කළ යුත්තේ කවර ආකෘතියකින් හා කවර ආකාරයට ද යන්න නියම කැරෙන නියෝග සෑදිය හැකි ය.

වෙනත් ලිඛිත නීතියක එන බේරුම්කිරීමට අදාල විධිවිධාන බේරුම්කරුවකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍ය කෙරෙහි බල නොපාන බව.

සංස්ථාපනය.

(1957 අංක 62
12 වන වගන්තිය)

(1957 අංක 62
22 වන වගන්තිය)

23. කාර්මික ආරාවුලක්, නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත යොමු කරමින් අමාත්‍යවරයා විසින් , 4 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් සමඟ , තමාගේ දැනීමේ හැටියට පාර්ශව අතර ආරාවුලට විෂය වී ඇති එක් එක් කරුණ සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයක් ද යැවිය යුතු ය.

යට කී නියෝගය කරන ලද දිනට පෙර ඒ පාර්ශව අතර ආරාවුලට විෂය වී තිබුණු කරුණක් බවට ඒ ආරාවුල යොමු කරනු ලැබූ කාර්මික අධිකරණය සෑහීමට පත් වන පරිදි, පෙන්නා දෙන ලද වෙනත් යම් කරුණක් ඒ අධිකරණය විසින් පිළිගැනීම , සළකා බැලීම සහ ඒ පිළිබඳ ව තීරණයක් දීම සම්බන්ධයෙන් ඒ කාර්මික අධිකරණය සතු බලතල හීන කිරීමක්, මේ

(4) කාර්මික අධිකරණයක් තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ ඒ

වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන වලට ඇතුළත් කිසිවකින් සිදු වේ යයි නොසැළකිය යුතු ය.

කාර්මික අධිකරණ වන යුතුකම් සහ බලතල.

24. (1) මේ පනත යටතේ යම් ආරාවුලක්, ඉල්ලීමක්, ප්‍රශ්ණයක් හෝ වෙනත් කරුණක් කාර්මික අධිකරණයක් වෙත යොමු කරන ලද හෝ ඉදිරිපත් කරන ලද හෝ අවස්ථාවක දී , හැකිතාක් ඉක්මණින් අවශ්‍ය යයි ඒ අධිකරණය විසින් සලකනු ලබන සියලු පරීක්ෂණ පැවැත්වීම ද සියලු සාක්ෂි විභාග කිරීම ද ඉන්පසු සාධාරණ සහ යුක්ති සහගත යයි ඒ අධිකරණයට පෙනී යන තීන්දුවක් හෝ ප්‍රදානයක් දීම ද ඒ අධිකරණයේ යුතුකම වන්නේ ය.

(2) මේ කොටස යටතේ පරීක්ෂණයක් පවත්වන කාර්මික අධිකරණයක් විසින් එම පරීක්ෂණය පැවැත්වීමේ දී අනුගමනය කළයුතු කාර්යය පටිපාටිය, මේ පනතේ 39(1) (ඊ) වන වගන්තිය යටතේ කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් සාදනු ලබන නියෝග වලට යටත් ඒ අධිකරණය විසින් නියම කර ගනු ලැබිය හැකි ය.

(3) කාර්මික අධිකරණයක් විසින් කරනු ලබන ප්‍රදානයක් අදාල වන පාර්ශවයන් වෘත්තිය සමිති ද සේවායෝජකයන් සහ සේවකයන් ද කවුරුන් දැයි එවැනි සෑම තීරණයක ම සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) කාර්මික අධිකරණයක් එක් තැනැත්තෙකුට වඩා වැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන අවස්ථාවක , යම් කරුණක් සම්බන්ධයෙන් ඒ අධිකරණයේ සාමාජිකයන්ගේ බහුතර මතය පිළිගත යුතු මතය වන අතර, එය ඒ කරුණ සම්බන්ධයෙන් ඒ අධිකරණයේ තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(1957 අංක 62
12 වන වගන්තිය)

25. (1) කාර්මික අධිකරණයක ප්‍රදානය, කොමසාරිස්වරයා වෙත යැවිය යුතු අතර, එම ප්‍රදානය කොමසාරිස්වරයා විසින් නොපමාව ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැළැස්විය යුතු ය.

(1957 අංක 62
12 වන වගන්තිය)

ආරාවුලට විෂය වී ඇති කරුණු නිශ්චිතව දැක්වෙන ප්‍ර කාශයක් කාර්මික අධිකරණය වෙත භාර දිය යුතු බව.

(2) කාර්මික අධිකරණයක සෑම ප්‍රදානයක් ම, ඒ තීරණය දුන් දිනයේ දී හෝ ඒ ප්‍රදානය හා සම්බන්ධ කාර්මික ආරාවුල මුලින් ම උද්ගත වූ දිනයට පූර්ව දිනයක් නොවන වෙනත්

දිනයක් ඒ ප්‍රදානයෙහි නිශ්චිත ව සඳහන් වේ නම් ඒ දිනයේ දී හෝ බලාත්මක වන්නේ ය.

(3) කාර්මික අධිකරණයක යම් ප්‍රදානයක් ඒ ප්‍රදානයේ නිශ්චිතව සඳහන් යම් කාලසීමාවකට හෝ යම් දිනයක් දක්වා හෝ බල සහිත ව පැවතිය යුතු බවට ඒ ප්‍රදානයෙන් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, 30 වන වගන්තියේ විධිවිධාන සළස්වා ඇති පරිදි එහි බලපෑම කලින් නතර වුවහොත් මිස, (2) වන උපවගන්තියේ විධිවිධාන සළසා ඇති එම ප්‍රදානය බලාත්මක වන දිනයෙහි සිට, ඉහත කී නිශ්චිත කාලසීමාව අවසන් වන තෙක් හෝ එකී නිශ්චිත දිනය තෙක් හෝ ඒ ප්‍රදානය බලාත්මක ව පවතින්නේය.

(4) යම් ප්‍රදානයක් බලාත්මකව පැවතිය යුතු කාලසීමාව වශයෙන් හෝ එය බලාත්මකව පැවතිය යුත්තේ කවර දිනයක් තෙක් ද යන වශයෙන් කාලසීමාවක් හෝ දිනයක් හෝ යම් ප්‍රදානයක නිශ්චිතව සඳහන් නොමැති අවස්ථාවක, 30 වන වගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි එහි බලපෑම කලින් නතර වුවහොත් මිස, (2) වන උපවගන්තියේ විධිවිධාන සළසා ඇති පරිදි ඒ ප්‍රදානය බල සහිත වූ දින සිට ඉදිරියට බලාත්මක ව පවතින්නේ ය.

කාර්මික අධිකරණ තීරණයක බලපෑම.

26. කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් කාර්මික අධිකරණයක් විසින් කරන ලද්දා වූත් තත් කාලයෙහි වලංගුව ඇත්තා වූත් සෑම ප්‍රදානයක් ම මෙම පනතේ කාර්යය සඳහා, 24(3) වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව ඒ තීරණයෙහි සඳහන් පාර්ශව වන වෘත්තිය සමිති, සේවායෝජකයන් සහ සේවකයන් විෂයයෙහි බැඳීමක් ඇති කරන ප්‍රදානයක් වන අතර, ඒ තීරණයෙහි ඇතුළත් නියමයන් ඒ තීරණයෙන් බැඳී සිටින සේවායෝජකයන් සහ සේවකයන් අතර ඇති සේවා නියුක්ති ගිවිසුමේ ව්‍යංජිත නියමයන් වන්නේ ය.

කාර්මික අධිකරණ මගින් දෙන ලද යළි සළකා බැලීම සඳහා වූ ඉල්ලීම.

27. කාර්මික අධිකරණයක ප්‍රදානයන් ඉවත දැමිය යුතු යයි හෝ අලුත් තීරණයක් ඒ වෙනුවට ප්‍රතියෝජනය කළ යුතු යයි හෝ ඒ ප්‍රදානයේ ඇතුළත් කොන්දේසි හා නියමයන් මඳ වශයෙන් වෙනස් කළ යුතු යයි හෝ අලුත් කොන්දේසි හෝ නියමයන් කිසිවක් ඒ ප්‍රදානයෙහි ඇතුළත් කළ යුතු යයි, එම ප්‍රදානයෙන් බැඳී සිටින යම් පාර්ශවයක්, වෘත්තිය සමිතියක්, සේවායෝජකයෙකු හෝ සේවකයකු අපේක්ෂා කරන්නේ නම්, ඔහු විසින් ඒ සඳහා ඉල්ලීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකිය. ඉක්බිති අමාත්‍යවරයා විසින් එම ඉල්ලීම, සළකා බැලීම සඳහා, කාර්මික අධිකරණයක් වෙත යොමු කළ යුතු ය.

තීරණය ප්‍රසිද්ධ කිරීම,
එය බලාත්මක වන
දිනය හා එය
බලපවත්නා කාලය.

එසේ වුව ද,_

(අ) යම් ප්‍රදානයක් සම්බන්ධයෙන් යම් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත්තේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් විධිවිධාන සළස්වා ඇති පරිදි ඒ ප්‍රදානය බලාත්මක වූ දින සිට දොළොස් මාසයක කාලසීමාවක් ඇතුළත දී නම් , ආර්ථික සහ කම්කරු තත්ත්වයන්ගේ වෙනස්වීම් නිසා ඒ ප්‍රදානයේ අඩංගු කරුණු ඒ කාලසීමාව අවසන් වීමට ප්‍රථම යළි සලකා බැලීම උචිත බවට කොමසාරිස්වරයා විසින් තම අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් මගින් ඒ ඉල්ලීම සනාථ කර තිබුණහොත් මිස , අමාත්‍යවරයා විසින් ඒ ඉල්ලීම ගැන ක්‍රියා නොකළ යුතු ය;

(ආ) වෘත්තිය සමිතියක් තීරණයකින් බැඳී සිටින පාර්ශවයක් වන්නා වූ හෝ එවැනි පාර්ශවයකට ඇතුළත් වන්නා වූ හෝ අවස්ථාවක දී, ඒ වෘත්තිය සමිතියේ සාමාජිකයෙකු වන යම් සේවායෝජකයකු හෝ සේවකයෙකු හෝ විසින් ඒ වෘත්තිය සමිතියෙන් ස්වාධීන ව ඒ ප්‍රදානය සම්බන්ධයෙන් කරන ඉල්ලීමක් ගැන අමාත්‍යවරයා විසින් ක්‍රියා නොකළ යුතු ය.

28. (1) යම් ප්‍රදානයක් සම්බන්ධයෙන් 27 වන වගන්තිය යටතේ වූ ඉල්ලීමක් යම් කාර්මික අධිකරණයක් වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක දී ඒ අධිකරණයේ තීන්දුව මගින්_ 27 වන වගන්තිය යටතේ වූ ඉල්ලීම් සම්බන්ධයෙන් වූ කාර්මික අධිකරණය සතු කාර්යය සහ බලතල

(අ ) ඒ ප්‍රදානය ස්ථිර කරනු ලැබිය හැකි ය.;
(ආ) ඒ ප්‍රදානය ඉවතලිය හැකිය;
(ඇ) ඒ ප්‍රදානය ඉවත ලා ඒ වෙනුවට අලුත් ප්‍රදානයක් දිය හැකිය; නැතහොත්
(ඈ) අවශ්‍ය යයි පෙනෙන ආකාරයට ඒ ප්‍රදානය වෙනස් කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම අලුත් තීරණයකම සහ යම් තීරණයක් වෙනස් කරමින් හෝ මඳ වශයෙන් වෙනස් කරමින් හෝ දෙන ලද සෑම තීන්දුවක ම ඒ අලුත් ප්‍රදානය හෝ තීන්දුව හෝ අදාළ වන පාර්ශව සහ වෘත්තිය සමිති ද කවරේදැයි සහ සේවායෝජකයන් සහ සේවකයන් කවුරුන්දැයි සඳහන් කරනු ලැබිය යුතු ය.

29. 28 වන වගන්තිය යටතේ දෙන ලද සෑම තීන්දුවක් ම කොමසාරිස්වරයා වෙත යැවිය යුතු අතර, කොමසාරිස්වරයා විසින් එය නොපමාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරවිය යුතු ය. 28 වන වගන්තිය යටතේ වූ තීන්දු ප්‍රසිද්ධ කිරීම.

30. (1) කාර්මික අධිකරණයක් විසින් 28(1) (ආ) වගන්තිය යටතේ දෙන ලද තීන්දුවක් මගින් ඉවතලන ලද සෑම ප්‍රදානයක ම බලපෑම ඒ තීන්දුව දෙන ලද දිනයේ දී හෝ ඒ තීන්දුවෙහි නිශ්චිත ව සඳහන් පසු දිනයක දී හෝ නතර වන්නේ ය. 28 වන වගන්තිය යටතේ වූ තීන්දු වල බලපෑම.

(2) 27 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අනුව කාර්මික අධිකරණයක තීන්දුවක් මගින් වෙනස් කරන ලද හෝ මඳ වශයෙන් වෙනස් කරන ලද හෝ සෑම ප්‍රදානයක් ම ඒ තීන්දුව දෙන ලද දිනයෙහි සිට හා ඉන්පසු හෝ , ඒ ඉල්ලීමේ දිනයට පෙරාතුව වූ දිනයක් නොවන්නා වූ යම් දිනයක් ඒ තීන්දුවෙහි නිශ්චිත ව සඳහන් කර තිබේ නම් එදින සිට හා ඉන් පසු, එසේ වෙනස් කළ හෝ මඳ වශයෙන් වෙනස් කළ හෝ ආකාරයට බලපාන අතර එසේ බලාත්මක ව පවතින්නේ ය.

(3) මෙහි ඉහත සඳහන් විධිවිධාන ප්‍රකාර යම් ප්‍රදානයක් වෙනස් කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම, එසේ වෙනස් කරන ලද හෝ මඳ වශයෙන් වෙනස් කරන ලද හෝ ආකාරයට එම ප්‍රදානය 25 වන වගන්තියේ (3) වන උපවගන්තියට සහ (4) වන උපවගන්තියට අනුකූල ව ක්‍රියාත්මක ව පැවතීම කෙරෙහි නැතහොත් ඒ සම්බන්ධයෙන් තව දුරටත් ඉල්ලීමක් 27 වන වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම කෙරෙහි බලනොපාන්නේ ය;

එසේ වුව ද, තීන්දුවක් මගින් එවැනි යම් වෙනසක් හෝ මඳ වශයෙන් වෙනස් කිරීමක් හෝ සිදු කරන ලද යම් කරුණක් සම්බන්ධයෙන් 27 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක්, ඒ තීන්දුවේ සඳහන් කරුණු ඒ තීන්දුවේ දින සිට දොළොස් මාසයක කාලසීමාවක් ඉකුත් වීමට පෙර ආර්ථික හා කම්කරු තත්ත්වයන් වෙනස්වීම හේතු කොට ගෙන යළි සළකා බැලීම උචිත බවට කොමසාරිස්වරයා විසින් තම අත්සන යටතේ දෙන ලද සහතිකයක් මගින් සනාථ කොට තිබුණහොත් මිස , එකී දොළොස් මාසයක කාලසීමාව ඇතුළත දී ඉදිරිපත් නොකළ යුතු ය.

(4) 27 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් අනුව 28(1) (ඇ) වන වගන්තිය යටතේ කරන ලද අලුත් ප්‍රදානයක් ඒ ප්‍රදානය කරන ලද දිනයේ දී හෝ ඒ ඉල්ලීම කරන ලද දිනයට පෙරාතුව වූ දිනයක් නොවන යම් දිනයක් ඒ තීන්දුවේ නිශ්චිත ව සඳහන් වේ නම් එම දිනයෙහි දී බලාත්මක බවට පත් වන අතර, 25 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති වල විධිවිධාන සහ 26 සිට 29 දක්වා වූ වගන්ති වල විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා , එම ප්‍රදානය 24 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රදානයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

තම කාර්යය ඉටු කිරීමට අපොහොසත් වන තැනැත්තා අධිකරණයේ සභාපතිවරයා නම් අමාත්‍යවරයා විසින් මූල මණ්ඩලයෙන් වෙනත් යම් තැනැත්තකු තෝරා, යට කී පරිදි තම කාර්යය ඉටු කිරීමට අපොහොසත්

31. (1) කාර්මික අධිකරණයක් තැනැත්තන් එක්කෙනෙකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන අවස්ථාවක දී ඒ අධිකරණයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද ඒ නොතකා ඒ අධිකරණය විසින් කටයුතු කරගෙන යා හැකි ය.

(2) කාර්මික අධිකරණයන් තැනැත්තන් එක්කෙනෙකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ ද , රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔවුනතුරෙන් යම් තැනැත්තෙකුට ඔහුගේ කාර්යය ඉටු කිරීමට නොහැකි වන්නා වූ ද අවස්ථාවක , එසේ

පුරප්පාඩු

(1957 අංක 62,
13 වන වගන්තිය)

වන තැනැත්තා වෙනුවට ඒ අධිකරණයේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු අතර, එසේ කාර්යය ඉටු කිරීමට අපොහොසත් වන තැනැත්තා ඒ අධිකරණයේ සභාපතිවරයා නොවේ නම් , මූල මණ්ඩලයෙන් වෙනත් යම් තැනැත්තකු තෝරා යට කී පරිදි තම කාර්යය ඉටු කිරීමට නොහැකි තැනැත්තා වෙනුවට ඒ අධිකරණයේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා විසින් පත් කළ හැකි ය.

(3) කාර්මික අධිකරණයක් එක් තැනැත්තෙකුගෙන් සමන්විත වන අවස්ථාවක දී රෝගාතුර වීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ තම කාර්යය ඉටු කිරීමට ඔහුට නොහැකි වන්නා වූ අවස්ථාවක, ඔහුගේ තැන ගැනීමට මූල මණ්ඩලයෙන් වෙන යම් තැනැත්තෙකු තෝරා පත් කිරීමෙන් අමාත්‍යවරයා විසින් ඒ අධිකරණය යළි සංස්ථාපනය කළ යුතු ය.

(4) යම් කාර්මික අධිකරණයක් විසින් යම් කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීමෙන් පසු ඒ කාර්මික අධිකරණයේ යම් පුරප්පාඩුවක් ඇති වීමෙන් (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ ඒ පුරප්පාඩුව පුරවනු ලැබූ අවස්ථාවක ඒ පුරප්පාඩුව පුරවන ලද අවස්ථාවේ දී ඒ පරීක්ෂණය පැවති අදියරේ සිට එම පරීක්ෂණය කරගෙන යා හැකිය.

(5) කාර්මික අධිකරණයක් විසින් කරන ලද ක්‍රියාවක්, නීති කෘත්‍යයක් හෝ විනිශ්චයක්, ඒ අධිකරණයේ යම් පුරප්පාඩුවක් තිබීම හේතු කොට ගෙන ප්‍රශ්ණ කරනු ලැබීමට හෝ අවලංගු කරනු ලැබීමට හෝ යටත් නොවන්නේ ය.

## IV වන කොටස
## කම්කරු විනිශ්චය සභා

31 අ. (1) මේ පනතේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කම්කරු විනිශ්චය සභා සංඛ්‍යාවක් අමාත්‍යවරයා විසින් පිහිටුවිය යුතු ය. ඒ එක් එක් කම්කරු විනිශ්චය සභාවක් එක් තැනැත්තකුගෙන් සමන්විත වන්නේ ය.

(අ) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කම්කරු

විනිශ් චය අධිකා කාර වෙනු වෙන් එක් ලේක ම්වර යෙකු ද, එසේ පිහිටු වනු ලැබූ සෑම එක් එක් කම් කරු විනිශ් චය අධිකා කාරය සඳහා සහකා කාර ලේක ම්වර යෙකු බැගින් න් ද පත් කරනු ලැබි ය යුතු ය.

(2) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන කාර්මික ආරාවුල් පනතේ 31 අ වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට, මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය අදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

(2) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින්, කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව,-

(අ ) 31 ආ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි ආකාරය; සහ

(ආ) මේ කොටස යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරයේ පැවැත්වෙන යම් නඩු කටයුත්තක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

නියම කරන නියෝග සාදනු ලැබිය හැකි ය.

(1957 අංක 62, 13 වන වගන්තිය)

(1957 අංක 62, 13 වන වගන්තිය)

(1957 අංක 62, 13 වන වගන්තිය)

31 ආ. (1) පහත දැක්වෙන කරුණු කවරක් සම්බන්ධයෙන් වුව ද සහනයක් හෝ ප්‍රතිකර්මයක් උදෙසා වූ ලිඛිත ඉල්ලීමක්, සේවකයකු විසින් හෝ යම් වෘත්තිය සමිතියක සාමාජිකයකු වන සේවකයෙකු වෙනුවෙන් ඒ වෘත්තිය සමිතිය විසින් හෝ , කම්කරු විනිශ්චය සභාවක් වෙත ඉදිරිපත් කළ හැකි ය :-

(1 අ) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාර වෙනුවෙන් එක් ලේකම්වරයකු ද , එසේ පිහිටුවනු ලැබූ සැම එක් එක් කම්කරු විනිශ්චය අධිකාරය සඳහා සහකාර ලේකම්වරයකු බැගින් ද පත්කරනු ලැබිය යුතු ය.

(1957 අංක 62, 14 වන වගන්තිය)

කම්කරු විනිශ්චය අධිකාර පිහිටුවීම සහ ඒවායේ සංයුතිය.

(1957 අංක 62, 14 වන වගන්තිය)

(අ ) ඔහුගේ සේවා යෝජකයා විසින් ඔහුගේ සේවය අවසන් කිරීම.

(ආ)

සේවාවන් අවසන් කිරීම සම්බන්ධයෙන් විනිශ්වයාධිකාරය වෙත ඉල්ලීම කරනු ලබන්නේ යම් කම්කරුවකු විසින් ද , නැතහොත් යම් කම්කරුවකු වෙනුවෙන් ද, ඒ කම්කරුවාගේ සේවාවන් අවසන් කිරීමට ඉහතින් වූ මාස දොළහක කාලය තුළ යම් දිනයක කම්කරුවන් පහළොස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලබන්නා වූ යම් කර්මාන්තයක ඒ කම්කරුවා සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක, ඒ කම්කරුවාගේ සේවාවන් අවසන් කරනු ලැබීමේ දී ඔහුගේ සේවායෝජකගෙන් යම් පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභ ඔහුට ලැබිය යුතු ද යන ප්‍රශ්නය සහ ඒ පාරිතෝෂිකයේ මුදල් ප්‍රමාණය හා ඒ ප්‍රතිලාභ වල ස්වාභාවය හා ප්‍රමාණය; (1983 අංක 12, 17 වන වගන්තිය)

(ඇ) 1983 පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාර පාරිතෝෂිකයක් අහිමි කිරීම, ඒ පනත ප්‍රකාර නිවැරදිව කරනු ලැබ තිබේ ද යන ප්‍රශ්නය; සහ

(ඈ) කම්කරුවකුගේ සේවා නියුක්තියට අදාළ නියමයන් හෝ කම්කරු තත්ත්වයන් හෝ සම්බන්ධව , නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු, (1962 අංක 4, 5 වන වගන්තිය)

(අ) (2) කම්කරු විනිශ්වය සභාවක් විසින් අවශ්‍ය යයි සළකනු ලබන පරීක්ෂණ පැවැත්වීමෙන් පසු මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට අදාළ කරුණු ඒ ඉල්ලීමට සම්බන්ධව සේවකයාගේ සේවායෝජකයා ද ඒ සේවකයා සාමාජිකයකු වන වෘත්තිය සමිතියක් ද අතර සාකච්ඡාවට භාජනය වී ඇති බවට ඒ විනිශ්වය සභාව සෑහීමට පත් වන අවස්ථාවක දී, එම සාකච්ඡාව අවසාන වන තෙක් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ඒ විනිශ්වය අධිකාරගේ නීතිකෘත්‍ය අත්හිටුවන ලෙස ආඥාවක් කළයුතු අතර , ඒ සාකච්ඡාව අවසාන වීමෙන් පසු ඒ ඉල්ලීම පිළිබඳ නීතිකෘත්‍ය යළි ආරම්භ කළ යුතු ය. තව ද එකී සාකච්ඡාවේ දී යම් නිරවුල් කිරීමකට එළඹෙන ලද නම් ඒ නිරවුල් කිරීමේ දී පිළිගන්නා ලද නියමයක් අනුව ආඥාවක් කළ යුතු ය. (1962 අංක 4, 7 වන වගන්තිය)

(ආ) එක් කරුණක්, බේරුම්කරුවකු මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත හෝ අමාත්‍යවරයා විසින් 4 වන වගන්තිය යටතේ යොමු කරන ලද කාර්මික ආරාවුලක් සමන්විත වන කරුණක් බවට හෝ එම කරුණ එවැනි ආරාවුලක කොටසක් වන බවට හෝ එම විනිශ්වය සභාව සෑහීමකට පත් වන අවස්ථාවක දී ඒ කාර්මික ආරාවුලේ පාර්ශව සතු අයිතිවාසිකම් වලට හානියක් නොවන පරිදි , ඒ ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ආඥාවක් ඒ විනිශවය අධිකාරය විසින් කළ යුතුය.

(2)

අධිකරණ
විෂයය භාර

අමාත්‍යවරයා විසින්, කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව,-

(අ) 31 ආ වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉල්ලීම් ඉදිරිපත් කළහැකි ආකාරය, සහ

(ආ) මේ කොටස යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරියේ පැවැත්වෙන යම් නඩු කටයුතුතක දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය නියම කරන නියෝග සෑදිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් :-

(අ) විනිශ්චය අධිකාරයේ මතය අනුව , ඒ ඉල්ලීමට අදාළ සේවායෝජකයා පාර්ශවයක් වන්නා වූ ද පනත යටතේ පරීක්ෂණයකට භාජනය වී ඇත්තාවූ ද යම් කාර්මික ආරාවුලක් සමන්විත වන නැතහොත් එවැනි ආරාවුලක කොටසක් වන කරුණකට සමාන හෝ එවැනි කරුණක් හා සර්වසම වන කරුණකට අදාළ වන අවස්ථාවක හෝ

(ආ) ඒ ඉල්ලීම අදාළ වන කරුණට සම්බන්ධ සිද්ධි වෙනත් යම් නීතියක් යටතේ පවත්වා ගෙන යනු ලබන නීති කෘත්‍ය කිසිවකට අදාළ සිද්ධි බව කම්කරු විනිශ්චය අධිකාරයේ මතය වන අවස්ථාවක, ඒ පරීක්ෂණය හෝ වෙනත් යම් නීතියක් යටතේ පවත්වාගෙන යනුලබන එකී නීති කෘත්‍ය හෝ අවසන් වන තෙක් , ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ඒ විනිශ්චය අධිකාරය විසින් කටයුතු කිරීම අත්හිටුවන ආඥාවක් ඒ විනිශ්චය අධිකාරය විසින් කළ යුතු අතර, එකී පරීක්ෂණ හෝ නීත කෘත්‍ය හෝ අවසන් වීමෙන් පසු ඒ ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කරීම ඒ විනිශ්චය අධිකාරය විසින් යළි ආරම්භ කළ යුතු ය . තව ද ඉන්පසු ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ආඥාවක් කරන විට , යට කී පරීක්ෂණයේ දී නැතහොත් යට කී පරිදි වෙනත් නීතියක් යටතේ පවත්වන ලද නීති කෘත්‍යයේ දී දෙන ලද ප්‍රදානය නැතහොත් තීන්දුවක් කෙරෙහි විනිශ්චය අධිකාරය සැළකිලිමත් විය යුතු ය.

(4) සේවකයෙකු සහ සේවායෝජකයා අතර ඇති කර ගෙන තිබෙන යම් සේවා ගිවිසුමක පටහැනිව කුමක් සඳහන් වුව ද , (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවකයෙකුට කවර වුව ද සහනයක් හෝ ප්‍රතිකර්මයක්, කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් සැළස්විය හැකිය.

(5) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් පිළිගනු ලැබ ඒ පිළිබඳ නඩු කටයුතු කර අවසාන කර ඇති කල් හි ඒ ඉල්ලීමට අදාළ කරුණ සම්බන්ධයෙන් වෙනත් කිසිඳු නෛතික සහනයක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකමක් ඒ ඉල්ලීමට අදාළ සේවකයාට නැත්තේ ය . තව ද ඒ සේවකයා වෙනත් යම් නෛතික සහනයක් අරභයා කළින් කටයුතු කර තිබෙන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ සහනයක් ලබා ගැනීමේ අයිතිවාසිකම ඉන්පසු ඔහුට නැතිව යන්නේ ය.

(6) යම් තැනැත්තෙකුගේ සේවායෝජකත්වය අවසන් වුව ද ඒ නොතකා-

(අ ) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් අදාළ වන සේවකයෙකු ඒ තැනැත්තා විසින් සේවයෙහි යොදවා සිටි

කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තාගෙන් සහනයක් හෝ ප්‍රතිකර්මයක් ලබාගැනීම පිණිස (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි අතර, එවැනි ඉල්ලීමක්

සම්බන්ධයෙන් නීති කෘත්‍ය පැවැත්වීම කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කළ හැකි ය.

(ආ) ඒ තැනැත්තා එවැනි සේවායෝජකයෙකු ව සිටිය දී එවැනි යම් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද නම් , එම ඉල්ලීම පිළිබඳව නීති කෘත්‍ය ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාමත් එම නීති කෘත්‍ය අවසාන කිරීමත් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කළ හැකි ය; තව ද

(ඇ) යම් තැනැත්තෙකු විසින් යම් කම්කරුවෙකු සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් කාලයක් තුළ ද ඒ කාලය සම්බන්ධයෙන් වැටුප් වශයෙන් හෝ ඒ කම්කරුවා ඒ සේවයෙහි පුනපත් කිරීමට විකල්පයක් ලෙස වන්දි වශයෙන් හෝ යම් මුදලක් ඒ කම්කරුවාට ගෙවන ලෙස එවැනි යම් ඉල්ලීමක් මත කම්කරු විනිශ්චයාධිකාරයක් විසින් ඒ තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි අතර, ඔහු ඒ සේවා යෝජක වුවාක් මෙන් සලකා ඒ සමාන ආකාරයකින්ම ඒ තැනැත්තාට විරුද්ධව ඒ ආඥාව බලාත්මක කරනු ලැබිය හැකිය:

එසේ වුව ද යම් කර්මාන්තයක කම්කරුවන් පහළොස් දෙනෙකුට අඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් වන විට , මේ ඡේදයේ ඉහතින් දැක්වූ විධිවිධාන වලින් පිරිනමන ලද සහන වලට අතිරේකව, ඒ තැනැත්තා විසින් ඒ කම්කරුවාට පාරිතෝෂිකයක් ගෙවීමට කම්කරු විනිශ්චයාධිකාරයක් විසින් ආඥාවක් කරනු ලැබිය හැකිය.

(7) මෙම වගන්තියේ 1 වන උපවගන්තියේ (අ) පරිච්ඡේදය හෝ (ආ) පරිච්ඡේදය අනුව, කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම ඕනෑම කම්කරුවෙකු විසින් ඔහුගේ සේවය අවසන් වූ දින සිට මාස 3 ක කාල පරිච්ඡේදයක් ඇතුලත දී ඉදිරිපත් කළ යුතු ය.

31 ඇ. (1) කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත 31 ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඒ ඉල්ලීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඒ විනිශ්චය අධිකාරය විසින් සලකනු ලබන සියලු පරීක්ෂණ පැවැත්වීමත්, සියලු සාක්ෂි විභාග කිරීමත්, ඉන් පසු ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ දින සිට හය මාසයක් ඉකුත්වීමට පෙර සාධාරණ හා යුක්ති සහගත යැයි ඒ විනිශ්චය අධිකාරයට පෙනී යන ආඥාවක් කිරීමත්, ඒ විනිශ්චය අධිකාරයේ කාර්යය වන්නේ ය.

(2) පරීක්ෂණයක් පවත්වන කම්කරු විනිශ්වය අධිකාරයක් විසින්, ඒ විනිශ්වය අධිකාරය ඉදිරියේ නඩු කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් 31 අ වගන්තිය යටතේ නියම කර ඇති කාර්ය පටිපාටය අනුගමනය කළ යුතු ය.

31 ආ වන වගන්තිය යටතේ වූ ඉල්ලීම් සම්බන්ධයෙන් කම්කරු විනිශ්වය අධිකාරයන් සතු යුතුකම් හා බලතල.

(1983 අංක 12, 17 වන වගන්තිය)

31 ඇ. (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර හැර කම්කරු විනිශ්වය අධිකාරයක ආඥාවක් අවසානාත්මක වන අතර එය කිසිදු අධිකරණයක දී ප්‍රශ්ණ කරනු නොලැබිය යුතු ය.

(2) කම්කරු විනිශ්වය අධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් විෂයෙහි ඒ විනිශ්වය අධිකාරය විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ ඉල්ලීම ඉදිරිපත් කළ සේවකයා හෝ වෘත්තිය සමිතිය හෝ ඒ ඉල්ලීමට අදාළ සේවායෝජකයා හෝ අතෘප්තියට පත් අවස්ථාවක දී ඒ සේවකයා හෝ වෘත්තිය සමිතිය හෝ සේවායෝජකයා විසින්, අනෙක් පාර්ශවය වගඋත්තරකරු ලෙස සඳහන් කරනු ලබන ලිඛිත පෙත්සමක් මගින් , නීති ප්‍රශ්ණයක් මත ඒ ආඥාවට විරුද්ධව, එම කම්කරු විනිශ්වය අධිකාරය පිහිටා ඇති පළාත සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග වගන්තිය යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(1957 අංක 62, 14 වන වගන්තිය)

(1962 අංක 4, 6 වන වගන්තිය)

කම්කරු විනිශ්වය අධිකාරයක් විසින් කරන ලද ආඥාවකින් මතු වන නීති ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් අභියාචනාධිකරණයට අභියාචනා කිරීම.

(3)(අ ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටු වන ලද

මහාධිකරණයකට, කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට විරුද්ධව අභියාචනයක් කරන හෝ එවැනි යම් ආඥාවක ට විරුද්ධව ප්‍රතිශෝධන ඉල්ලීමක් කරන; හෝ

(ආ) කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ සභාපතිවරයාට විරුද්ධ ව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වභාවයේ වූ රිට් ආඥාවක් නිකුත් කිරීම සඳහා ඉල්ලීමක් කරන

සෑම සේවායෝජකයකුම ඒ කම්කරු විනිශ්චය අධිකාරය වෙත_

(i) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් විධානය කරනු ලබන්නේ සේවකයාට මුදලක් ගෙවීම පමණක් වන යම් කාරණයක දී ඒ මුදල හා සමාන මුදල් ප්‍රමාණයක;

(ii) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් විධාන කරනු ලබන්නේ සේවකයෙකු නැවත සේවයේ පිහිටුවීම පමණක් වන යම් කාරණයක දී ඒ සේවකයාගේ සේවය අවසන් කරන අවස්ථාවේ දී ඔහු ලැබූ මාසික වැටුපේ හෝ වේතනයේ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක;

(iii) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වී ඇති ආඥාවෙන් සේවකයාට මුදලක් ගෙවීමට සහ ඔහු නැවත සේවයේ පිහිටුවීමට විධාන කරනු ලබන යම් කාරණයක දී ඒ මුදලට සමාන මුදලක් සහ ඒ සේවකයාගේ සේවය අවසන් කරන අවස්ථාවේ දී ඔහු ලැබූ මාසික වැටුපේ

හෝ
හෝ
වේ
වේ
ත
න

යේ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක

ඇපයක් මුදලින් තැබිය යුතු ය;

සේවකයාගේ මාසික වැටුපේ හෝ වේතනයේ හෝ දොළොස් ගුණයකට සමාන මුදල් ප්‍රමාණයක ඇපයක් තබන ලෙස, මේ උපවගන්තියේ ඉහත සඳහන් ඡේද යටතේ සේවායෝජකයකුට නියම කෙරෙන අවස්ථාවක, දෛනික වැටුපක් ගෙවනු ලබන සේවකයකු සම්බන්ධයෙන් වූ විට , එම මාසික වැටුප හෝ වේතනය හෝ එම සේවකයාගේ දෛනික වේතනයෙහි විසිහය ගුණයක් ලෙස සළකනු ලැබිය යුතුය.

"සේවායොජකයා" යන්නට තවදුරටත් සේවායෝජකයකු ව සිටීම නතර වී ඇති සහ 31 ආ වගන්තියෙහි (6) වන උපවගන්තියේ සඳහන් තැනැත්තෙක් ඇතුළත් වේ.

(4) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් කරන ලද සෑම ඉල්ලීමක්ම, ඒ උපවගන්තිය යටතේ තැබීමට නියම කරඇති ඇප ඉල්ලුම්කරු විසින් තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරගේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් සමඟ විය යුතුය

(5) 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ඉදිරිපත් කරන සෑම අභියාචන පෙත්සමකම රුපියල් පහක වටිනාකමින් යුත් අවලංගු නොකළ මුද්දර අලවා තිබිය යුතු අතර , ඉල්ලුම්කරු විසින් ඇප තැබීමට නියමිත සෑම කාරණය දී ම අභියාචක එසේ ඇප තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් ඒ සමඟ විය යුතු ය. අභියාචනය කරනු ලබන්නේ සහතිකය ඒ සමඟ විය යුතු ය.

(6) (4) වන උපවගන්තියේ සඳහන් සෑම අභියාචනයක් හෝ ඉල්ලීමක් සමඟම අවස්ථාවෝචිත පරිදි අභියාචක හෝ ඉල්ලුම්කරු විසින් ඒ උපවගන්තිය යටතේ තැබීමට නියමිත ඇප මුදල ඔහු විසින් තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් ද විය යුතු ය.

(7) මහේස්ත්‍රාත් අධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත කරන අභියාචන හා සම්බන්ධව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXVIII වන පරිච්ඡේදයේ ඇති විධිවිධාන, මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරන අභියාචන විභාග කිරීම සහ ඒවා පිළිබඳ කටයුතු නිම කිරීමට අදාළ සියළු කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව අදාළ විය යුතු ය.

(8) මේ වගන්තියෙහි_

"අනුමත බැංකුව" යන්නෙන්, මේ වගන්තියේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් , මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් , තැන්පත්කරුවන්ගේ ස්වාර්ථය සැළකිල්ලට ගෙන කළින් කල නියම කරනු ලැබිය හැකි බැංකුවක් අදහස් වේ; සහ

31 ඇඇ. (1) අණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් විසින් , කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් සම්බන්ධයෙන් ඒ වෙත නීතියෙන් පැවරී ඇති අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වෙත නීතියෙන් පැවරී ඇති ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ මහාධිකරණය විසින් කරන ලද යම් අවසාන ආඥාවකින් අතෘප්තියට පත් යම් සේවකයෙකු හෝ වෘත්තිය සමිතියක් හෝ සේවායෝජකයකු විසින් මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය කළින් ලබා ගෙන , ඒ ආඥාවට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කළ හැකි ය.

(2) එවැනි යම් මහාධිකරණයක් වෙත 31 ඇ වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ අධිකරණය විසින් කරන ලද යම් ආඥාවකට විරුද්ධව අභියාචනයේ දී තනි හා අනන්‍ය සංඥේය බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන අතර එවැනි මහාධිකරණයක එවැනි යම් ආඥාවක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කිරීම , ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය; තව ද යුක්තිය ඉෂ්ට වීම පිණිස අවශ්‍ය විය හැකි විධාන යම් කම්කරු විනිශ්චය අධිකාරයකට නිකුත් කිරීම හෝ අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස නැතහොත් යම් නඩු කටයුත්තක් පිළිබඳ වැඩිදුර විභාග පවත්වන ලෙස ආඥා කිරීම කළ හැකි ය ; තව ද යුක්තිය ඉෂ්ට වීම පිණිස අවශ්‍ය වේ නම් , අලුතෙන් හෝ වැඩි දුර සාක්ෂි කැඳවීම හා පිළිගැනීම සහ එවැනි අවස්ථාවක දී එවැනි සාක්ෂි ඒ මහාධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් වාර්තාගත කළ යුතු යැයි විධාන කිරීම ද කළ හැකි ය.

31 ඇඇඇ.(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත, 31 ඇ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවට විරුද්ධව ඒ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමක් මත ඒ මහාධිකරණය විසින්_

(අ ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද , ඒ ආඥාව ස්ථිර කරනු ලැබූ විට ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31 ඇඇ වගන්තිය යටතේ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට, 31 ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇපය, ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් සේවකයාට ගෙවීමට

සැළැස්විය යුතු ය;

(ආ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද , ඒ ආඥාව ප්‍රතිවර්තනය කරනු ලැබූ විට සහ ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31 ඇඇ වගන්තිය යටතේ ඒ මහාධිකරණයේ ආඥාවට

විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට, 31 ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇපය. ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ , ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් , සේවායෝජකයාට ආපසු දීමට සැළැස්විය යුතු ය;

(ඇ) ඒ අභියාචනයට හෝ ඉල්ලීමට විෂය වන්නේ යම් කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් ද , ඒ ආඥාව වෙනස් කරනු ලැබූ විට සහ ඒ සඳහා ඉඩ දී ඇති කාලය ඇතුළත 31 ඇඇ වගන්තිය යටතේ ඒ මහාධිකරණයේ ආඥාවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති විට , ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් මහාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය, ඒ මුදල සඳහා වන පොලිය ද සමඟ, 31 ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සැළැස්විය යුතු අතර ඒ ඇප මුදලින් සහ ඒ මුදල සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇතිනම් එය සේවායෝජකයාට ආපසු දීමට සැළැස්විය යුතු ය;

(2) කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවක් සම්බන්ධයෙන් සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වාභාවයේ වූ රිට් ආඥාවක් ප්‍රදානය කිරීම සඳහා අභියාචනාධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත, අභියාචනාධිකරණය විසින්_
කට විරුද්ධව ඒ මහාධිකරණය වෙත කරන ලද ප්‍රතිශෝධන ඉල්ලීමක් මත වූ ඒ මහාධිකරණයේ ආඥාවකට විරුද්ධව තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා විසින් කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයාට විරුද්ධ ව සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ හෝ මැන්ඩාමුස් යන ස්වාභාවයේ වූ රිට් ආඥාවක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලීමකට අවසර දෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් හෝ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරමින් කෙරුණු අභියාචනාධිකරණයේ ආඥාවකට විරුද්ධව තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින්_

(අ ) ඒ අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව ස්ථිර කරනු ලබන අවස්ථාවක, 31 ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් , සේවකයාට ගෙවීමට සැළැස්විය යුතු ය.

(ආ) ඒ අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව ප්‍රතිවර්තනය කරනු ලබන අවස්ථාවක , 31 ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදල, ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින්, සේවායෝජකයාට ආපසු දීමට සැළැස්විය යුතු ය.

(ඇ) අභියාචනයට විෂය වූ කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරනු ලබන අවස්ථාවක, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් , ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය, ඒ මුදල සඳහා වන පොලිය ද සමඟ 31 ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සළස්වනු ලැබිය යුතු අතර, ඒ ඇප මුදලින් සහ ඒ මුදල සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇත්නම්, එය සේවායෝජකයාට ආපසු දීමට සැළැස්විය යුතු ය.

(අ ) ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලබන්නා වූ සහ ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක 31 ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් සේවකයාට ගෙවීමට සැළැස්විය යුතු ය;

(ආ) කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව නිෂ්ප්‍රභ කරනු ලබන්නා වූ සහ අභියාචනාධිකරණයේ ආඥාවට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක, 31 ඇ (4) වන වගන්තිය යටතේ තබන ලද ඇප මුදල ඒ සඳහා එකතු වී ඇති පොලිය ද සමඟ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් , සේවායෝජකයාට ආපසු දීමට සළස්වනු ලැබිය යුතු ය;

(ඇ) කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාව වෙනස් කරනු ලබන්නා වූ සහ අභියාචනාධිකරණයේ ආඥාවට විරුද්ධව ඉඩ දී ඇති කාලය ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද අවස්ථාවක, ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් , අභියාචනාධිකරණයේ ආඥාව අනුව කටයුතු කිරීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඒ මුදල

සඳහා පොලිය ද සමඟ 31 ඇ (4) වගන්තිය යටතේ තබන ලද ඇප මුදලින් සේවකයාට ගෙවීමට සැළැස්විය යුතු අතර, ඒ ඇප මුදලින් සහ ඒ මුදල්

සඳහා වන පොලියෙන් යම් ශේෂයක් ඇත්නම් , එය සේවායෝජකයාට ආපසු දීමට සැළැස්විය යුතු ය.

(3) පහත දැක්වෙන අවස්ථා වලින් ඕනෑම අවස්ථාවක, එනම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක ආඥාවකට විරුද්ධව 31 ඈඈ වගන්තිය යටතේ තමන් වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාව

## IV ආ වන කොටස

(1962 අංක 4, 7 වන වගන්තිය)

## සේවකයන් වැඩිපුර සේවකයන් ලෙස සේවයෙන් ඉවත් කිරීමට අදාල විධිවිධාන

මේ කොටස අදාල වීම

(1962 අංක 4, 7 වන වගන්තිය)

31 ඉ. (1) මේ කොටසේ විධිවිධාන -

(අ) යම් සේවකයකු වැඩිපුර සේවකයකු ලෙස සේවයෙන් ඉවත් කිරීමට තමා අදහස් කරන බවට වු දැන්වීමක් යම් සේවා යෝජකයකු විසින් ඒ සේවකයාට භාර දෙන ලද මාසයට පූර්වයෙන් වූ මාසයේ, වැඩ කරන දිනයක දී ඒ සේවා යෝජකයා විසින් සේවයේ යොදවන සේවකයන්ගේ සාමාන්‍ය ගණන පසළොස් දෙනෙකුට වඩා අඩු වේ නම්, එවැනි සේවායෝජකයකුට; හෝ

(ආ) වාර ස්වභාවය වූ යම් කාර්මික ව්‍යාපාරයකට හෝ කලින් කල පමණක් වැඩ කරන යම් කාර්මික ව්‍යාපාරයකට; හෝ

(ඇ) එක් වර්ෂයකට අඩු කාලයක් යම් කාර්මික ව්‍යාපාරයක සේවයට යොදා ගනු ලැබූ යම් සේවකයකු වැඩිපුර සේවකයකු ලෙස සේවයෙන් ඉවත් කිරීමට හෝ අදාළ නො වන්නේ ය.

(2) මේ කොටසේ විධිවිධාන යම් කාර්මික ව්‍යාපාරයකට අදාළ කිරීම ඒ කාර්මික ව්‍යාපාරයෙහි බරපතල ප්‍රතිවිපාක ඇති වන ආකාරයෙන් ඒ කාර්මික ව්‍යාපාරය කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන නියෝගයන් මගින් ඒ කාර්මික ව්‍යාපාරයට මේ කොටසේ විධිවිධාන අදාළ නොවිය යුතු බව හෝ නියෝගයේ නිශ්චිත ව සඳහන් කොන්දේසිවලට යටත් ව අදාළ විය යුතු බව හෝ අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ හැකිය.

අමාත්‍ය
ත්‍යවරයා විසින් මේ
උප වගන්තිය යටතේ
කරනු ලබන සෑම

නියෝගයක් ම අනුමැතිය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් බලාන්විත නොවූ නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ඉහත (1)(අ) වන උපවගන්තියේ කාර්ය සඳහා සේවකයන් සංඛ්‍යාව ගණන් ගැනීමේ දී, ඒ කාර්මික ව්‍යාපාරයේ එක් වර්ෂයකට වඩා අඩු කාලයක් සේවයේ යොදවා සිටින සේවකයකු ද ගණන් ගනු ලැබිය යුතු ය.

(4) යම් කාර්මික ව්‍යාපාරයක් වාර ස්වභාවයක කාර්මික ව්‍යාපාරයක් ද නැතහොත් එ කාර්මික ව්‍යාපාරයේ වැඩ කලින් කල පමණක් කරනු ලබන්නක් ද යන්න පිළිබඳ ව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ ප්‍රශ්නය කොමසාරිස්වරයා විසින් තීරණය කළයුතු අතර, ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

වැඩිපුර සේවකයන් සේවයෙන් ඉවත් කිරීමේ අදහස පිළිබඳ එය අදාල සේවකයාට ද ඒ සේවකයා සාමාජිකයකු වන වෘත්තිය සමිතියට සහ කොමසාරිස් වරයාටද සේවා යෝජකයා විසින් දැනුම් දිය යුතු බව

(1962 අංක 4, 7 වන වගන්තිය)

31 ඊ යම් සේවායෝජකයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක සේවයේ යොදවා සිටින යම් සේවකයකු වැඩිපුර සේවකයකු වශයෙන් සේවයෙන් ඉවත් කිරීමට ඒ සේවායෝජකයා අදහස් කරන අවස්ථාවක දී, එසේ සේවයෙන් ඉවත් කිරීම, ඒ සේවායෝජකයා හෝ ඔහුගේ නියෝජිතයා ද ඒ සේවකයා හෝ ඔහුගේ නියෝජිතයා ද අතර ඇතිකර ගෙන තිබුණු ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් නැතහොත් මේ පනත යටතේ වූ යම් නිරවුල් කිරීමක හෝ තීරණයක හෝ ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලබන සේවයෙන් ඉවත් කිරීමක් වන්නේ නම් මිස ඒ සේවායෝජකයා විසින්,

(අ) එසේ අදහස් කර ඇති බවට දැන්වීමක් යටත් පිරිසෙයින් මාසයකට කලින් ඒ සේවකයාට සහ ඒ සේවකයා වෘත්තීය සමිතියක සාමාජිකයකු නම් ඒ වෘත්තිය සමිතියට ද කළ යුතු ය : තව ද

(ආ) ඒ දැන්වීමේ පිටපතක් කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

දැන්වීමේ දින සිට මාස දෙකක් ඉකුත් වන තෙක් සේවයෙන් ඉවත් කිරීම ක්‍රියාත්මක නොකළ යුතු බව.

(1962 අංක 4, 7 වන වගන්තිය)

31 උ. යම් සේවකයකු වැඩිපුර සේවකයකු වශයෙන් සේවයෙන් ඉවත් කිරීමට යම් සේවා යෝජකයකු අදහස් කරන බව දැනුම් දෙන දැන්වීමක් ඒ සේවායෝජකයා විසින් ඒ සේවකයකුට භාර දෙනු ලැබූ විට , 31 ඌ වන වගන්තියේ විධිවිධානවලට යටත් ව , ඒ දැන්වීමේ දින සිට මාස දෙකක් ඉකුත් වන තුරු ඒ සේවකයා එසේ සේවයෙන් ඉවත් කිරීම ඒ සේවායෝජකයා විසින් නොකළ යුතු ය.

වැඩිපුර සේවකයින් ඉවත් කිරීමට අදහස් කිරීමක් හේතු කොට ගෙන උද්ගත වූ කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා යොමු කර ඇති වාට ඒ ආරාවුල යොමු කළ දින සිට මාස දෙකක් ගත වන තෙක් සේවා යෝජකයා විසින් ඉවත් කිරීම ක්‍රියාත්මක නොකළ යුතු බව.

31 ඌ. 31 ඊ වන වගන්තියේ සඳහන් දැන්වීමෙන් අදහස් කරන පරිදි වැඩිපුර සේවකයකු සේවයෙන් ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එවකට පවත්නා හෝ උද්ගතවිය හැකි යයි සලකනු ලබන හෝ යම් කාර්මික ආරාවුලක් ඒ දැන්වීමේ දින සිට මාස දෙකක් ඉකුත් වීමට, ප්‍රථම-

(අ) සමාදාන කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බලයලත් නිලධරයකු වෙත කොමසාරිස්වරයා විසින් යොමු කර ඇති විටක; හෝ

(ආ) බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත කොමසාරිස්වරයා විසින් යොමු කර ඇති විටක; හෝ

(ඇ) බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත හෝ අමාත්‍යවරයා විසින් යොමු කර ඇති විටක: හෝ

ඒ සේවයෙන් ඉවත් කිරීම මේ පනත යටතේ වූ යම්

බේරුම් කිරීමක් හෝ ප්‍රදානයක් හෝ යටතේ කරනු ලබන්නේ නම් මිස , ඒ ආරාවුල ඉහත සඳහන් පරිදි යොමු කරනු ලැබූ දින සිට මාස දෙකක් ගත වන තෙක්, ඒ දැන්වීම කළ සේවායෝජකයා විසින්, තමා එසේ අදහස් කළ පරිදි, එකී සේවයෙන් ඉවත් කිරීම ක්‍රියාත්මක නොකළ යුතු ය:

එසේ වුව ද, එවැනි යම් ආරාවුලක් සමාදානයෙන් නිරවුල් කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් බලයලත් නිලධරයකු වෙත යොමු කරන ලදුව ඒ ආරාවුල නිරවුල් කිරීමට ඒ බලයලත් නිලධරයා අපොහොසත් වන අවස්ථාවක දී, 12(4) වන වගන්තිය යටතේ වූ වාර්තාවේ දින සිට ගණන් ගනු ලබන දින තිහක කාල සීමාව තුළ දී, බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 3(1)(ඈ) වන වගන්තිය යටතේ නැතහොත් 4(1) වන වගන්තිය යටතේ බේරුම්කරුවකු වෙත හෝ එය නිරවුල් කිරීම සඳහා 4(2) වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත හෝ , යොමු නොකරන ලද නම්, එකී දින තිහක කාලසීමාව ඉකුත් වීමෙන් පසු, අදහස් කරන ලද පරිදි වැඩිපුර සේවකයකු ලෙස එසේ සේවයෙන් ඉවත් කිරීම, සේවායෝජකයා විසින් ක්‍රියාත්මක කළ හැකි ය. (1962 අංක 4, 7 වන වගන්තිය)

“ 31 ඌ වගන්තියේ (ඇ) ඡේදය 1968 අංක 39 දරණ පනත මගින් ඉවත් කරන ලදි ”

## V වන කොටස

## අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාර

32. (1) යම් අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක ඇති වූ යම් කාර්මික ආරාවුලක් හේතුකොට ගෙන සේවකයන් පිටමං කිරීමක් ආරම්භ කිරීමේ අධ්‍යාශය පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ පිටමං කිරීම ආරම්භකරන දිනයට යටත් පිරිසෙයින් දින විසි එකකට කලින් හා පිටමං කිරීම බලපාන සේවකයන් වෙත , නියමිත ආකාරයට හා නියමිත ආකෘතියට අනුකූලව, සේවායෝජකයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ නිකුත්කර තිබුණේ නම් මිස , එවැනි අත්‍යවශ්‍ය කාර්මික ව්‍යාපාරයක් ඇති වූ යම් කාර්මික ආරාවුලක් හේතු කොට ගෙන සේවකයන් පිටමං කිරීමක් ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාම හෝ එවැන්නකට සහභාගි වීම හෝ එවැනි පිටමං කිරීමකට තවදුරටත් ඉදිරියට ගෙන යෑම හෝ කිසිදු සේවායෝජකයකු විසින් නොකළ යුතු ය.

(2) යම් අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක ඇති වූ යම් කාර්මික ආරාවුලක් හේතුකොට ගෙන වැඩ වර්ජනයක් ආරම්භ කිරීමේ අධ්‍යාශය පිළිබඳ ලිඛිත දැන්වීමක් ඒ වැඩ වර්ජනය ආරම්භ කරන දින සිට යටත් පිරිසෙයින් දින විසි එකකට කලින් , නියමිත ආකාරය හා නියමිත ආකෘතියකට අනුකූලව, යම් සේවකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ තම සේවායෝජකයා වෙත භාර දී තිබුනේ නම් මිස එවැනි අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක ඇති වූ යම් කාර්මික ආරාවුලක් හේතුකොට ගෙන වැඩ

වර්ජනයක් ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම හෝ එවැන්නකට සහභාගි වීම හෝ එවැන්නකට තවදුරටත් ඉදිරියට ගෙන යෑම හෝ එවැනි කිසිදු සේවකයකු විසින් නොකළ යුතු ය.

## V අ වන කොටස
## අසාධාරණ කම්කරු පිළිවෙත්

32. අ කිසිම සේවා යෝජකයකු විසින්_

(අ) යම් කම්කරුවකුගේ සේවා නියුක්තියේ කොන්දේසියක් වශයෙන්, ඒ කම්කරුවාට යම් වෘත්තිය සමිතියකට බැඳෙන ලෙස හෝ බැඳීමෙන් වැළකී සිටින ලෙස හෝ ඒ කම්කරුවා සාමාජිකයෙකු වන වෘත්තිය සමිතියක සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන ලෙස හෝ ඉල්ලා අස්වීමෙන් වැළකී සිටින ලෙස හෝ ඉල්ලා අස්වීමෙන් වැළකී සිටින ලෙස නියම නොකළ යුතු ය;

(ආ) කම්කරුවකු වෘත්තිය සමිතියක සාමාජිකයකු වීමේ හෝ ඔහු වෘත්තිය සමිති කටයුතු වල යෙදී සිටීමේ හේතුව නිසාම පමණක් ඔහු සේවයෙන් පහ නොකළ යුතු ය;

(ඇ) කම්කරුවකු වෘත්තිය සමිතියක සාමාජිකයෙකු, නිළධාරියකු හෝ නියෝජිතයෙකු වීමෙන් හෝ එවැන්නෙකුව දිගට ම සිටීමෙන් ඔහු වැළැක්වීමේ කාර්යය සඳහා ඒ කම්කරුවාට යම් පෙළඹවීමක් කිරීම හෝ පොරොන්දුවක් දීම නොකළ යුතු ය;

(ඈ) කම්කරුවකු විසින්_

(i) වෘත්තිය සමිතියක් පිහිටු වීමෙන්; හෝ

(ii) මුදලින් හෝ වෙනත් ක්‍රම මගින් වෘත්තිය සමිතියට ආධාර කිරීමෙන්

ඔහු වළක්වනු නොලැබිය යුතු ය;

(ඉ) වෘත්තිය සමිතියක කටයුතු කරගෙන යාමෙහි ලා මැදිහත් නොවිය යුතු ය;

(ඊ) යම් කම්කරුවකු හෝ වෘත්තීය සමිතියක නිළධාරියකු_

(i) ඒ කම්කරුවා හෝ නිළධාරියා විසින් යම් විනිශ්චයාධිකාරයක් හෝ බලධාරියකු ඉදිරියෙහි සද්භාවයෙන් කරන ලද යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන්; හෝ

(ii) ඒ වෘත්තිය සමිතියේ සාමාජිකයන්ට සහන ලබා ගැනීමේ හෝ ඔවුන්ගේ වැඩ කිරීමේ තත්ත්වයන් යහපත් බවට පත් කර ගැනීමේ කාර්යය සඳහා , කාර්මික ආරාවුලක් අනුව , ඒ කම්කරුවා හෝ නිළධාරියා විසින් ඒ වෘත්තිය සමිතියේ සාමාජිකයන් ගේ සේවා නියුක්තියේ නියමයන්ට හෝ කොන්දේසි වලට අදාළව සේවායෝජක යාගේ ක්‍රියා හෝ නොකර හැරීම් පිළිබඳ ව කරන ලද යම් ප්‍රකාශයන් සම්බන්ධයෙන් න්

ඒ කම්කරුවා හෝ සාමාජිකයා සේවයෙන් පහ කිරීම හෝ ඔහුට විරුද්ධ ව අන්‍යාකාරයකි කින් විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම නොකළ යුතු ය;

(උ) යම් වෘත්තිය සමිතියක් වශයෙන් කේවල් කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ

යම් කම්කරුවන් සම්බන්ධයෙන් ද , ඒ කම්කරුවන් සියයට හතළිහකට නොඅඩු ගණනක් ස්වකීය සාමාජිකත්වයේ සිටින ඒ වෘත්තිය සමිතිය සමඟ කේවල් කිරීම, ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා වෘත්තීය සමිතිය සේවායෝජකයා සමඟ කේවල් කිරීමට අපේක්ෂා කරන්නේ යම් කම්කරුවන් වෙනුවෙන් ද , ඒ කම්කරුවන් යටත් පිරිසෙයින් සියයට හතළිහක් ඒ වෘත්තිය සමිතියේ සාමාජිකයන් වන්නේ ද , යන වග නිසැකව දැන ගැනීම පිණිස කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් සේවා ස්ථානයක දී ඡන්දය විමසීමක් පවත්වනු ලැබිය හැකි ය.

## VI වන කොටස

### සාමාන්‍ය කරුණු

33.(1) මේ පනත යටතේ දෙන ලද යම් ප්‍රදානයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද නියෝගයක හෝ නිශ්චිත ව නියම කර තිබිය හැකි කරුණුවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි,-

(අ) අවශ්‍ය වන විට, එකී ප්‍රදානයේ දිනයට හෝ නියෝගයේ දිනයට හෝ පෙරාතුව වූ දිනයක සිට බල පැවැත්වෙන සේ යම් පඩියක් ගෙවීමට හෝ කොන්දේසියක් අදාළ කිරීමට හෝ කරන ලද තීරණ ද යම් වැඩ වර්ජනයක් හෝ පටමං කිරීමක් හෝ හේතු කොට ගෙන වැඩට නොපැමිණි යම් කාලසීමාවක් සඳහා පඩි ගෙවිය යුතු බවට කරන ලද තීරණ සඳහා පඩි ගෙවිය යුතු බවට කරන ලද තීරණ ද ඇතුළු ව , පඩි සහ වෙනත් සියලුම සේවා කොන්දේසි පිළිබද තීරණ;

ආ) යම් සේවකයකු සේවයෙන් පහ කිරීම හෝ සේවයේ රඳවා ගැනීම හෝ ආරාවුලට පාත්‍ර වූ කරුණක් වන විට , නැතහොත් කාර්මික ආරාවුලක් නිසා උද්ගත වූ වැඩ වර්ජනයක් හෝ පිටමං කිරීමක් හෝ ආරම්භයේ දී නැතහොත් එවැන්නක් පවතිද්දී යම් සේවකයකු සේවයෙන් පහකරනු ලැබූ හෝ ඔහුගේ සේවය නතර කරනු ලැබ හෝ ඇති විට, එවැනි සේවකයකු යළි සේවයේ පිහිටුවීම හෝ ඔහුගේ සේවය නතර කිරීම හෝ පිළිබඳ තීරණ;

(ඇ) යම් සේවකයකු යළි සේවයේ පිහිටුවිය යුතු යයි බේරුම්කරු හෝ කාර්මික අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය හෝ විසින් නිශ්චය කර ඇති අවස්ථාවක දී, යම් විශ්‍රාම වැටුපකට, පාරිතෝෂික

ප්‍රදානයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක නියෝගයක් හෝ නියමයන්
(1957 අංක 62,
15 වන වගන්තිය)

මුදලකට, විශ්‍රාම දීමනාවකට හෝ යම් අර්ථසාධක යෝජනා ක්‍රමයක් යටතේ වූ යම් ප්‍රතිලාභයකට ඒ සේවකයා සතු අයිතිවාසිකම් සලකා බැලීමේ දී ඔහු වැඩට නොපැමිණි කාලසීමාව කොතරම් ප්‍රමාණයකට ගනන් ගත යුතු ද නැතහොත් ගණන් නොගත යුතු ද යන්න පිළිබඳ තීරණ;

(1957 අංක 62, 15 වන වගන්තිය)

(ඇ) යම් සේවායෝජකයකු විසින් යම් සේවකයකුට වන්දි මුදල් ගෙවීමක් එවැනි වන්දි මුදලක් ප්‍රමාණය හෝ ප්‍රමාණය ගණන් බැලිය යුතු ආකාරයක් ඒ වන්දි මුදල් ගෙවිය යුත්තේ කවර කාලයක් ඇතුළත ද යන්න පිළිබඳ තීරණ;

(1962 අංක 4, 8 වන වගන්තිය)

(1956 අංක 62, 15 වන වගන්තිය)

(ඉ) (1983 පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ අවස්ථාවක දී හැර ) සේවා යෝජකයකු විසින් යම් කම්කරුවකුට පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුපක් හෝ ප්‍රසාද මුදලක් ගෙවීම , ඒ පාරිතෝෂිකයේ, විශ්‍රාම වැටුපේ හෝ ප්‍රසාද මුදලේ ප්‍රමාණය සහ ඒ ප්‍රමාණය ආගණනය කිරීමේ ක්‍රමය හා ඒ පාරිතෝෂිකය, විශ්‍රාම වැටුප හෝ ප්‍රසාද මුදල ගෙවනු ලැබිය යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය පිළිබඳව එකී තීරණයක හෝ ආඥාවක හෝ ඇතුළත් කල හැකි ය.

(1957 අංක 62, 15 වන වගන්තිය)

(1962 අංක 4, 8 වන වගන්තිය)

(2) ප්‍රදානයේ දිනයට හෝ කම්කරු විනිශ්චය අධිකාරයේ නියෝගයේ දිනයට හෝ පෙර යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වූ පඩි වශයෙන් වුව ද, වන්දි, පාරිතෝෂික, විශ්‍රාම වැටුප් හෝ ප්‍රසාද මුදල් වශයෙන් වුව ද යම් මුදලක් යම් සේවා යෝජකයකු විසින් යම් සේවකයකුට ගෙවීම සම්බන්ධෂයෙන් (1) වන උපවගන්තිය යටතේ තීරණ මුලින් සඳහන් යම් ප්‍රදානයක හෝ කම්කරු විනිශ්වය අධිකාරයක් හෝ ආඥාවක ඇතුළත් වන අවස්ථාවක දී, ඒ සේවා යෝජකයා විසින් ඒ සේවකයා සේවයේ යොදවා සිටින හෝ සේවයේ යොදවා සිටි හෝ ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත , ඒ සේවකයා විසින් ඉදිරිපත් කරන ලද , ලිඛිත පෙත්සම අනුව ඒ ප්‍රදානයේ හෝ කම්කරු විනිශ්වය අධිකාරියේ නියෝගයේ හෝ නිශ්චිත ව සඳහන් කාලය තුළදී ඒ මුදල ඒ සේවකයාට නොගෙවන ලද බවට , ඒ අධිකරණය සෑහීමට පත් වන්නේ නම් ඒ මුදල් ප්‍රමාණය ඒ සේවකයාට සේවායෝජක විසින් ගෙවිය යුතු යැයි නියෝග කළ යුතු අතර ඒ සේවකයාට සේවායෝජක විසින් ගෙවිය යුතු යැයි නියෝග කල යුතු අතර ඒ නියෝගය අනුව ඒ මුදල නොගෙවනු ලැබුව හොත්, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් අය කර ගත යුතු යයි ද නියෝග කළ යුතු ය: තව ද එසේ අයකරගනු ලැබූ මුදල ඒ සේවකයාට ගෙවනු ලැබිය යුතු ය.

(1957 අංක 62, 15 වන වගන්තිය)

(1962 අංක 4, 8 වන වගන්තිය)

(1983 අංක 12, වගන්තිය)

(3) යම් සේවකයකු යම් සේවා නියුක්තියක යළි සේවයෙහි පිහටුවීම, සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ගනු ලැබූ තීන්දුයක් යට කී යම් තීරණයක හෝ කම්කරු විනිශ්වය අධිකාරයක් විසින් කරන ලද නියෝගයක් හෝ ඇතුළත් වන අවස්ථාවකදී, ඒ සේවා නියුක්තිය සේවායෝජකයාගේ පුද්ගලික ලේකම්, පුද්ගලික ලිපිකරු, පුදගලික සේවක, හෝ පුද්ගලික රියැදුරු හෝ ගෘහ සේවක යන තත්ත්වයක නැතහොත් එකී යම් තත්ත්වයකට සමාන වෙනත් යම් නියමිත තත්ත්වයක

සේවා නියුක්තියක් වන්නේ නම්, ඒ සේවකයා යළි සේවයේ පිහිටුවීම වෙනුවට විකල්පයක් වශයෙන් ඔහුට වන්දි ගෙවීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ (ඈ) යටතේ වූ යම් තීන්දුවක් ද යට කී ප්‍රදානයේ හෝ කම්කරු විනිශ්චය සභාවක නියෝගයේ හෝ අඩංගු විය යුතු ය.

(1957 අංක 62, 15 වන වගන්තිය)

(4) සේවායෝජකයා වෙළඳ සමාගමක් වන අවස්ථාවක, (3) වන උපවගන්තිය අදාළ කර ගැනීමේ කාර්යය සඳහා, සේවායෝජකයා පිළිබඳව එහි ඇති සඳහන් කිරීම්, (කවර පදවිනාමයකින් හැඳින්වුන ද) එම වෙළඳ සමාගමේ ව්‍යාපාර කටයුතු පිළිබඳ පොදු කළමනාකාරණය සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා පිළිබඳ සඳහන් කිරීම් ලෙස සැලකිය යුතු ය.

(1957 අංක 62, 16 වන වගන්තිය)

(1957 අංක 27, 6 වන වගන්තිය)

(5) යම් සේවකයකු යළි සේවයේ පිහිටුවීම සඳහා (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තීන්දුවක් කළ යුතු යයි බේරුම්කරු කාර්මික අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් සලකනු ලබන අවස්ථාවක දී, වන්දි සඳහා ඉල්ලීමක් ඒ සේවකයා විසින් කරනු ලැබුවහොත්, එවැනි තීන්දුවක් කිරීම වෙනුවට ඒ සේවකයාට වන්දි ගෙවීම සඳහා (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ තීන්දුවක් ඒ බේරුම්කරු, කාර්මික අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් කල හැකි ය. තවද එවැනි යම් අවස්ථාවක දී, ඒ වන්දි ගෙවීම ඒ සේවකයා යළි සේවයේ පිහිටුවීම වෙනුවට වූ විකල්පයක් වශයෙන් ගෙවනු ලබන වන්දියක් පරිද්දෙන් (2) වන උපවගන්තියේ විධිවිධාන ඊට අදාළ වන්නේ ය.

(1957 අංක 62, 15 වන වගන්තිය)

(6) යළි සේවයේ පිහිටුවීම වෙනුවට විකල්පයක් වශයෙන් වන්දි ගෙවීම සඳහා වූ තීරණයක් කිරීම සුදුසු යයි කාර්මික අධිකරණය, කම්කරු විනිශ්චය අධිකාරය හෝ බේරුම්කරුවකු විසින් සලකනු ලබන කවර අවස්ථාවක දි වුව ද, එවැනි තීන්දුවක් (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ, ප්‍රදානයක හෝ නියෝගයක හෝ ඇතුළත් කිරීමට කාර්මික අධිකරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ බේරුම්කරුවකු හෝ සතු බලතල, (3) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන මගින් සීමා කිරීමක් සිදු වේ යයි තේරුම් නොගත යුතු ය.

(1957 අංක 62, 15 වන වගන්තිය)

34. (1) මේ පනත යටතේ බේරුම්කරුවකු විසින් හෝ කාර්මික අධිකරණයක් විසින් හෝ දෙන ලද ප්‍රදානයක නැතහොත් මේ පනත යටතේ 31 ආ වගන්තිය යටතේ කරන ලදි ඉල්ලීමක් මත කරන ලද ආඥාවක් හැර, කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් මේ පනත යටතේ කරනලද ආඥාවක් අර්ථ නිරූපණය සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැඟුන හොත්, කොමසාරිස්වරයා විසින් හෝ ඒ තීරණයෙන් නැතහොත් ආඥාවෙන් බැඳී සිටින යම් පාර්ශවයක්, වෘත්තීය සමිතියක් සේවායෝජකයකු හෝ සේවකයකු විසින්, ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා එය බේරුම්කරු වෙත හෝ ඒ කාර්මික අධිකරණය සමන්විත වූ තැනැත්තා නැතහොත් තැනැත්තන් වෙත හෝ ඒ කම්කරු විනිශ්චය අධිකාරය වෙත හෝ යොමු කළ හැකි අතර, කවර හේතුවක් නිසා වුව ද එවැනි යොමු කිරීමක් කළ නොහැකි වන විට, ඒ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා එය කාර්මික අධිකරණයක් වෙත යොමු කළ හැකි ය. එම ප්‍රශ්නය යොමු කරනු ලැබූ බේරුම්කරු හෝ කාර්මික අධිකරණය හෝ විසින්, පාර්ශව වලට සවන් දීමෙන් පසු හෝ එම පාර්ශව වල කැමැත්ත කලින් ලබා

ගෙන තිබේ නම් එවැනි සවන් දීමකින් තොරව හෝ ඒ ප්‍රශ්නය නිරාකරණය කළ යුතු ය;

එසේ වුව ද, යම් වෘත්තිය සමිතියක සාමාජිකයකු වන කිසිම සේවායෝජකයකු හෝ සේවකයකු විසින්, ඒ වෘත්තීය සමිතියෙන් ස්වාධීන ව මේ උපවගන්තියේ පෙරාතුව දැක්වුණු විධිවිධාන යටතේ යම් ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා යොමු නොකළ යුතු ය.

(1966 අංක 27
7 වන වගන්තිය)

(1968 අංක 39
2 වන වගන්තිය)

(2) (1) වන උප වගන්තිය යටතේ කරන ලද යොමු කිරීමක් අනුව දෙනු ලබන තීරණය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම සඳහා කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය. එය ඊට අදාළ මුල් තීරණයේ කොටසක් වශයෙන් සැලකිය යුතු අතර, ඒ මුල් තීරණයේ බලපෑම සර්ව ප්‍රකාරයෙන් ම ඊට ලැබිය යුතු ය.

සාක්ෂි ආදිය.
(1957 අංක 62
17 වන වගන්තිය)

35. බේරුම්කරුවකු වෙත හෝ කාර්මික අධිකරණයක් වෙත හෝ කම්කරු විනිශ්වය අධිකාරයක් වෙත හෝ යොමු කරනු ලැබූ යම් කාර්මික ආරාවුලකට සම්බන්ධ ප්‍රශ්න, මේ පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විධිමත් කරන ලද පඩි හෝ වැඩ කරන පැය ගණන හෝ සේවයට බලපාන වෙනත් සේවා කොන්දේසි හා නියමයන් හෝ සේවා නියුක්තිය හා සම්බන්ධ ප්‍රශ්න වන අවස්ථාවක දී ඒ කාර්මික අධිකරණය හෝ බේරුම්කරු හෝ කම්කරු විනිශ්වය අධිකාරය හෝ විසින් දෙනු ලබන ප්‍රදානයේ ඇතුළත් නියමයන් එකී වෙනත් ලිඛිත නීතියේ විධිවිධානවලින් සලස්වා ඇති සහනවලට වඩා අඩු වාසිදායක නියමයන් නොවිය යුතු ය.

(1962 අංක 4
9 වන වගන්තිය)

(1957 අංක 62
17 වන වගන්තිය)

36. (1) මේ පනතේ කාර්යය සඳහා යම් කාර්මික අධිකරණයකට කම්කරුවිනිශ්වය අධිකාරයකට, බේරුම්කරුවකුට, බලයලත් නිලධරයකුට, කම්කරු පරික්ෂකවරයකුට හෝ කොමසාරිස්වරයාට ද මේ පනතේ පහත සඳහන් ක්‍රම හැර වෙනත් ක්‍රම මගින් යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා කොමසාරිස්වරයාට නැතහොත් කම්කරු පරික්ෂකවරයකුට ද-

(අ) අවශ්‍ය යයි ඒ අධිකරණය විනිශ්වය අධිකාරය, බේරුම්කරු හෝ බලයලත් නිලධරයා, නැතහොත් කොමසාරිස්වරයා හෝ ඒ කම්කරු පරික්ෂකවරයා හෝ සලකන විස්තර කිසිවක් ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තෙකුට නියමයක් මගින් ඒ අධිකරණය, විනිශ්වය අධිකාරය, බේරුම්කරු හෝ බලයලත් නිළධරයා නැතහොත් කොමසාරිස්වරයා හෝ ඒ කම්කරු පරික්ෂකවරයා නියම කිරීමේ,

(අඅ) ඒ අධික රණය , විනිශ් වය අධිකා කාර ය, බේරු ම්කරු රු හෝ බලය ලත් නිලධ රයා, නැත හොත් ත් කො මසාරි ස්වර යා යා හෝ ඒ කම් කරු

බේරුම්කරුවකු විසින් හෝ කාර්මික අධිකරණයක් විසින් හෝ දෙන ලද ප්‍රදානයක නැතහොත් කම්කරු විනිශ්වය අධිකාරයක නියෝගයක හෝ අර්ථ නිරූපණය

(1957 අංක 62
16 වන වගන්තිය)

(1957 අංක 27
6 වන වගන්තිය)

(1968 අංක 39
2 වන වගන්තිය)

බේරුම්කරුවකුගේ හෝ කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්වය අධිකාරයක හෝ තීරණයක් එවකට පවත්නා නීතියට වඩා අඩු වාසිදායක එකක් නොවිය යුතු බව.

පරික්ෂකවරයා හෝ විසින් විමර්ශනය කරගෙන යනු ලබන හෝ පරික්ෂා කරගෙන යනු ලබන කාර්මික ආරාවුලක පාර්ශ්වවලින් හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් හෝ ඒ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබීම සඳහා ඔවුන්ට දන්වනු ලබන දිනයක දී සහ වෙලාවක දී එම දැන්වීමේ සඳහන් ස්ථානයට පැමිණෙන ලෙස ඔවුනට නියමයක් මගින් නියම කිරීමේ:

(1957 අංක 62 17 වන වගන්තිය)

(ආ) ඒ අධිකරණය, විනිශ්වය අධිකාරය, බේරුම්කරු හෝ බලයලත් නිලධරයා කොමසාරිස්වරයා හෝ පරික්ෂකවරයා ඉදිරියේ දිවුරුම්පිට හෝ අන්‍යාකාරයකින් හෝ සාක්ෂි දෙන ලෙස යම් තැනැත්තෙකුට නියමයක් මගින් නියම කිරිමේ; සහ

(ඇ) අවශ්‍ය යයි ඒ අධිකරණය, විනිශ්වය අධිකාරය, බේරුම්කරු හෝ බලයලත් නිලධරයා නැතහොත් කොමසාරිස්වරයා හෝ ඒ කම්කරු පරික්ෂකවරයා සලකන ලියවිලි කිසිවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියමයක් මගින් නියම කිරිමේ : බලය ඇත්තේ ය.

සලකන ලෙස ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කල හැකිය. එවැනි ඉල්ලිමක් කරන අවස්ථාවක දී,-

(2) (අ) විස්තර කිසිවක් සැපයීමට හෝ ලියකියවිලි කිසිවක් ඉදිරිපත් කිරිමට හෝ බලයලත් නිලධරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ යම් තැනැත්තෙකුට නියම කරන ලද විටක, එසේ ඉදිරිපත් කිරිමට ඒ බලයලත් නිලධරයා විසින් නියම කරන ලද තොරතුරු අනාවරණය කිරිම තම ව්‍යාපාරයට හෝ ස්වාර්ථයට හෝ හානිකර වේ යයි දිවුරුම්පිට හෝ සහතික ප්‍රකාශයක් පිට හෝ දිවුරුම් පෙත්සමකින් සනාථ කරන ලද ප්‍රකාශයක් මගින් හෝ ඒ තැනැත්තා ප්‍රකාශ කළ අවස්ථාවක දී, කොමසාරිස්වරයා වෙත ඒ විස්තර සපයන ලෙස හෝ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස කොසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබුවහොත් මිස, පළමු කී නියමය අනුව ක්‍රියා කිරිමට ඒ තැනැත්තා බැදි නොසිටි.

(i) ඒ ඉල්ලිමට අදාළ විස්ත

(ආ) (1) වන උපවගන්තිය යටතේ විස්තර කිසිවක් සපයන හෝ සාක්ෂි දෙන හෝ ලියකියවිලි කිසිවක් ඉදිරිපත් කරන හෝ යම් තැනැත්තකු විසින්, ඒ විස්තර, සාක්ෂි හෝ ලියකියවිලි රහසිගත ඒවා මෙන්

(1957 අංක 62 17 වන වගන්තිය)

ර, සාක්ෂි හෝ ලියකියවිලි මගින් සපයනු ලබන තොරතුරු අනාවරණය කිරීම ඒ තැනැත්තාගේ ව්‍යාපාරයට හෝ ස්වාර්ථයට හෝ හානිකර විය හැකි බවට;

සහ

(ii) ඒ තොරතුරු එසේ නොමැතිව අන්‍යාකාරයකින් ලබා ගත නොහැකි බවට

(1957 අංක 62
17 වන වගන්තිය)

අවස්ථාවෝචිත පරිදි, කාර්මික අධිකරණය, කම්කරු විනිශ්චය අධිකාරය, බේරුම්කරු, බලයලත් නිලධරයා හෝ කොමසාරිස්වරයා, හෝ කම්කරු පරික්ෂකවරයා සෑහීමට පත්වන්නේ නම් ඒ තැනැත්තාගේ පූර්ව කැමැත්ත නොමැතිව ඒ තොරතුරු අනාවරණය නොකරන ලෙස අවස්ථාවෝචිත පරිදි කාර්මික අධිකරණය, කම්කරු විනිශ්චය අධිකාරය, බේරුම්කරු, බලයලත් නිලධරයා, කොමසාරිස්වරයා හෝ කම්කරු පරික්ෂකවරයා විසින් නියම කල යුතු ය. එවැනි නියමයක් කඩකරන කවර තැනැත්තෙක් වුව ද මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(1957 අංක 62
17 වන වගන්තිය)

(1957 අංක 62
17 වන වගන්තිය)

(3) යම් තැනැත්තකු විසින් යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ලිපිකියවිලි කිසිවක් ඉදිරිපත් කිරීම හෝ මේ පනත හැර වෙනත් යම් ලිඛිත නිතියක විධිවිධාන මගින් නැතහොත් එවැනි විධිවිධාන යටතේ තහනම් කර ඇති අවස්ථාවක දී, එවැනි තොරතුරු අනාවරණය කිරීමට හෝ එවැනි ලියකියවිලි ඉදිරිපත් කිරීමට හෝ මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කිසිවකින් ඒ තැනැත්තාට නියම කෙරෙන බවත් නැතහොත් ඔහුට බලට පැවරෙන බවත් නොසැලකිය යුතු ය.

(4) මේ පනත යටතේ නීතිකෘත්‍ය පවත්වා ගෙන යාමේ දි, යම් කාර්මික අධිකරණයක්, කම්කරු විනිශ්චය අධිකාරයක්, බේරුම්කරුවෙක්, බලයලත් නිලධරයෙක් හෝ කොමසාරිස්වරයා, සාක්ෂි ආඥාපනතේ විධිවිධාන වලින් බැඳි නොසිටින්නේ ය.

(5) කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් යම් නීති කෘත්‍යයක් ආරම්භ කිරිමෙන් පසු කවර වේලාවක දි වුව ද, ඒ ආරාවුලට අදාළ යම් අලුත් කරුණක්, එකී නිතිකෘත්‍ය ආරම්භයේ දී ඉදිරිපත් කල නොහැකි වන්නක් බව ඒ නීති කෘත්‍ය පවත්වාගෙන යන කාර්මික අධිකරණයට බේරුම්කරුට හෝ කම්කරු විනිශ්චය අධිකාරයට ඒත්තු යන්නේ නම් එම කර්මික අධිකරණය, බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් තිරණය කරනු ලැබීම සඳහා එවැනි අළුත් කරුණක් ඉදිරිපත් කිරීමට ඒ ආරාවුලේ යම් පාර්ශ්වයකට ඇතුළත් වන යම් වෘත්තිය සමිතියකට, සේවායෝජකයකුට නැතහොත් සේවකයකුට හෝ ඒ කාර්මික අධිකරණය හෝ බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය හෝ විසින් ඉඩදිය හැකිය;

එසේ වුව ද, වෘත්තිය සමිතියක සාමාජිකයකු වන යම් සේවායෝජකයකුට හෝ සේවකයකුට හෝ, තම වෘත්තිය සමිතියෙන් ස්වාධීන ව එවැනි අලුත් කරුණක් ඉදිරිපත් කිරීමට ඉඩ නොදිය යුතු ය.

(1957 අංක 62
17 වන වගන්තිය)

(6) (5) වන උපවගන්තිය යටතේ යම් අලුත් කරුණක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක දී, ඒ පිළිබඳව ලිඛිත දැන්වීමක්, ඒ කරුණ ඉදිරිපත් කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින්, ඒ පාර්ශ්වයට ඇතුළත් වන අනෙක් සෑම වෘත්තීය සමිතියකට ද සේවා යෝජකයකුට ද හා සේවකයකුට ද අනෙක්

පාර්ශ්වයට හා ඒ අනෙක් පාර්ශ්වයට ඇතුළත් වන සෑම වෘත්තීය සමිතියකට සේවායෝජකයකුට හා සේවකයකුට ද භාරදිය යුතු ය:

එසේ වුව ද, වෘතීය සමිතියක සාමාජිකයකු වන සේවායෝජකයකුට හෝ සේවකයකුට ඔහුගේ වෘත්තීය සමිතියෙන් ස්වාධීන ව එවැනි දැන්වීමක් භාර දීම අවශ්‍ය නොවේ.

37. බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ ඉදිරියේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක් සම්බන්ධයෙන් වූ සියලු ගාස්තු, මේ පනත යටතේ සාදන ලද නියෝගවලට යටත් ව, අවස්ථාවෝචිත පරිදි, ඒ බේරුම්කරුගේ, ඒ අධිකරණයේ හෝ ඒ විනිශ්චය අධිකාරයේ අභිමතය පරිදි තීරණය කරනු ලැබේ.

38. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

39. (1) යම් සේවා නියක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 31 ආ වගන්තිය යටතේ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, එම පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් භාර නොගත යුතු ය.

(2) කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31 ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයකදී කොමිෂන් සභාව විසින් භාර නොගත යුතු ය.

40. (1) යම් අවස්ථාවක දී, -

(අ) මේ පනත යටතේ වූ සාමූහික ගිවිසුමකින් හෝ නිරවුල් කිරීමකින් හෝ බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් නැතහොත් කම්කරු, විනිශ්චය අධිකාරයක් විසින් දෙන ලද ප්‍රදානයකින් හෝ බැඳී සිටින යම් තැනැත්තෙකු ඒ ගිවිසුමේ නිරවුල් කිරීමේ හෝ ප්‍රදානයේ අඩංගු කොන්දේසි හෝ නියමයන් උල්ලංඝණය කැරෙන යම් ක්‍රියාවක් කළහොත් හෝ එකී කොන්දේසි හෝ නියමයන් උල්ලංඝනය

ගාස්තු.

(1957 අංක 62
18 වන වගන්තිය)

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

කැරෙන යම් ක්‍රියාවක් කිරීමට ආධාර හා අනුබල දුනහොත් නැතහොත් පෙළඹුවහොත් හෝ , එකී කොන්දේසි හෝ නියමයන් අනුව කටයුතු කිරීම පැහැර හැරියහොත්; 2 වන වගන්තිය)

(ආ) මේ පනත යටතේ වූ සාමූහික ගිවිසුමකින් හෝ නිරවුල් කිරීමකින් හෝ බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් නැතහොත් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් දෙන ලද ප්‍රදානයකින් හෝ බැඳී සිටින සේවායෝජකයකු වන යම් තැනැත්තකු විසින්, එකී ගිවිසුමේ නිරවුල් කිරීමේ හෝ ප්‍රදානයේ නිශ්චිත ව සඳහන් කොන්දේසි වලට වඩා අඩු වාසිදායක කොන්දේසි යටතේ යම් සේවකයකු තම සේවයේ යොදවා ගෙන සිටියහොත්;

(1957 අංක 62
20 වන වගන්තිය)

(1962 අංක 4
13 වන වගන්තිය)

(ඇ) සේවායෝජකයකු වන යම් තැනැත්තකු 10 (2) වන වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් හෝ 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නැතහොත් 50 වන වගන්තියේ විධිවිධාන කඩ කළහොත්;

(1966 අංක 27
9 වන වගන්තිය)

(ඈ) සේවකයකු වන යම් තැනැත්තකු 32 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන කඩකළහොත්;

(1968 අංක 39
2 වන වගන්තිය)

(ඉ) මේ පනත යටතේ වූ සාමූහික ගිවිසුමකින් හෝ නිරවුල් කිරීමකින් හෝ බේරුම්කරුවකු, හෝ කාර්මික අධිකරණයක් විසින් දෙන ලද ප්‍රදානයකින් හෝ බැඳී සිටින්නා වූ ද , සේවකයකු වන්නා වූ හෝ සේවකයකු නොවන තැනැත්තකු වන්නා වූ ද , යම් තැනැත්තකු විසින් , ඒ ගිවිසුමේ, නිරවුල් කිරීමේ හෝ ප්‍රදානයේ කොන්දේසි හා නියමයන් කිසිවක් වෙනස් කරලීමේ අවකාශයෙන් වැඩ වර්ජනයකට හෝ තම සේවා නියුක්තිය නැතහොත් වැඩ නතර කිරීමට හෝ යම් සේවකයකු උසිගැන්වුවහොත් හෝ පෙළඹුවහොත්;

(1966 අංක 27
9 වන වගන්තිය)

(ඊ) මේ පනත යටතේ වූ සාමූහික ගිවිසුමකින් හෝ නිරවුල් කිරීමකින් හෝ බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් නැතහොත් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් දෙන ලද ප්‍රදානයකින් හෝ බැඳී සිටින්නා වූ ද සේවකයකු වන්නා වූ ද යම් තැනැත්තකු විසින්, ඒ ගිවිසුමේ නිරවුල් කිරීමේ හෝ ප්‍රදානයේ

(1968 අංක 39
9 වන වගන්තිය)

වැරදි.

(1966 අංක 27
9 වන වගන්තිය)

(1968 අංක 39
2 වන වගන්තිය)

(1957 අංක 62
26 වන වගන්තිය)

(1966 අංක 27
9 වන වගන්තිය)

(1968 අංක 39

කොන්දේසි හා නියමයන් කිසිවක් වෙනස් කරලීමේ අධ්‍යාංශයෙන් වැඩ වර්ජනයක යෙදුනහොත් හෝ තම සේවා නියුක්තිය නැතහොත් වැඩ නතර කළහොත්;

(ඊඊ) මේ පනත යටතේ සාමූහික ගිවිසුමකින් හෝ නිරවුල් කිරීමකින් හෝ බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ විසින් දෙන ලද ප්‍රදානයකින් හෝ බැඳී සිටින්නා වූ ද සේවායෝජකයකු වන්නා වූ ද , යම් තැනැත්තකු විසින් ඒ ගිවිසුමේ නිරවුල් කිරීමේ හෝ ප්‍රදානයේ කොන්දේසි හා නියමයන් කිසිවක් වෙනස් කරලීමේ අධ්‍යාංශයෙන් සේවකයන් පිටමං කිරීමක් ආරම්භ කළහොත්;

(1957 අංක 62 20 වන වගන්තිය)

(ඊඊඊ) කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත 31 ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් ඒ විනිශ්චය අධිකාරය විසින් කරන ලද යම් ආඥාවක් වෙනස් කිරීමේ අධ්‍යාංශයෙන් යම් තැනැත්තකු වැඩ වර්ජනයක යෙදුනහොත් හෝ තම සේවා නියුක්තිය නැතහොත් වැඩ නතර කළ හොත්;

(1957 අංක 62 20 වන වගන්තිය)

(උ) පැමිණ පෙනී සිටින ලෙස 36 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අඅ) ඡේදය යටතේ යම් තැනැත්තෙකුට නියම කරනු ලැබූ විට යුක්ති සහගත හේතුවකින් තොරව එසේ පැමිණ සිටීම ඒ තැනැත්තා විසින් පැහැර හැරියහොත් හෝ පැමිණ සිටීමට ප්‍රතික්ෂේප කළහොත්, හෝ, ඒ ඡේදය යටතේ ඔහුගෙන් ප්‍රශ්න අසනු ලැබූ විට එම ප්‍රශ්න වලට පිළිතුරු දීම පැහැර හැරියහොත් හෝ පිළිතුරු දීමට ප්‍රතික්ෂේප කළහොත් හෝ; 36 වන වගන්තිය යටතේ සැපයිය යුතු වන විස්තර කිසිවක් සැපයීමට හෝ සාක්ෂි දීමට හෝ ලියකියවිලි කිසිවක් ඉදිරිපත් කිරීමට හෝ ඒ තැනැත්තාට නියම කරනු ලැබූ විට ඒ විස්තර සැපයීම හෝ සාක්ෂි දීම හෝ ලියකියවිලි ඉදිරිපත් කිරීම හෝ ඔහු විසින් පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්;

(ඌ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් , තමාගේ දැනීමට අනුව අසත්‍ය හෝ සාවද්‍ය හෝ බව තමා දන්නා යම් තොරතුරක් සැපයුවහොත් හෝ එසේ අසත්‍ය හෝ සාවද්‍ය හෝ බව තමා දන්නා යම් සාක්ෂියක් දුනහොත්;

(එ) කොමසාරිස්වරයා හෝ යම් බලයලත් නිලධරයකු හෝ බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ ඉදිරියේ මේ පනත යටතේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී , යම් තැනැත්තකු විසින් චේතනාන්විතව ම ඒ කොමසාරිස්වරයාට, ඒ නිලධරයාට, ඒ බේරුම්කරුට හෝ ඒ අධිකරණයට නැතහොත් එහි යම් සාමාජිකයෙකුට නින්දා කළහොත් හෝ බාධා කළහොත්;

(ඒ) මේ පනත යටතේ ඒ නීති කෘත්‍යයක දී යම් සේවකයකු සාක්ෂි දීමට අදහස් කර සිටි නිසා

(1957 අංක 62 20 වන වගන්තිය)

(1966 අංක 39 2 වන වගන්තිය)

(1968 අංක 39 2 වන වගන්තිය)

හෝ සාක්ෂි දීම නිසා, හෝ සේවායෝජකයකු ව සිටිමින් යම් තැනැත්තකු විසින්, එවැනි සේවකයකු සේවයෙන් පහ කළ හොත් හෝ වෙනත් කවර වුව ද ආකාරයකින් එවැනි සේවකයෙකුට දඩුවම් කළහොත්;

(1968 අංක 39
2 වන වගන්තිය)

(1966 අංක 27
9 වන වගන්තිය)

(ඹ) මේ පනත යටතේ වූ සාමූහික ගිවිසුමකින් හෝ 10 (2) වන වගන්තිය යටතේ වූ නියෝගයකින් හෝ කාර්මික අධිකරණයක් විසින් නැතහොත් බේරුම්කරුවකු විසින් කරන ලද නිරවුල් කිරීමකින් හෝ ප්‍රදානයකින් හෝ, මේ පනත යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද නියෝගයකින් හෝ ඇති වන යම් ප්‍රතිලාභයකට හිමිකම සේවකයකුට ලැබීම හේතු කොට ගෙන, ඒ සේවකයාගේ සේවය අවසන් කිරීම, ඔහු පහළ ශ්‍රේණියකට හෝ පන්තියකට හෝ පහත හෙලීම නැතහොත් වෙනත් යම් දඩුවමක් ඔහුට පැමිණ වීම, සේවායෝජකයකු වන යම් තැනැත්තකු විසින් ප්‍රමාණවත් හේතුවක් නොමැතිව කරනු ලැබුවහොත්;

(1957 අංක 62
20 වන වගන්තිය)

(1966 අංක 27
9 වන වගන්තිය)

(ඕ) යම් කාර්මික ව්‍යාපාරයක යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත හෝ බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ ඒ ආරාවුල යොමු කිරීමෙන් පසු සහ ඒ ආරාවුල සම්බන්ධයෙන් තීරණයක් දීමට පෙර, සේවායෝජකයකු වන යම් තැනැත්තකු විසින් ඒ කාර්මික ව්‍යාපාරයෙන් සේවකයන් පිටමං කිරීමක් ආරම්භ කළහොත් හෝ පවත්වා ගෙන ගියහොත් හෝ එවැනි පිටමං කිරීමකට සහභාගී වුවහොත් හෝ එවැනි පිටමං කිරීමක් වැඩිදියුණු කැරෙන යම් ක්‍රියාවක් කළහොත්;

(1968 අංක 39
2 වන වගන්තිය)

(1966 අංක 27
9 වන වගන්තිය)

(ක) යම් කාර්මික ව්‍යාපාරයක යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත හෝ බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ ඒ ආරාවුල යොමු කිරීමෙන් පසු සහ, ඒ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රදානයක් දීමට පෙර, සේවකයකු වන යම් තැනැත්තකු විසින් ඒ කාර්මික ව්‍යාපාරයේ යම් වැඩ වර්ජනයක් කළහොත් හෝ එවැනි වැඩ වර්ජනයකට සහභාගී වුවහොත් හෝ එවැනි වැඩ වර්ජනයක් වැඩිදියුණු වන යම් ක්‍රියාවක් කළහොත්;

(1966 අංක 39
2 වන වගන්තිය)

(1957 අංක 62
20 වන වගන්තිය)

(ග) යම් අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක යම් කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් 32 (2) වන වගන්තියේ විධිවිධාන කඩකරමින් යම් වැඩ වර්ජනයක් ආරම්භ කිරීමට, පවත්වා ගෙන යාමට හෝ එවැනි වැඩ වර්ජනයකට සහභාගී වීමට හෝ එවැනි වැඩ වර්ජනයක් වැඩිදියුණු කැරෙන යම් ක්‍රියාවක් කිරීමට යම් තැනැත්තකු විසින් සේවකයකු පෙළඹවුවහොත්;

(1957 අංක 62
20 වන වගන්තිය)

(1962 අංක 4
10 වන වගන්තිය)

(ච) යම් කාර්මික ව්‍යාපාරයක යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා

කාර්මික අධිකරණයක් වෙත හෝ බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ ඒ ආරාවුල යොමු කිරීමෙන් පසු හා ඒ ආරාවුල සම්බන්ධයෙන් ප්‍රදානයක් දීමට පෙර, ඒ කාර්මික ව්‍යාපාරයේ වැඩ වර්ජනයක් ආරම්භ කිරීමට හෝ පවත්වා ගෙන යාමට හෝ එවැනි වැඩ වර්ජනයකට සහභාගි වීමට හෝ එවැනි වැඩ වර්ජනයක් වැඩිදියුණු කැරෙන යම් ක්‍රියාවක් කිරීමට යම් තැනැත්තකු විසින් සේවකයකු පෙළඹූවහොත්; (1957 අංක 62 20 වන වගන්තිය) (1966 අංක 27 9 වන වගන්තිය)

(ජ) යම් කාර්මික ව්‍යාපාරයක යම් කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණයක් වෙත හෝ බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ ඒ ආරාවුල යොමු කිරීමෙන් පසු හා ඒ ආරාවුල සම්බන්ධයෙන් තීරණයක් දීමට පෙර , සේවායොජකයකු වන යම් තැනැත්තකු විසින්_ (1968 අංක 39 2 වන වගන්තිය) (1966 අංක 27 9 වන වගන්තිය)

(i) ඒ ආරාවුලට සම්බන්ධ, එයින් උද්ගත වන , එයින් සමන්විත වන හෝ ඒ ආරාවුලට ඇතුළත් වන යම් ක්‍රියාවක් නැතහොත් ආකෘතියක් කරණකොටගෙන, ඒ අධිකරණයේ හෝ බේරුම්කරුගේ හෝ ලිඛිත අනුමැතිය නොමැතිව, යම් සේවකයෙකුගේ සේවය අවසන් කළහොත් හෝ වෙනත් යම් ආකාරයකින් එවැනි යම් සේවකයෙකුට දඬුවම් පැමිණ වුවහොත් , හෝ

(ii) ඒ ආරාවුල එකී අධිකරණය වෙත හෝ බේරුම්කරු වෙත හෝ යොමු කිරීමට පූර්වාසන්නව, ඒ ආරාවුලට සම්බන්ධ යම් සේවකයකුට අදාළ සේවා කොන්දේසි, ඒ ආරාවුල සම්බන්ධ කවර කරුණක් සම්බන්ධයෙන් වුව ද, ඒ සේවකයාට හානිකර පරිදි වෙනස් කළ හොත්; (1968 අංක 39 2 වන වගන්තිය) (1966 අංක 27 9 වන වගන්තිය)

(ට) කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් තමා සම්බන්ධයෙන් කරන ලද නියෝගයකට අනුකූල ව ක්‍රියා කිරීම සේවායෝජකයකු වන යම් තැනැත්තකු විසින් පැහැර හැරිය හොත්; (1957 අංක 62 20 වන වගන්තිය)

(ඩ) සේවායෝජකයකු වන යම් තැනැත්තකු විසින් , 44 ඇ වන වගන්තියේ හෝ 44 ඈ වන වගන්තියේ හෝ විධිවිධාන උල්ලංඝණය කළහොත්; (1962 අංක 4 10 වන වගන්තිය)

(ණ) සේවායෝජකයෙක් වන යම් තැනැත්තකු විසින් 31 ඊ වන වගන්තියේ හෝ 31 උ වන වගන්තියේ හෝ 31 ඌ වන වගන්තියේ හෝ විධිවිධාන උල්ලංඝණය කළහොත්; (1962 අංක 4 10 වන වගන්තිය)

(1957 අංක 62 20 වන වගන්තිය)

(1966 අංක 27 9 වන වගන්තිය)

(ණ ණ)

(1968 අංක 89 2 වන වගන්තිය)

සේවා යෝජ කයකු

කුව සිටිමින් , 32 අ වගන්තියේ විධිවිධාන උල්ලංඝණය කරන; (1962 අංක 4 10 වන වගන්තිය)

(ත) 44 ඉ වන වගන්තියෙහි නිශ්චිත ව සඳහන් යම් නිලධරයකු වෙත එම වගන්තියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඒ නිලධරයාට යම් ස්ථානයකට ඇතුළු වීම සඳහා හෝ යම් ස්ථානයක් පරීක්ෂා කිරීම සඳහා හෝ අවශ්‍ය යයි ඔහු විසින් නියම කරනු ලබන පහසුකම් සැපයීම යම් තැනැත්තකු විසින් පැහැර හැරියහොත්; (1962 අංක 4 10 වන වගන්තිය)

(ද) 44 ඉ වන වගන්තිය යටතේ යම් නිලධරයකු වෙත පැවරී ඇති බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබීමේ දී එම නිලධරයාට යම් තැනැත්තකු අවහිර කළහොත් හෝ හිරිහැර කළහොත්;

(න) 44 ඉ වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල යටතේ, යම් ලේඛණයක් හෝ වාර්තාවක් හෝ තොරතුරක් හෝ තමා වෙත සපයන ලෙස යම් නිලධරයකු විසින් හෝ යම් තැනැත්තකුට නියම කරනු ලැබූ විට, ඒ ලේඛනය හෝ වාර්තාව හෝ තොරතුර හෝ එසේ සැපයීම ඒ තැනැත්තා විසින් යුක්ති සහගත හේතුවකින් තොරව ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියොත් (1962 අංක 4 10 වන වගන්තිය)

(ප) 44 ඉ වන වගන්තිය යටතේ යම් නිලධරයකු විසින් යම් කිසිවකුගෙන් ප්‍රශ්න කිරීමේ දී ඒ නිලධරයා විසින් අසන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් ඒ අය යම් තැනැත්තකු විසින් වළක්වාලුවහොත් හෝ එසේ වළක්වාලීමට යම් තැනැත්තකු ප්‍රයත්න දැරුව හොත්; (1962 අංක 4 10 වන වගන්තිය)

(බ) යම් තැනැත්තකු විසින් යම් වැදගත් කරුණක් අසත්‍ය ලෙස ඇතුළත් කළ යම් ලේඛනයක් හෝ වාර්තාවක් හෝ පිළියෙල කළහොත් හෝ එසේ පිළියෙළ කිරීමට සැළැස්වුවහොත් හෝ 44 ඉ වන වගන්තිය මගින් පැවරී ඇති බලතල යටතේ ක්‍රියා කරන යම් නිලධරයකු වෙත එවැනි යම් අසත්‍ය තොරතුරු ඇතුළත් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කළහොත් හෝ ඉදිරිපත් කිරීමට සැළැස්වුවහොත් හෝ දැන දැනම එවැන්නක් ඉදිරිපත් කිරීමට ඉඩහැරිය හොත්; හෝ (1962 අංක 4 10 වන වගන්තිය)

(ම) 44 ඉ වන වගන්තියෙන් පැවරී ඇති බලතල යටතේ ක්‍රියා කරන යම් නිලධරයකු වෙත යම් අසත්‍ය තොරතුරක් එය එසේ අසත්‍ය තොරතුරක් බව දැන දැනම යම් තැනැත්තකු විසින් සැපයුවහොත් ඒ තැනැත්තා මේ

පනත යටතේ වරදකරුවකු වන්නේ ය.

(2) පෙරාතුව වූ උපවගන්තියේ (ඒ) සහ (ඔ) යන ඡේද වල විධිවිධාන යටතේ පවරන ලද යම් නඩුවක දී , සේවායෝජකයකු විසින් යම් සේවකයකු පහකිරීම, යම් සේවකයකුට දඩුවම් පැමිණ වීම හෝ යම්

(1962 අංක 4 10 වන වගන්තිය)

සේවකයකු තත්ත්වයෙන් පහළ දැමීම හෝ මගින් විධිවිධාන උල්ලංඝණය වී නැතැයි ඔප්පු කිරීමේ භාරය එම සේවා යෝජකයකු මත පැවරෙන්නේ ය.

(3) මේ පනත යටතේ වූ යම් නිරවුල් කිරීමකට හෝ තීරණයකට හෝ කම්කරු විනිශ්චය අධිකාරයක ආඥාවකට හෝ 10(2) වගන්තිය යටතේ වූ නියමයකට හෝ අනුකූලව ක්‍රියා කිරීමට අදාළ යම් වරදක් සම්බන්ධයෙන් යම් සේවා යෝජකයකුට විරුද්ධ ව පවරනු ලැබූ නඩුවක දී , එකී නිරවුල් කිරීමට , තීරණයට කම්කරු විනිශ්චය අධිකාරයේ ආඥාවට හෝ 10(2) වන වගන්තිය යටතේ වූ නියමයට අනුකූල ව තමා ක්‍රියා කළ බව ඔප්පු කිරීමේ භාරය ඒ සේවායෝජකයා මත පැවරෙන්නේ ය.

බේරුම්කරුවකුගේ හෝ කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක හෝ එහි සාමාජිකයකුගේ අධිකාර බලයට අපහාස කිරීමේ නැතහොත් නිගරු කිරීමේ වරද.

(1957 අංක 62
21 වන වගන්තිය)

40 අ. (1) යම් තැනැත්තකු විසින් -

(අ) යම් බේරුම්කරුවකු, කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් මගින් පවත්වනු ලබන යම් පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබෙන අතර නැතහොත් එම පරීක්ෂණය අවසාන වීමෙන් පසු , ප්‍රමාණවත් හේතුවක් නොමැතිව ඒ බේරුම්කරු, කාර්මික අධිකරණය, කම්කරු විනිශ්චය අධිකාරය හෝ එහි යම් සාමාජිකයකු අපකීර්තියට පත් වන අන්දමේ ප්‍රකාශයක් ප්‍රසිද්ධ කළහොත් හෝ වෙන යම් ක්‍රියාවක් කළහොත්; හෝ

(ආ) එවැනි බේරුම්කරුවකුගේ, කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක නීත්‍යානුකූල කාර්ය පටිපාටියට බාධා කළහොත් ඒ තැනැත්තා ඒ බේරුම්කරුගේ කාර්මික අධිකරණයේ හෝ කම්කරු විනිශ්චය අධිකාරයේ අධිකාර බලයට අපහාස කිරීමේ නැතහොත් නිගරු කිරීමේ වරද කළ ලෙස සළකනු ලැබේ.

(2) යම් බේරුම්කරුවකුගේ, කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක අධිකාර බලයට අපහාස කිරීමේ හෝ නිගරු කිරීමේ හෝ සෑම වරදක්ම, එය අභියාචනාධිකරණයට අපහාස කිරීමේ හෝ නිගරු කිරීමේ හෝ වරදක් වූ පරිද්දේන් , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය විසින් දඩුවම් පැමිණවිය හැකි වරදක් වන්නේ ය.

(3) යම් බේරුම්කරුවකුගේ, කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක අධිකාර බලයට අපහාස කිරීමේ හෝ නිගරු කිරීමේ හෝ වරදක් පිළිබඳ සෑම චෝදනාවක් ම, ඒ බේරුම්කරු විසින්, හෝ ඒ කාර්මික අධිකරණයේ සභාපති විසින් හෝ, ඒ අධිකරණය එක් තැනැත්තකුගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් හෝ , ඒ විනිශ්චය අධිකාරයේ මුලසුන දරන තැනැත්තා විසින් හෝ , අත්සන් කරන ලද ලිපියක් මගින් අභියාචනාධිකරණයේ සභාපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ ලිපියක් අභියාචනාධිකරණයේ සභාපතිවරයා වෙත ලැබුණු කල්හි, ඒ ලිපියෙහි සඳහන් අපහාස කිරීමේ වරද කරන ලදැයි ඒ ලිපියෙහි නම් කර ඇති තැනැත්තා වෙත , අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් නයිසයි ආඥාවක් අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නිකුත් කළ හැකි ය.

(1962 අංක 4
10 වන වගන්තිය)

(5) (4) වන උපවගන්තිය යටතේ නයිසයි ආඥාවක් යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලැබූ කල්හි , ඒ

තැනැත්තා විසින් තම නිදහසට කරුණු අභියාචනාධිකරණය තෘප්තියට පත් වන පරිදි ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, ඒ තැනැත්තා දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

(6) යම් බේරුම්කරුවකුගේ හෝ කාර්මික අධිකරණයක හෝ කම්කරු විනිශ්චය අධිකාරයක හෝ අධිකාර බලයට අපහාස කිරීමේ හෝ නිගරු කිරීමේ වරද සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී , ඒ බේරුම්කරු හෝ ඒ කාර්මික අධිකරණයේ යම් සාමාජිකයෙක් හෝ ඒ කම්කරු විනිශ්චය අධිකාරයේ මුලසුන දැරූ තැනැත්තා හෝ, සාක්ෂිකරුවකු වශයෙන්, එකී මුලින් සඳහන් තැනැත්තා විසින් කැඳවනු ලැබීමට යටත් නොවන්නේ ය . එහෙත් අවශ්‍ය යයි අභියාචනාධිකරණය විසින් සළකනු ලබන අවස්ථාවක දී ඒ බේරුම්කරු හෝ ඒ කාර්මික අධිකරණයේ යම් සාමාජිකයෙකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයේ මුලසුන දැරූ තැනැත්තා හෝ අභියාචනාධිකරණය විසින් විභාග කරනු ලැබිය හැකි ය.

41. මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද අවස්ථාවක දී_

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන විට ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ සෑම නිලධරයකු ම ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස සළකනු ලැබිය යුතු ය.

(ආ) ඒ පුද්ගල මණ්ඩලය වෙළඳ සමාගමක් වන විට ඒ වෙළඳ සමාගමේ සෑම හවුල්කරුවකු ම ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස සළකනු ලැබිය යුතු ය; තව ද

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය වෘත්තිය සමිතියක් වන විට ඒ වෘත්තිය සමිතියේ සෑම නිලධරයකු ම ඒ වරද සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ඒ වරද කරන ලද්දේ තමාගේ අනුදැනීම නොමැතිව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට නිසි සියළු ප්‍රයත්න තමා විසින් දරන ලද බව හෝ එකී යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු ලෙස නොසැළකිය යුතු ය.

42. මේ පනතට විරුද්ධව කරන ලද වරදක් සම්බන්ධයෙන් (මේ වගන්තියේ මින් මතු "චූදිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට විරුද්ධ ව චෝදනා නඟා තිබෙන අවස්ථාවක දී ඒ චූදිතයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව යථා පරිදි කරනු ලබන පැමිණිල්ලක් මත සහ තම අධ්‍යාශය පිළිබඳ ව යථා පරිදි කරනු ලබන පැමිණිල්ලක් මත සහ තම අධ්‍යාශය පිළිබඳ ව යටත් පිරිසෙයින් තුන් දිනකට කලින් පැමිණිලි පක්ෂයට දැනුම් දීමෙන් පසු , එකී සංග්‍රහයේ xiv වන පරිච්ඡේදයේ, විධිවිධාන වලට යටත් ව , සැබෑ වරදකරු වශයෙන් ඔහු විසින් චෝදනා කරනු ලබන වෙනත් යම් තැනැත්තෙකු අධිකරණය ඉදිරියට පැමිණවිය හැකි ය . ඉනික්බිති ව , මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට නිසි ප්‍රයත්න තමා විසින් දරන ලද බවත් තමාගේ අනුදැනීම හෝ කැමැත්ත හෝ ගුප්තානුකූලතාව හෝ නොමැතිව ඒ අනෙක් තැනැත්තා විසින් ඒ වරද කරන ලද බවත්, ඒ වරද කරන ලද බව ඔප්පු කරනු ලැබූ පසු , ඒ චූදිතයා විසින් අධිකරණය සෑහීමට පත්වන

පුද්ගලමණ්ඩල විසින් කරනු ලබන වැරදි.

පරිදි ඔප්පු කරනු ලැබිය යුතු අතර චූදිතයා ඒ වරදින් නිදහස් කරනු ලැබිය යුතු ය.

11 වන වගන්තිය)

43. (1) (5) වන උපවගන්තියේ විධිවිධාන වලට අගතියක් නොමැතිව, 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඝඝ) ඡේදය යටතේ වූ වරදක් හැර, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කරන සෑම තැනැත්තකු ම මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී, රුපියල් පන්දහසක් නොඉක්මවන කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(1957 අංක 62, 22 වන වගන්තිය)

(1968 අංක 9, 2 වන වගන්තිය)

(1966 අංක 27, 10 වන වගන්තිය)

(1 අ.) 40 (1) (ඝඝ) වගන්තිය යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තකුටම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් සේවකයකු යම් සේවයක යළි පිහිටුවන ලෙස නියම කරමින් යම් කාර්මික අධිකරණයක් හෝ බේරුම්කරුවකු හෝ විසින් දෙන ලද ප්‍රදානයක නැතහොත් එසේ යළි සේවයේ පිහිටුවන ලෙස නියම කරමින් යම් කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවක ඇතුළත් කොන්දේසි වලට හෝ නියමයන්ට හෝ අනුකූල ව ක්‍රියා කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී,_

(i) ඒ සේවායෝජකයා වෙත (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඩුවමකට අමතර ව , එසේ පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ සේවා යෝජකයා වරදකරු කරනු ලැබූ පසු එම පැහැර හැරීම තවදුරටත් කරගෙන යන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් පන්සියයක දඩයක් ගෙවීමට ඒ සේවායෝජකයා යටත් වන්නේ ය; තව ද

(ii) එවැනි එක් එක් දිනයේ දී ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම් ඔහුට ගෙවිය යුතු ව තිබුණ පාරිශ්‍රමිකය ද, ඒ ප්‍රදානයේ නැතහොත් නියෝගයේ කොන්දේසි වලට අනුව ඒ සේවකයා යළි සේවයේ පිහිටුවිය යුතු ව තිබුණු දින සිට ඒ සේවායෝජකයා යට කී පැහැර හැරීම සම්බන්ධයෙන්න් වරදකරු

වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින යම් තැනැත්තෙකුට හිමි වන විශේෂ විත්ති වාචක.

වැරදි සඳහා දඬුවම්.

(1957 අංක 62, 22 වන වගන්තිය)

(1962 අංක 4,

කරනු ලැබූ දින තෙක් වූ කාලසීමාවේ දී ඒ සේවකයාගේ සේවය අවසන් නොකර තිබුණේ නම් ඔහුට හිමිවන්නට තිබුණු වැටුප් හෝ පඩි අනුප්‍රමාණය අනුව ගණන් බලන ලද පාරිශ්‍රමිකයින් ඒ කාලසීමාවේ එක් එක් දිනය වෙනුවෙන් ද ඒ සේවකයාට ගෙවීමට ඒ සේවායෝජකයා යටත් වන්නේ ය.

මේ උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ ගෙවීමට යම් සේවා යෝජකයකු යටත් වන යම් මුදලක්, ඔහු වරදකරු කළ අධිකරණයේ ආඥාව මත, ඒ අධිකරණය විසින් ඒ සේවායෝජකයා වෙත පනවනු ලැබූ දඩයක් පරිද්දෙන් අය කර ගනු ලැබිය හැකි අතර , එසේ අය කර ගනු ලැබූ මුදල ඒ සේවකයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) මනා හේතුවක් නොමැතිව යම් සේවකයකු සේවය අවසන් කිරීමෙන් හෝ යම් සේවකයකු පහළ ශ්‍රේණියකට නැතහොත් පහළ පන්තියකට පහත දැමීමෙන් හෝ 40(1) (ඔ) වගන්තිය යටතේ කරන ලද වරදක් සම්බන්ධයෙන් යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විට,_

(අ) ඒ සේවායෝජකයා වෙත (i) වන උපවගන්තිය යටතේ පනවනු ලබන යම් දඬුවමකට අමතරව,_

(i) ඒ සේවකයාගේ සේවය අවසන් කරන ලද්දේ මනා හේතුවක් නොමැතිව නම් ඒ සේවකයා ඔහුගේ සේවයේ යළි පිහිටුවන ලෙස හෝ

(ii) ඒ සේවකයා පහළ ශ්‍රේණියකට නැතහොත් පහළ පන්තියකට පහත දමා ඇති විටක, ඒ සේවකයා ඔහුගේ නියම ශ්‍රේණියේ හෝ පන්තියේ හෝ පිහිටුවන ලෙස, හෝ

(iii) ඒ සේවකයාට වෙනත් අන්දමක දඬුවමක් දී තිබුණු විටක අවශ්‍ය යයි අධිකරණය විසින් සළකනු ලබන සහනයක් ඔහුට සළස්වන ලෙස

අධිකරණය විසින් ඒ සේවායෝජකයාට ආඥා කළ යුතු ය . තව ද සේවා යෝජකයා එවැනි ආඥාවක් පිළිපැදීම පැහැර හැරිය හොත්, වරද සම්බන්ධයෙන් ඒ සේවා යෝජකයා වරදකරු කරනු ලැබීමෙන් පසු තව දුරටත් ඒ පැහැර හැරීම කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක දඩයක් ගෙවීමට ද ඒ සේවායෝජකයා යටත් වන්නේ ය; තව ද

(ආ) ඒ සේවා යෝජකයා විසින්_

(1962 අංක 4,
11 වන වගන්තිය)

(1962 අංක 4,
11 වන වගන්තිය)

(i) මනා හේතුවක් නොමැති ව ඒ සේවකයාගේ සේවය අවසන් කර තිබුණ හොත්, ඒ සේවකයාගේ සේවය අවසන් නොකරන ලද නම් ඔහුට හිමි විය යුතු ව තිබුණු වැටුප් හෝ පඩි අනු ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ ද එසේ ඔහුගේ සේවය අවසන් කරන ලද දිනෙන් පටන් ගෙන ඔහු යළි සේවයේ පිහිටුවන ලද දිනෙන් පටන්ගෙන ඔහු යළි සේවයේ පිහිටුවන දිනයේ දී ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම් ඔහුට ගෙවිය යුතු වන්නා වූ ද පාරිශ්‍රමිකයන් ඔහුට ගෙවීමට ඒ සේවා යෝජකයා යටත් වන්නේ ය . නැතහොත්,

(ii) ඒ සේවකයා පහළ ශ්‍රේණියකට හෝ පහළ පන්තියකට පහත හෙළා තිබුණහොත්, ඔහු එසේ පහත හෙළා නොතිබුණේ නම් ඔහුට ගෙවිය යුතු ව තිබුණ පාරිශ්‍රමිකය හා ඇත්ත වශයෙන් ම

ඔහුට ගෙවන ලද මුදල් ප්‍රමාණය ද අතර වෙනස නිරූපණය කෙරෙන මුදල් ප්‍රමාණය ඒ සේවකයාට ගෙවීමට ඒ සේවායෝජකයා යටත් වන්නේ ය.

(1962 අංක 4, 11 වන වගන්තිය)

මේ උප වගන්තියේ (ආ) ඡේදය යටතේ සේවා යෝජකයකු විසින් ගෙවීමට යටත් වන යම් මුදල් ප්‍රමාණයක්, ඒ සේවායෝජකයා වරදකරු කළ අධිකරණය විසින් පනවන ලද දඩයක් අය කර ගන්නා පරිද්දෙන් අය කර ගැනීමට ඒ අධිකරණය විසින් ආඥා කල හැකි අතර , එසේ අය කර ගනු ලැබූ මුදල ඒ සේවකයාට ගෙවනු ලැබිය යුතු ය.

(1957 අංක 62, 22 වන වගන්තිය)

(4) යම් සේවා යෝජකයකු විසින් සේවකයකුට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයකට හෝ ඒ සේවකයාට හිමි යම් ප්‍රතිලාභයක් ඔහුට ප්‍රදානය කිරීමට හෝ අදාළ, මේ පනත යටතේ වූ යම් නිරවුල් කිරීමක, ප්‍රදානයක හෝ සාමූහික ගිවිසුමක නැතහොත් කම්කරු විනිශ්චය අධිකාරයක යම් නියෝගයක නැතහොත් 10 (2) වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක ඇතුළත් වූ යම් කොන්දේසියකට හෝ නියමයකට හෝ අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් සේවායෝජකයකු යම් අධිකරණයක් විසින් වරදකරු කරන ලද අවස්ථාවක දී, ඒ අධිකරණය විසින් ඒ සේවායෝජකයා වෙත පැනවිය හැකි වෙනත් යම් දණ්ඩණයකට අමතරව, ඒ අධිකරණයේ නියෝගයේ නිශ්චිත ව සඳහන් කාලය තුළ දී , ඒ මුදල් ප්‍රමාණය ගෙවීමට හෝ ඒ ප්‍රතිලාභය මුදලින් ගණන් බැලීමට හැකි නම් ඒ ප්‍රතිලාභයේ වටිනාකම ලෙස ඒ අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් (අධිකරණය විසින් කරනු ලබන නිශ්චය අවසානාත්මක වන්නේ ය .) ගෙවීමට හෝ ඒ සේවායෝජකයාට නියම කළ හැකි ය . ඒ මුදල් ප්‍රමාණය හෝ එසේ නිශ්චය කරන ලද මුදල් ප්‍රමාණය හෝ එසේ ගෙවනු නොලැබුවහොත්, එය ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක් අය කර ගනු ලබන ආකාරයෙන් ඒ අධිකරණයේ ආඥාවක් මගින් අයකර ගනු ලැබිය හැකි ය.

(5) බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ ඉදිරියේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී ඒ බේරුම්කරුට හෝ කාර්මික අධිකරණයට හෝ කම්කරු

විනිශ්චය අධිකාරයට හෝ එහි යම් සාමාජිකයෙකුට හෝ යම් තැනැත්තෙකුට අපහාස කළ හොත් නැතහොත් යම් බාධාවක් ඇති කිරීමට සැළැස්වුව හොත්, (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තාට විරුද්ධව නඩු විභාග කොට ඔහුට දඬුවම් පැමිණවීමට හෝ ඒ බේරුම්කරු, කාර්මික අධිකරණයක නැතහොත් කම්කරු විනිශ්චය අධිකාරය විසින් ඒ තැනැත්තාට විරුද්ධව නඩු විභාගකොට ඔහුට දඬුවම් පැමිණවීමට හැකි අතර , බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ විසින් ඒ තැනැත්තාට විරුද්ධව නඩු විභාග කොට ඔහු වරදකරු කරනු ලැබූ විටක , ඒ හා සමාන අවස්ථාවක දී අපරාධ නඩු විධාන සංග්‍රහයේ 388 වන වගන්තිය යටතේ දිසා අධිකරණයක් විසින්

(1957 අංක 62, 22 වන වගන්තිය)

ක්‍රියාත්මක කරනු ලබන බලතල හා කාර්ය ඒ බේරුම්කරු හෝ ඒ කාර්මික අධිකරණය හෝ ඒ කම්කරු විනිශ්චය අධිකාරය හෝ සතු වන්නේ ය.

43 (අ) (1) සේවායෝජකයකු විසින් යම් සේවකයකුට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයක් ඒ සේවකයාට ගෙවීම හා සම්බන්ධව නැතහොත් යම් සේවකයෙකුට හිමි යම් ප්‍රතිලාභයක් ඒ සේවකයාට ප්‍රදානය කිරීම හා සම්බන්ධව මේ පනත යටතේ වූ යම් නිරවුල් කිරීමක හෝ තීරණයක හෝ ඇතුළත් යම් කොන්දේසියක් නැතහොත් නියමයක් හෝ , කම්කරු විනිශ්චය අධිකාරයක නියෝගයක් හෝ නියමයක්, 10 (2) වන වගන්තිය යටතේ කරන ලද නියමයක්, හෝ අනුව ක්‍රියා කිරීම , ඒ සේවා යෝජකයා විසින් පැහැර හරිනු ලැබීම සම්බන්ධයෙන් ඔහු වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නිරවුල් කිරීම හෝ තීරණය හෝ කම්කරු විනිශ්චය අධිකාරයේ නියෝගය හෝ 10 (2) වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමය හෝ යටතේ වෙනත් යම් සේවකයෙකුට නැතහොත් සේවකයන්ට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමට හෝ ප්‍රදානය කළයුතු යම් ප්‍රතිලාභයක් ප්‍රදානය කිරීම හෝ ඒ සේවායෝජකයා පැහැර හැර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමේ අධ්‍යාශය පිළිබඳ දැන්වීමක් නියමිත ආකෘතිය අනුව පිළියෙළ කර ඒ නඩු විභාගය ආරම්භ කිරීමට ප්‍රථම කවර වේලාවක හෝ ඒ සේවායෝජකයාට භාර දී තිබුණේ නම්, ඒ සේවායෝජකයාට විරුද්ධව, එසේ පැහැර හැරීමක් පිළිබඳ ව සාක්ෂි ඉදිරිපත් කළ හැකි ය . එවැනි පැහැර හැරීමක් පිළිබඳ ව සාක්ෂි ඉදිරිපත් කළ හැකි ය . එවැනි පැහැර හැරීමක් ඔප්පු කරනු ලැබූ විට , ඒ මුදල් ප්‍රමාණය ඒ වෙනත් සේවකයාට නැතහොත් සේවකයින්ට ගෙවීමට හෝ එකී ප්‍රතිලාභය මුදලින් ගණන් බැලිය හැකි නම් ඒ ප්‍රතිලාභයේ වටිනාකම වශයෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් (අධිකරණය විසින් කරනු ලබන නිශ්චය අවසානාත්මක වේ .) ඒ වෙනත් සේවකයාට නැතහොත් සේවකයන්ට ගෙවීමට හෝ අධිකරණය විසින් ඒ සේවකයාට නියම කළ හැකිය. මේ උපවගන්තිය යටතේ ගෙවීමට නියම කරන ලද යම් මුදල් ප්‍රමාණයක්, දඩයක් අය කර ගනු ලබන ආකාරයෙන් අය කර ගනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට අධිකරණය සතු බලය හේතු කොට ගෙන, ඒ මුදල් ප්‍රමාණය හෝ ඒ ප්‍රතිලාභය මුදලින් ගණන් බැලිය හැකි නම් ඒ ප්‍රතිලාභයේ වටිනාකම හෝ වෙනත් යම් නීති කෘත්‍යයක මාර්ගයෙන් අය කර ගැනීමට ඒ සේවකයා නැතහොත් සේවකයන් සතු අයිතිවාසිකමක බලහීන කිරීමක් සිදු නොවන්නේ ය.

(3) මේ පනත යටතේ වූ නිරවුල් කිරීමක නැතහොත් තීන්දුවක ඇතුළත් යම් කොන්දේසියකට හෝ නියමයකට හෝ කම්කරු විනිශ්චය අධිකාරයක නියෝගයකට හෝ, 10 (2) වන වගන්තිය යටතේ වූ නියමයකට හෝ අනුකූලව, යම් සේවායෝජකයකුගෙන් යම් සේවකයකුට ලැබිය යුතු යම් මුදලක් හෝ ප්‍රතිලාභයක් හෝ ඒ සේවකයාට නොගෙවා නැතහොත් ලබා නොදී ඇති අවස්ථාවක දී , සුදුසු යයි කොමසාරිස්වරයා අදහස් කරන්නේ නම් , ඒ මුදල් ප්‍රමාණය හෝ ඒ ප්‍රතිලාභය මුදලින් ගණන් බැලිය හැකි නම් ඒ ප්‍රතිලාභයේ වටිනාකම හැටියට කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන (කොමසාරිස්වරයා විසින් කරනු ලබන ඒ නිශ්චය අවසානාත්මක වන්නේ ය .) මුදල් ප්‍රමාණයක් හෝ , කොමසාරිස්වරයා විසින් ඒ සේවකයා වෙත යවනු ලැබීම පිණිස, දැන්වීමේ සඳහන් කර

(1962 අංක 4,
11 වන වගන්තිය)

ඇතැම් අවස්ථාවලදී සේවකයින්ට ලැබිය යුතු මුදල් ප්‍රමාණ අය කර දීම.
(1962 අංක 4,
12 වන වගන්තිය)

ඇති නිශ්චිත කාලයක් තුළ දී තමා වෙත ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් මඟින් ඒ සේවායෝජකයාට නියම කළ හැකි ය . ඒ සේවා යෝජකයා වෙත එවැනි දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසු ඒ මුදල් ප්‍රමාණය හෝ කොමසාරිස්වරයාගේ දැන්වීමේ නියම කර ඇති පරිදි කොමසාරිස්වරයා වෙත ගෙවනු වෙනුවට කෙළින්ම ඒ සේවකයාට සේවායෝජකයා විසින් ගෙවනු ලැබුවහොත්, ඒ මුදල හෝ යට කී පරිදි නිශ්චය කරන ලද මුදල් ප්‍රමාණය හෝ ඒ සේවා යෝජකයා විසින් ඒ සේවකයාට ගෙවනු ලැබී යයි නොසැළකිය යුතු ය.

(1957 අංක 62, 23 වන වගන්තිය)

43 ආ. යම් සේවකයකුගේ ආසන්නතම සේවායෝජකයා වෙනත් තැනැත්තකු යටතේ සේවය කරන්නකු වන්නා වූ ද , ඒ සේවකයා සේවයේ යොදවා ඇත්තේ එකී වෙනත් තැනැත්තාගේ කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමේ දී නැතහොත් එවැන්නක කාර්යය සඳහා වූ යම් වැඩක් කිරීම උදෙසා වන්නා වූ ද අවස්ථාවක දී, 40 වන වගන්තියේ (1) වන උප වගන්තියේ කාර්යය සඳහා , ඒ වෙනත් තැනැත්තා ඒ සේවකයාගේ ආසන්නතම සේවායෝජකයා ද සමඟ හවුලේ ඒ සේවකයාගේ සේවායෝජකයා වන්නාක් සේ සැළකිය යුතු ය.

ආසන්නත ම සේවායෝජකයා වෙනත් තැනැත්තකු යටතේ සේවය කරන්නකු වන විට

(1962 අංක 4, 12 වන වගන්තිය)

44. මේ පනත යටතේ වූ වරදක් සඳහා වූ නඩු පැවරීමක් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය පරිදි හෝ එකී ලිඛිත අනුමැතිය ඇතිව හැර නොකළ යුතු ය.

කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව නඩු පැවරිය නොහැකි බව.

44 අ. සාමූහික ගිවිසුමක් ඇතුළත් වන්නා වූ ද , රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරන ලදැයි සළකනු ලබන්නා වූ ද , ගැසට් පත්‍රයේ ප්‍රධාන උද්‍ධෘතයක් හෝ එවැනි ගිවිසුමක සත්‍ය පිටපතක් බවට කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද්දක් යයි සළකනු ලබන්නා වූ පිටපතක් හෝ සාමූහික ගිවිසුමක් ඔප්පු කිරීමේ සාක්ෂි වශයෙන් කවර අධිකරණයක් වෙත වුව ද ඉදිරිපත් කළ හැකිය.

සාමූහික ගිවිසුම්, නිරවුල් කිරීම් සහ තීන්දු ප්‍රදාන පිළිබඳ ඔප්පු කිරීම.

(2) කාර්මික ආරාවුලක් නිරවුල් කිරීමේ සටහනක් ඇතුළත් වන්නා වූ ද, රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරන ලද්දක් යැයි සළකනු ලබන්නා වූ ද , ගැසට් පත්‍රයේ උද්‍ධෘතයක් හෝ එවැනි සටහනක සත්‍ය පිටපතක් බවට කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද්දක් යයි සළකනු ලබන්නා වූ පිටපතක් හෝ ඒ සටහන ඔප්පු කිරීමේ සාක්ෂි වශයෙන් කවර අධිකරණයක් වෙත වුව ද ඉදිරිපත් කළ හැකිය.

(3) මේ පනත යටතේ දෙන ලද ප්‍රදානයක් ඇතුළත් වන්නා වූ රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරන ලද්දක් යැයි සළකනු ලබන්නා වූ ද , ගැසට් පත්‍රයේ උද්‍ධෘතයක් හෝ එවැනි ප්‍රදානයක සත්‍ය පිටපතක් බවට කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද්දක් යයි සළකනු ලබන්නා වූ පිටපතක් හෝ ඒ ප්‍රදානය ඔප්පු කිරීමේ සාක්ෂි වශයෙන් කවර අධිකරණයක් වෙත වුව ද ඉදිරිපත් කළ හැකිය.

44 ආ. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුණ ද_

(අ) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගෙන් හෝ යම් සේවකයකුට ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක් අය කර ගැනීම සඳහා වූ නඩුවක්, කොමසාරිස්වරයාගේ නමින් හෝ ඒ සේවකයා සාමාජිකයකු වන යම්

වෘත්තිය සමිතියක නමින් හෝ , අධිකරණය බලය ඇති අධිකරණයක පැවරිය හැකි ය.

(ආ) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගෙන් සේවකයන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි සේවකයින් සංඛ්‍යාවකට හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණ එකම නඩුවකින් අයකර ගැනීම සඳහා වූ නඩුවක් කොමසාරිස්වරයාගේ නමින් හෝ ඒ සේවකයන් සාමාජිකයන් වන යම් වෘත්තිය සමිතියක නමින් හෝ පැවරිය හැකි ය.

(ඇ) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගෙන් යම් සේවකයකුට ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් අය කර ගැනීම සඳහා වූ නඩුවක්, ඒ මුදල ඒ සේවකයාට ලැබිය යුතු දිනයෙන් පසු එළඹෙන දෙවර්ෂය තුළ දී පවරන ලද නම් , එවැනි නඩුවක් පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(ඈ) කොමසාරිස්වරයාගේ නමින් පවරන ලද එවැනි යම් නඩුවක දී , යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු හෝ කම්කරු නිලධරයකු හෝ විසින් කොමසාරිස්වරයා නියෝජනය කරනු ලැබිය හැකි ය.

(ඉ) වෘත්තිය සමිතියක නමින් පවරන ලද එවැනි යම් නඩුවක දී , ඒ සමිතියේ කවර හෝ නිලධරයකු විසින් ඒ වෘත්තිය සමිතිය නියෝජනය කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා ‘‘මුදල් ප්‍රමාණය’’ යන්නට මේ පනත යටතේ යම් සේවායෝජකයකුගෙන් හෝ සේවකයකුට ලැබිය යුතු යම් ප්‍රතිලාභයක් මුදලින් ගණන් බැලිය හැකි අවස්ථාවක දී, ඒ ප්‍රතිලාභයේ වටිනාකම අය කර ගැනීමට නඩු පවරා ඇත්තේ යම් අධිකරණයක ද ඒ අධිකරණය විසින් ඒ ප්‍රතිලාභයේ වටිනාකම වශයෙන් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණය ඇතුළත් වේ.

44 ඇ. සෑම සේවායෝජකයකු විසින් ම පවත්වා ගෙන යා යුතු යයි පඩි පාලක සභා ආඥා පනත, සූතිකාගාර ආඥාපනත, සාප්පු හා කාර්යාල සේවක (සේවය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනත හෝ සේවක නිවාඩු පනත යටතේ නියම කර ඇති ලේඛන හෝ වාර්තා හෝ, පවත්වා ගෙන යා යුතු යයි නියම කරනු ලබන වෙනත් ලේඛන හෝ වාර්තා හෝ කිසිවක් කොමසාරිස්වරයා විසින් හෝ යම් කම්කරු නිලධරයකු විසින් හෝ වෙනත් යම් නිලධාරයකු විසින් හෝ පරීක්ෂා කර බැලීම සඳහා ලබා දීම සෑම සේවායෝජකයකු ම විසින් කළ යුතු ය.

44 ඇ. (1) පඩි පාලක සභා ආඥාපනත සූතිකාගාර ආඥාපනත, සාප්පු හා කාර්යාල සේවක (සේවය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ ) පනත හෝ සේවක නිවාඩු පනත ප්‍රකාර යම් ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වා ගෙන යා යුතු යයි සේවායෝජකයකුට නියම ව ඇති අවස්ථාවක දී , ඔහුගේ සේවයේ නියුක්ත යම් නියමිත පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් සේවකයින් සම්බන්ධයෙන් නියමව ඇති අවස්ථාවක දී , ඔහුගේ සේවයේ නියුක්ත යම් නියමිත පන්තියකට හෝ වර්ගයකට හෝ අයත් සේවකයින් සම්බන්ධයෙන් නියම කරනු ලබන විස්තර කිසිවක් ඒ ලේඛනයේ හෝ වාර්තාවේ

සේවකයකුට ලැබිය යුතු මුදල් අය කර ගැනීමට කොමසාරිස්වරයාට හෝ වෘත්තිය සමිතියකට හෝ ඇති බලය

(1962 අංක 4,
13 වන වගන්තිය)

හෝ ඇතුළත් කළ යුතු යයි මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් නියම කරනු ලැබුවහොත් ඒ සේවායෝජකයා විසින් එම විස්තර එකී ලේඛනයේ හෝ වාර්තාවේ හෝ ඇතුළත් කළ යුතු ය.

(2) නියමිත විස්තර කිසිවක් (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ලේඛනයක හෝ වාර්තාවක හෝ ඇතුළත් කළ යුතු යයි මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් නියම කර ඇති අවස්ථාවක දී, ඒ ලේඛණය හෝ වාර්තාව, මේ පනතේ කාර්යය සඳහා, මේ පනත යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයක් හෝ වාර්තාවක් ලෙස හෝ සළකනු ලැබිය යුතු ය.

13 වන වගන්තිය)

44 ඉ. නියම කරනු ලැබිය හැකි කොන්දේසි වලට හා සීමා කිරීම් වලට යටත්ව, පහත සඳහන් කරුණු සඳහා බලය, එනම්_

(අ) මේ පනත යටතේ පවත්වා ගෙන යනු ලබන හෝ එසේ පවත්වාගෙන යනු ලබන්නේ යයි සළකනු ලබන යම් ලේඛනයක් නැතහොත් වාර්තාවක් හෝ, පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි විය යුතු යයි මේ පනතින් නියමිත වෙනත් ලේඛන නැතහොත් වාර්තා හෝ පරික්ෂා කර බැලීමේ කාර්යය සඳහා, සේවකයන් සේවයේ නියුක්ත කර ඇති යම් ස්ථානයකට, දවල් කාලයේ හෝ රාත්‍රී කාලයේ හෝ යුක්ති සහගත කවර වෙලාවක දී වුව ද ඇතුළු වීමේ සහ පරීක්ෂා කිරීමේ;

(ආ) එසේ පරීක්ෂා කරන අවස්ථාවක දී එවැනි යම් ලේඛනයක් හෝ වාර්තාවක් හෝ පරීක්ෂා කර බැලීම සඳහා ලබා ගත නොහැකි වූ විටක, තමා විසින් නිශ්චය කරනු ලබන දිනයක දී සහ එසේ නිශ්චය කරනු ලබන දිනයක දී සහ එසේ නිශ්චය කරනු ලබන ස්ථානයක දී ඒ ලේඛනය හෝ වාර්තාව ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ;

(ඇ) එවැනි යම් ලේඛනයක් හෝ වාර්තාවක් හෝ සම්පූර්ණයෙන් ම නැතහොත් ඉන් කොටසක් පිටපත් කරගැනීමේ; හෝ

(ඈ) සේවකයන් සේවයේ නියුක්ත කර සිටින ස්ථානයක දී තමාට හමුවන්නා වූ ද ඒ ස්ථානයේ කර ගෙන යනු ලබන කර්මාන්තයේ, වෙළඳ ව්‍යාපාරයේ, ව්‍යාපෘතියේ හෝ ව්‍යාපාරයේ යෙදී සිටින හෝ සේවයේ නියුක්ත කර සිටින සේවායෝජකයකු හෝ සේවකයකු බව විශ්වාස කිරීමට තමාට යුක්ති සහගත හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ

බලය කොමසාරිස්වරයාට හෝ යම් කම්කරු නිලධරයකුට හෝ නියමිත නිලධරයකුට හෝ ඇත්තේ ය.

කොමසාරිස්වරයා හෝ කම්කරු නිලධරයකු හෝ වෙනත් යම් නියමිත නිලධරයකු හෝ විසින් පරීක්ෂා කර බලනු සඳහා සේවායෝජකයන් විසින් ලේඛන හෝ වාර්තා ඉදිරිපත් කලයුතු බව.

(1962 අංක 4,
13 වන වගන්තිය)

වෙනත් යම් 1 ලිඛිත නීතියක් යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයක් හෝ වාර්තාවක නියමිත විස්තර ඇතුළත් කිරීම

(1962 අංක 4,
13 වන වගන්තිය)

ඇතුළු වීම, පරීක්ෂා කිරීම ආදාය සඳහා වූ බලතල

(1962 අංක 4,

45. මේ පනතේ කාර්යය සඳහා පත් කරන ලද තැනැත්තන්ට කරනු ලබන ගෙවීම් ඇතුළු ව, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා දරන වියදම් , පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් වලින් වැය කරනු ලැබිය යුතු ය.

(1957 අංක 62, 24 වන වගන්තිය)

46. (1) යම් බලයලත් නිලධරයකු හෝ බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ කොමසාරිස්වරයා විසින් හෝ නැතහොත් ඉදිරියේ මේ පනත යටතේ පැවැත්වෙන නීති කෘත්‍යයක පාර්ශවයන් විසින් තමාගේ නියෝජිතයන් මගින් ක්‍රියා කළ හැකි ය ; තව ද නියෝජිතයන් මගින් ක්‍රියා කරන ලෙස එකී නිලධාරියා හෝ බේරුම්කරු හෝ , අධිකරණය හෝ විනිශ්චය අධිකාරය හෝ කොමසාරිස්වරයා හෝ විසින්, නියම කරනු ලැබුවහොත් ඒ පාර්ශවය විසින් එසේ කළ යුතු ය.

(1957 අංක 62, 24 වන වගන්තිය)

(2) කොමසාරිස්වරයා ඉදිරියේ හෝ බලයලත් නිලධරයකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍යයක් හැර මේ පනත යටතේ වූ වෙනත් යම් නීති කෘත්‍යයක දී ඒ නීති කෘත්‍යයේ යම් පාර්ශවයක් වෙනුවෙන් හෝ ඒ පාර්ශවයේ නියෝජිතයා වෙනුවෙන් හෝ නීතිඥවරයකුට පෙනී සිටිය හැකි ය.

(1957 අංක 62, 24 වන වගන්තිය)

(3) මේ පනතේ කාර්යය සඳහා පාර්ශවයක් නියෝජනය කරන තැනැත්තා හෝ තැනැත්තන්_

(අ) ඒ පාර්ශවය වෘත්තීය සමිතියක් වන අවස්ථාවක දී නැතහොත් වෘත්තීය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත වන අවස්ථාවක දී ඒ සමිතියේ නැතහොත් එක් එක් සමිතියේ නිලධරයෙක් වන්නේ ය.

(ආ) ඒ පාර්ශවය යම් වෘත්තීය සමිතියකින් හෝ සමිති වලින් ද ඒ සමිතියක සාමාජිකයන් නොවන සේවායෝජකයන්ගෙන් හෝ සේවකයින්ගෙන් ද , සමන්විත වන අවස්ථාවක දී , ඒ සමිතියේ නිලධරයෙක් නැතහොත් ඒ එක් එක් සමිතියේ නිලධරයෙක් සහ එකී සේවායෝජකයන් හෝ සේවකයන් හෝ විසින් නියෝග වලට අනුකූලව නම් කරනු ලැබූ තැනැත්තන් නියමිත සංඛ්‍යාවක් වන්නේ ය.

(ඇ) ඒ පාර්ශවය සේවායෝජකයන්ගෙන් හෝ සේවකයන්ගෙන් හෝ සමන්විත වන අවස්ථාවක දී, ඒ සේවායෝජකයන් හෝ සේවකයන් හෝ විසින් නම් කරනු ලැබූ තැනැත්තන් නියමිත සංඛ්‍යාවක් වන්නේ ය.

(4) මේ පනත යටතේ බේරුම්කරුවකු හෝ

වියදම්

නියෝජනය කිරීම සහ පෙනී සිටීම.

(1957 අංක 62, 24 වන වගන්තිය)

(1957 අංක 62, 24 වන වගන්තිය)

කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ ඉදිරියේ වූ නීති කෘත්‍යයකට පැමිණී සිටීමට සහ කරුණු කියාපෑමට කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකුට හෝ හිමිකම ඇත්තේ ය.

(5) වෘත්තීය සමිතියක් මේ පනත යටතේ වූ නීති කෘත්‍යයට පාර්ශවයක් වන්නා වූ ද ඒ නීති කෘත්‍යවල දී කරන යම් ප්‍රකාශයකින් හෝ ක්‍රියාවකින් හෝ ඒ සමිතිය බැඳී සිටින්නේ ය.

මේ පනත යටතේ වූ අයිතිවාසිකම් හෝ වගකීම් හෝ මේ පනත යටතේ කරන තීරණ හෝ ගිවිසුම් වලට යටත් නොවන

47. මේ පනත ප්‍රකාර හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් ප්‍රකාර හෝ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කිරීමට අදහස් කරන ලද යමක් හේතු කොට ගෙන ඒ තැනැත්තාය විරුද්ධව සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් යම් නීති කෘත්‍යයක් හෝ පැවරිය නොහැක්කේ ය.

47 අ. මෙම පනතින් නැතහොත් මෙම පනත යටතේ යම් කිසි සේවකයෙකුට ඇති අයිතිවාසිකමක් කෙරෙහි හෝ බේරුම්කරුවකු විසින් කාර්මික අධිකරණයක් විසින් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් මේ පනත යටතේ කරන ලද තීරණයකින් යම් කිසි සේවකයකුට ඇති අයිතිවාසිකමක් කෙරෙහි හෝ යම් ආකාරයකින් බලපාන නැතහොත් එවැනි අයිතිවාසිකමක් ඔහුගේ අවාසියට යම් ආකාරයකින් වෙනස් කරන හෝ , මේ පනතින් හෝ මෙම පනත යටතේ හෝ ඉහත කී යම් තීරණයකින් හෝ යම් සේවායෝජකයකු වෙත පැවරී තිබෙන වගකීමක් ඉවත් කරන නැතහොත් අඩු කරන යම් ගිවිසුමක් හෝ එකඟවීමක්, එවැනි අයිතිවාසිකමක් කෙරෙහි බලපාන තාක් දුරට නැතහොත් එවැනි අයිතිවාසිකමක් වෙනස් කරන තාක් දුරට හෝ එවැනි යම් වගකීමක් ඉවත් කරන නැතහොත් අඩු කරන තාක් දුරට , ශුන්‍ය හා බල රහිත වන්නේ ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.
(1957 අංක 62,
25 වන වගන්තිය)

සේවායෝජකවන්ගේ සේවායෝජකත්වය නතර වී ඇති කාර්මික ආරවුල් වලට අදාළ විධිවිධාන

47 ආ. 5 වන වගන්තියේ සඳහන් සියළු සාමූහික ගිවිසුම් සහ මේ පනත යටතේ කරන ලද හෝ නිකුත් කරන ලද හෝ සියළු තීරණ සහ ලේඛන මුද්දර ගාස්තුවෙන් නිදහස් වන්නේ ය.

47 ඇ. යම් කාර්මික ආරාවුලක දී ඊට සම්බන්ධ සේවායෝජකයකු වන යම් තැනැත්තකුගේ එකී සේවායෝජකත්වය අවසන් වී තිබුණේ වුව ද ඒ නොතකා,_

(අ) ඒ ආරවුල නිරවුල් කිරීම සඳහා එය කාර්මික අධිකරණයක් වෙත හෝ, බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ, යොමු කළ හැකි අතර, ඒ යොමු කිරීම සම්බන්ධයෙන් න් වූ නීති කෘත්‍ය ඒ

(1957 අංක 62,
24 වන වගන්තිය)

(1957 අංක 62,
24 වන වගන්තිය)

(1957 අංක 62,
24 වන වගන්තිය)
මේ පනත යටතේ වූ ක්‍රියා සඳහා අආරක්ෂාව.

(1956 අංක 25,
8 වන වගන්තිය)

අධිකරණය හෝ ඒ බේරුම්කරු හෝ විසින් කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ ආරවුල නිරවුල් කිරීම සඳහා එසේ යොමු කරන ලද්දේ ඒ තැනැත්තා එකී සේවායෝජකයාව සිටිය දී නම් , ඒ යොමු කිරීම කරනු ලැබූ කාර්මික අධිකරණය හෝ බේරුම්කරු හෝ විසින්, ඒ යොමු කිරීම පිළිබඳ නීති කෘත්‍ය ආරම්භ කිරීම හෝ පවත්වා ගෙන යාමත් එය අවසාන කිරීමත් කළ හැකි ය , තව ද

(ඇ) ඒ තැනැත්තා එසේ සේවායෝජකයාව සිටිය දී ඔහු විසින් සේවයේ යොදවනු ලැබ සිටි සේවකයකු වශයෙන් ඒ ආරාවුලට සම්බන්ධ වෙනත් යම් තැනැත්තකු එසේ ඒ සේවායෝජකයා විසින් සේවයේ යොදවා සිටි යම් කාලසීමාවක් සඳහා ඒ දෙවනු කී තැනැත්තාට ඒ සේවායෝජකයා විසින් ගෙවිය යුතු වේතන වෙනුවෙන් හෝ ඒ දෙවනු කී තැනැත්තා යළි සේවයේ පිහිටුවීම වෙනුවට විකල්පයක් වශයෙන් ඔහුට ගෙවිය යුතු වන්දි වෙනුවෙන් හෝ යම් මුදලක් ඔහුට ගෙවන ලෙස, ඒ අධිකරණය විසින් හෝ ඒ බේරුම්කරු විසින් හෝ දෙනු ලබන යම් ප්‍රදානයක් මගින් ඒ සේවායෝජකයාව සිටි තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර , පළමු කී තැනැත්තා සේවායෝජකයාව සිටින විටක පරිද්දෙන් ඔහුට විරුද්ධව ඒ ප්‍රදානය බලාත්මක කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය

48. මේ පනතේ, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,_

"නියමිත දිනය" යන්නෙන් 1951 සැප්තැම්බර් 1 වැනි දින අදහස් වේ;

"බලය ලත් නිලධරයා" යන්නෙන්, යම් කාර්මික ආරවුලක් සමාදාන කිරීමෙන් නිරවුල් කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තෙක් අදහස් වේ;

"කොමසාරිස්වරයා" යන්නේන්, තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධූරය දරන තැනැත්තා අදහස් වන අතර_

(අ) තත් කාලයෙහි නියෝජ්‍ය කම්කරු කොමසාරිස් ධූරය හෝ සහකාර කම්කරු කොමසාරිස් ධූරය හෝ දරන තැනැත්තෙක් ද,

(ආ) මේ පනත යටතේ කොමසාරිස්වරයාගේ යම් බලයක් , කාර්යයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් වන විට ඒ බලය ක්‍රියාත්මක කිරීමට , හෝ ඒ කාර්යය හෝ කර්තව්‍යය ඉටු කිරීමට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද තැනැත්තෙක්ද

(ඇ) 3(1) (ආ) වන වගන්තිය මගින් කොමසාරිස්වරයා වෙත පවරන ලද බලය සම්බන්ධයෙන් වන විට යම් කම්කරු නිලධරයෙකු ද,

එම යෙදුමට ඇතුළත් වේ;

(1957 අංක 62, 25 වන වගන්තිය)

"දිස්ත්‍රික්කය" සහ "දිසා විනිශ්චයකාරවරයා" යන යෙදුම් වල , අධිකරණ සංවිධාන සංග්‍රහය පනතෙහි ඇති අර්ථය ම ඇත්තේ ය.

(1966 අංක 27, 11 වන වගන්තිය)

(1968 අංක 39, 2 වන වගන්තිය)

"සේවායෝජකයා" යන්නෙන් යම් සේවකයකු සේවයේ නියුක්ත කරවන යම් තැනැත්තකු වෙනුවෙන් වෙනත් යම් කෙනකු විසින් යම් සේවකයකු සේවයේ නියුක්ත කරවන ලද නම් එවැනි තැනැත්තෙක් හෝ

අදහස් වන අතර, සේවායෝජක මණ්ඩලයක් (ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වුව ද සමාගමක් වුව ද සංස්ථාවක් වුව ද වෘත්තීය සමිතියක් වුව ද ) සහ වෙනත් යම් කිසිවකු වෙනුවෙන් යම් සේවකයකු සේවයේ නියුක්ත කරවන තැනැත්තකු එම යෙදුමට ඇතුළත් වේ;

(1957 අංක 62, 26 වන වගන්තිය)

"අත්‍යවශ්‍ය කාර්මික ව්‍යාපාරය" යන්නෙන් ජන ජීවිතයට අත්‍යවශ්‍ය කර්මාන්තයක් බවට අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන නියමයක් මගින් ප්‍රකාශ කරන ලද කාර්මික ව්‍යාපාරයක් අදහස් වේ;

(1957 අංක 62, 26 වන වගන්තිය)

"කාර්මික ව්‍යාපාරය" යන්නට,_

(1962 අංක 4, 14 වන වගන්තිය)

(අ) කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, නිෂ්පාදනයක් සහ කෘෂි කර්මාන්තයක් ද , කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, නිෂ්පාදනයක් හෝ කෘෂි කර්මය වශයෙන් වූ යම් ව්‍යාපාරයක් හෝ නියුක්තියක් ද කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක නිෂ්පාදනයක හෝ කෘෂිකර්මයේ යම් අංශයක් හෝ කොටසක් ද,

(ආ) පළාත් පාලන ආයතනයක සේවයේ නියුක්ත තැනැත්තන් විසින් හෝ කර්මාන්තයක කාර්යයන් සඳහා වුව ද නොවුව ද යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම අරභයා යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද සංස්ථාවක සේවයේ යොදවා සිටින තැනැත්තන් විසින් හෝ ඉටු කරනු ලබන කවර වර්ගයක වුව සේවය , වැඩ හෝ ශ්‍රමය;

(ඇ) සේවකයන්ගේ සෑම නියුක්තියක් ජීවනෝපායක් හෝ සේවයක්; සහ

(ඈ) සේවා යෝජකයන්ගේ සෑම ව්‍යාපාරයක් ම ඇතුළත් වේ.

"කාර්මික ආරාවුල" යන්නෙන් යම් තැනැත්තකු සේවයේ යෙදවීම හෝ සේවයේ නොයෙදවීම් හෝ යම් තැනැත්තකුගේ සේවා නියුක්තියෙහි කොන්දේසි හෝ ශ්‍රමය යෙදවීමට අදාළ තත්ත්වයක් හෝ යම් තැනැත්තකුගේ සේවය අවසන් කිරීම ද හෝ යම් තැනැත්තකු සේවයේ යළි පිහිටුවීම හෝ සම්බන්ධයෙන් සේවායෝජකයකු හා සේවකයකු අතර නැතහොත් සේවකයන් හා සේවකයන් අතර ඇති යම් ආරාවුලක් හෝ මතභේදයක් අදහස් වන අතර, මේ අර්ථකථනයේ කාර්යය සඳහා, "සේවකයන්" යන්නට, සේවකයින්ගෙන් සමන්විත වෘත්තීය සමිතියක් ඇතුළත් වේ.

(1962 අංක 4, 14 වන වගන්තිය)

"පිටමං කිරීම" සහ "වැඩ වරජනය"යන පාඨ වලට වෘත්තීය සමිති ආඥා පනතේ දී ඇති අර්ථ ම ඇත්තේ ය.

"වැඩිපුර සේවකයන් ලෙස අස්කිරීම" යන්නෙන්, යම් සේවකයකු හෝ සේවකයන් හෝ යම් සේවායෝජකයකුගේ කාර්මික ව්‍යාපාරය කරගෙන යාම සඳහා ඔහුට අවශ්‍ය සේවක සංඛ්‍යාවට වඩා වැඩිපුර සිටීම හේතු කොට ගෙන එවැනි සේවකයකුගේ හෝ සේවකයන්ගේ හෝ සේවය එකී සේවායෝජකයා විසින් අවසන් කිරීම අදහස් වේ;

(1957 අංක 62, 26 වන වගන්තිය)

"වෘත්තීය සමිතිය" යන්නෙන්, වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලද (සේවා යෝජකයන්ගේ හෝ සේවකයන්ගේ) යම් වෘත්තීය සමිතියක් අදහස් වේ; තව ද

(1957 අංක 62, 26 වන වගන්තිය)

"සේවකයා" යන්නෙන්, ප්‍රකාශිත ගිවිසුමක් වන හෝ ව්‍යාංජිත ගිවිසුමක් වන හෝ , ලිඛිත හෝ වාචික ගිවිසුමක්

වන හෝ සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් වන හෝ , පුද්ගලිකව ම යම් වැඩක් කිරීම නැතහොත් ශ්‍රමය යෙදීම සඳහා වූ ගිවිසුමක් වන හෝ යම් ගිවිසුමකින් බැඳී සිටින නැතහොත් එවැනි ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තකු අදහස් වන අතර, යම් නිශ්චිත අවස්ථාවක දී සේවයේ යෙදී සිටිය ද නොසිටිය ද සාමාන්‍යයෙන් එවැනි යම් ගිවිසුමක් යටතේ සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ. තව ද සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ.

48 අ. මේ පනත යටතේ කොමසාරිස්වරයාගේ යම් බලයක් කම්කරු නිලධාරියකු විසින් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවක දී , කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ හෝ විධාන වලට ඒ නිලධරයා යටත් විය යුතු ය.

49. සේවායෝජකයකුගේ තත්ත්වයෙහි ලා රජයට හෝ ආණ්ඩුවට හෝ රජය නැතහොත් ආණ්ඩුව සම්බන්ධයෙන් හෝ , රජයේ නැතහොත් ආණ්ඩුවේ සේවයේ නියුක්ත සේවකයකුට හෝ එවැනි සේවකයකු සම්බන්ධයෙන් මේ පනතේ ඇතුළත් කිසිවක් අදාළ නොවන්නේ ය.

50. යම් සේවායෝජකයකු විසින්, යම් සේවකයකු වැඩිපුර සේවකයකු ලෙස සලකා සේවයෙන් අස් කරනු ලැබීමෙන් පසු, අලුතෙන් යම් සේවකයකු සේවයේ නියුක්ත කිරීමට ඒ සේවායෝජකයා අදහස් කරන අවස්ථාවක දී, යට කී පරිදි සේවයෙන් අස් කළ සේවකයා යළි සේවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වුවහොත් ඒ සේවායෝජකයා විසින් ඒ සේවකයාට වැඩි සැළකිල්ලක් දැක්විය යුතු ය.

(1957 අංක 62,
26 වන වගන්තිය)

(1962 අංක 4,
14 වන වගන්තිය)

(1968 අංක 439
2 වන වගන්තිය)

(1957 අංක 62,
26 වන වගන්තිය)

කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ හෝ විධාන වලට කම්කරු නිලධරයන් යටත්වන බව.

(1962 අංක 4,
15 වන වගන්තිය)

රජයට හෝ ආණ්ඩුවට හෝ රජයේ සේවකයන්ට හෝ ආණ්ඩුවේ සේවකයින්ට පනත අදාළ නොවන බව.

වැඩිපුර සේවකයකු වශයෙන් අස් කළ සේවකයකු යළි සේවයේ පිහිටුවීම.

(1962 අංක 4,
16 වන වගන්තිය)

51. (1) යම් වත්තක සේවයේ නියුක්ත කර සිටින සේවකයන්ගේ සේවායෝජකයා, "වතු අධිකාරි" හෝ "කළමණාකරු" යනුවෙන් හැඳින්වෙන හෝ දන්නා තැනැත්තකු වන අවස්ථාවක මේ පනතේ 31 ආ වගන්තිය යටතේ ඉදිරිපත් කරන ඉල්ලීමක හෝ 3 වන වගන්තිය යටතේ හෝ 4 වන වගන්තිය යටතේ හෝ කරන යොමු කිරීමක හෝ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීමේ හෝ යොමු කිරීමේ, ඒ අධිකාරිවරයාගේ හෝ කළමණාකරුගේ නම හෝ වෙනත් වැඩිදුර විස්තර කිසිවක් එකතු නොකොට, ඔහු "වතු අධිකාරි" හෝ "කළමණාකරු" යනුවෙන් නම් කිරීම ප්‍රමාණවත් වන්නේ ය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් කිසි ඉල්ලීමක් හෝ යොමු කිරීමක්, සහ ඒ ඉල්ලීමක් අනුව හෝ යොමු කිරීමක් අනුව හෝ කරන ලද කිසිම නියෝගයක් හෝ ප්‍රදානයක් ඒ උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල ව සේවායෝජකයා නම් කර තිබීමේ හේතුව නිසාම පමණක් නිර්බල නොවන්නේ ය.

වත්තක වතු අධිකාරිවරයා හෝ කළමණාකරු සේවා යෝජකයා වන බව.

(1968 අංක 39,
2 වන වගන්තිය)

# 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු, නිවාස සහ සමාජ සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ඒ වගන්තිය යටතේ අනුමත කරන ලද නියෝග.

ටී. බී. ඉලංගරත්න
කම්කරු, නිවාස සහ සමාජසේවා අමාත්‍ය

1959 පෙබරවාරි මස 25 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 1958 කාර්මික ආරාවුල් නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කාර්මික ආරාවුලක් පවතින්නා වූ හෝ කාර්මික ආරාවුලක් ඇති වීමට ඉඩ තිබෙන්නා වූ ද , එය අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක් හා සම්බන්ධ වන්නා වූ ද අවස්ථාවක, එහි පාර්ශවයන් විසින් ඔවුනොවුන් අතර ඒ ආරාවුල නිරවුල් කර ගැනීමට අපොහොසත් ව ඇත්නම්, මෙහි පහත සඳහන් කරුණු නිශ්චිත ව දැක්වෙන ලිඛිත දැන්වීමක් , ඒ පාර්ශව විසින් කොමසාරිස්වරයා වෙත යැවිය හැකි ය.

අ.) ආරාවුලේ පාර්ශවයන්ගේ නම් සහ ලිපින;

ආ.) ආරාවුලට විෂය වී ඇති කාරණා;

ඇ.) ඒ ආරාවුල නිරවුල් කිරීම පිණිස ගන්නා ලද පියවර; සහ

ඈ.) ඒ ආරාවුල සම්බන්ධව ඔවුන්ට ලබා ගත හැකි වෙනත් යම් තොරතුරු

(2) කොමසාරිසවරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, කාර්මික ආරාවුලක එක් එක් පාර්ශවය විසින්, ඒ කාර්මික ආරාවුල සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු , ඉහත කී දැන්වීමේ නිශ්චය කොට දක්වා ඇති කාලසීමාව ඇතුළත , කොමසාරිස්වරයා වෙත යැවිය යුතු ය.

3. පනත යටතේ ඇති කර ගන්නා ලද සාමූහික ගිවිසුමක් හෝ බේරුම්කරුවකුගේ හෝ කම්කරු විනිශ්චය අධිකාරයක නිරවුල් කිරීමක් නැතහොත් තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ සෑම දැන්වීමක් ම මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ‘අ’ ආකෘතියට සාරානුකූල ව විය යුතු ය.

4. (1) අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක කාර්මික ආරාවුලක් හේතු කොටගෙන සේවකයන් පිටමං කිරීමක් ආරම්භ කිරීමට සේවායෝජක යකුගේ අධ්‍යාශය පිළිබඳ ව වන සෑම දැන්වීමක් ම , මෙහි පළමුවන උපලේඛනයේ යේ දැක්වෙන ‘ආ’ ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) සේවකයන්

පිටමං කිරීමක් ආරම්භ කිරීමට අදහස් කර සිටින සේවායෝජකයකු විසින් (1) වන ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් ඒ පිටමං කිරීම බලපාන ඔහුගේ එක් එක් සේවකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය ; නැතහොත් ඒ සේවකයින් සේවයේ නියුක්ත කර සිටින ස්ථානයේ ප්‍රකට ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(3) සේවකයන් පිටමං කිරීම ආරම්භ කිරීමට අදහස් කර සිටින සේවායෝජකයා විසින් ඒ දැන්වීම සේවකයින් වෙත තැපෑලෙන් යවන දිනයේ දී ම නැතහොත් ඔවුන් සේවයේ නියුක්ත කර සිටින ස්ථානයේ ප්‍රදර්ශනය කරන දිනයේ දී ම එහි පිටපතක් කොමසාරිස්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

5. (1) අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරයක කාර්මික ආරාවුලක් හේතු කොටගෙන වැඩ වර්ජනයක් ආරම්භ කිරීමට සේවකයකුගේ අධ්‍යාශය පිළිබඳ ව වන සෑම දැන්වීමක් ම මෙහි පළමුවන උප ලේඛනයේ දැක්වෙන 'ඇ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් දැන්වීමේ පිටපතක් , එම සේවකයා විසින්, ඔහුගේ සේවායෝජකයා වෙත ලියාපදිංචි තැපෑලෙන් නැතහොත් සේවායෝජකයා පදිංචිව සිටි ස්ථානය ලෙස අවසාන වශයෙන් දන්නා ස්ථානයේ දී ඔහුට භාරදෙනු ලැබීම සඳහා අතින් යවනු ලැබිය යුතු ය.

(3) වැඩ වර්ජනය ආරම්භ කිරීමට අදහස් කර සිටින සේවකයා විසින් එම දැන්වීම ඔහුගේ සේවායෝජකයා වෙත යවනු ලබන දිනයේ දී ම එහි පිටපතක් , ඔහු විසින් කොමසාරිස්වරයා වෙත ද ලැබිය යුතු ය.

6. පනතේ 22 වන වගන්තියේ සඳහන් මූල මණ්ඩලයට කරනු ලබන සෑම පත් කිරීමක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

7. මේ නියෝග වල මින් මතු ''රෙජිස්ට්‍රාර්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන, කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා යනුවෙන් හැඳින්වෙන නිලධාරියකු විය යුතු ය . යම් කාර්මික අධිකරණයක් විසින් ඔහු වෙත පවරනු ලබන හෝ මේ නියෝග මගින් ඔහුට පනවනු ලබන හෝ කාර්යය කිරීම ද කර්තව්‍ය ඉටු කිරීම ද ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

8. (1) මෙහි පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් න් වන සියළු ඉල්ලුම්පත් රෙජිස්ට්‍රාර්වරයා වෙත , ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය :-

(අ) යම් කාර්මි මික අධිකරණය ක් වෙත ඉදිරිපත් කර ඇති

ලිපි ලේඛන වල සහතික කළ පිටපත් ලබා ගැනීම සඳහා;

(ආ) සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරවා ගැනීම සඳහා;

(ඇ) යම් කාර්මික අධිකරණයක් වෙත ඉදිරිපත් කර ඇති ලිපිලේඛන පරීක්ෂා කර බැලීම සඳහා; සහ

(ඈ) යම් කාර්මික අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද ලිපිලේඛන ආපසු ලබා ගැනීම සඳහා.

9. පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කාර්මික ආරාවුලක්, කාර්මික අධිකරණයක් වෙත යොමු කෙරෙන සෑම යොමු කිරීමක් ද පනතේ 10 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත කරන සෑම අභියාචනයක්ම පනතේ 27 වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත යොමු කරන සෑම ඉල්ලීමක් ම ද පනතේ 34 වන වගන්තිය යටතේ අර්ථ නිරූපණය සඳහා කාර්මික අධිකරණයක් වෙත යොමු කරන සෑම ප්‍රශ්ණයක්ම ද රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

10. (1) මේ පනතේ කාර්යය සඳහා පිහිටුවනු ලබන සෑම කම්කරු විනිශ්චය අධිකාරයක් ම ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතු ය.

(2) එවැනි කම්කරු විනිශ්චය අධිකාරයක් සංයුක්ත වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා යන නිලනාමයෙන් හැඳින්වාය යුතු ය.

11. පනතේ 31 ඇ වගන්තිය යටතේ පිහිටුවන ලබන කම්කරු විනිශ්චය අධිකාර වලට ලේකම්වරයෙක් ද අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන සහකාර ලේකම්වරයක් සංඛ්‍යාවක් ද අනුයුක්ත කළ යුතු ය.

12. කම්කරු විනිශ්චය අධිකාරය විසින් පවරනු ලැබිය හැකි හෝ මේ නියෝග මගින් පනවනු ලැබිය හැකි කාර්ය කිරීම ද කර්තව්‍යය ඉටු කිරීම ද ලේකම්වරයා සහ සහකාර ලේකම්වරුන් විසින් කරනු ලැබිය යුතුය.

13. (1) මෙහි පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් වන ඉල්ලුම්පත් (මෙහි මින්මතු මේ නියෝග වල ලේකම්වරයා යනුවෙන් සඳහන් කරනු ලබන) කම්කරු විනිශ්චය අධිකාරයේ ලේකම්වරයා වෙත , ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය: -

(අ) යම් කම් කරු විනිශ් චය අධිකා කාරයක් ක් වෙත ඉදිරිප ත් කර ඇති ලිපිලේ ලේඛන වල සහති ක කළ පිටපත් ත් ලබා ගැනී ම සඳහා ;

(ආ) සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරවා ගැනීම සඳහා ;

(ඇ) යම් කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කර ඇති ලිපිලේඛණ පරීක්ෂා කර බැලීම සඳහා : සහ

(ඈ) යම් කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කරන ලද ලිපිලේඛණ ආපසු ලබා ගැනීම සඳහා ;

(2) එවැනි ඉල්ලුම්පතක් පිළිබඳ ව ලේකම්වරයා විසින් ම තීරණයක් කළ හැකිය ; නැතහොත් ඒ ඉල්ලුම්පත පිළිබඳ ව තීරණයක් සඳහා අදාළ කම්කරු විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(3) ලේකම්වරයාගේ පොදු හෝ විශේෂ විධාන වලට යටත් ව සහකාර ලේකම්වරයකු විසින් ලේකම්වරයාගේ කර්තව්‍ය ඉටු කළ හැකි ය.

14. පනතේ 31 ආ වගන්තිය යටතේ වන සෑම ඉල්ලීමක් ම සහ පනතේ 34 වන වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයේ අර්ථනිරූපණය සඳහා යොමු කරනු ලබන සෑම ප්‍රශ්නයක් ම ලේකම්වරයා වෙත යැවිය යුතු ය.

15. පනතේ 31 ආ වගන්තිය යටතේ වන සෑම ඉල්ලීමක් ම මෙහි පළමුවන උපලේඛනයේ ‘ඇ’ ආකෘතියට සාරානුකූල ව විය යුතු අතර , ඒවා දෙපිටපතකින් යුතු ව ලේකම්වරයා වෙත යැවිය යුතු ය.

16. යම් සේවකයකු සම්බන්ධයෙන්, පනතේ 31 ආ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක් ම ඒ සේවකයාගේ සේවය අවසන් කර ලැබූ දින සිට මාස හයක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

17. යම් සේවකයකු සම්බන්ධයෙන්, වෘත්තීය සමිතියක් විසින් පනතේ 31 ආ වගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමක් ම ඒ වෘත්තීය සමිතියේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් අත්සන් කර තිබිය යුතු ය.

18. (1) පනතේ 10 වන වගන්තියේ (9) වන උප වගන්තිය යටතේ කොමසාරිස්වරයාගේ තීරණයකට විරුද්ධව කාර්මික අධිකරණයක් වෙත කරන සෑම අභියාචනයක් ම ඒ තීරණයේ දින සිට දවස් තිහක කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් සෑම අභියාචනයක් ම මෙහි පළමුවන උපලේඛනයේ ‘ඉ’ ආකෘතියට සාරානුකූලව වන පෙත්සමක් මගින් විය යුතු අතර , අභියාචනය කරනු ලබන්නේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණයේ පිටපතක් ද ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය. එවැනි පෙත්සමක් ලියාපදිංචි තැපෑලෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ අභියාචනයක් ලැබුණු විට , ඒ අභියාචනය, පනතේ 22 වන

වගන්තියට අනුකූලව කාර්මික අධිකරණයක් සංස්ථාපනය කිරීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා විසින් කොමසාරිස්වරයා මගින් අමාත්‍යවරයා වෙත හැකිතාක් ඉක්මණින් ඉදිරිපත් කළ යුතු ය.

19. කාර්මික අධිකරණයක යම් සාමාජිකයකු රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ඔහුට සිය කාර්යය ඉටු කිරීමට නොහැකි වන්නා වූ අවස්ථාවක, එසේ කාර්යය ඉටුකිරීමට අපොහොසත් ව සිටින තැනැත්තා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකි වනු පිණිස, එම කාරණය, රෙජිස්ට්‍රාර්වරයා විසින් කොමසාරිස්වරයා මගින් අමාත්‍යවරයා වෙත අප්‍රමාද ව වාර්තා කරනු ලැබිය යුතු ය.

20. (1) කාර්මික ආරාවුලක් නිරවුල් කිරීම සඳහා පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත යොමු කරනු ලැබූ පසුව හැකිතාක් ඉක්මණින් රෙජිස්ට්‍රාර්වරයා විසින් , ආරාවුලට විෂය වී ඇති කාරණය සම්බන්ධයෙන් ආරාවුලේ ඒ ඒ පාර්ශව වලට කියා සිටීමට ඇති කරුණු සම්පූර්ණයෙන් දැක්වෙන ප්‍රකාශයක ඔහුට අවශ්‍ය විය හැකි පිටපත් සංඛ්‍යාවක් ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස ඒ පාර්ශව වලට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය. ඒ පාර්ශව විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත , එසේ නියමිත පිටපත් සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපත් ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් රෙජිස්ට්‍රාර්වරයා විසින් , එක් එක් පාර්ශවය විසින් එවන ලද ප්‍රකාශයේ එක් පිටපතක් අනෙක් පාර්ශවය වෙත යවා, ඒ ප්‍රකාශ වලට පිළිවෙළින් ඒ එක් එක් පාර්ශවයේ පිළිතුරු දැක්වෙන ප්‍රකාශයක ඔහුට අවශ්‍ය විය හැකි පිටපත් සංඛ්‍යාවක්, ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස, ඒ එක් එක් පාර්ශවයට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය. ඒ පාර්ශව විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත , එසේ නියමිත පිටපත් සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපත් ලැබීමෙන් පසු, හැකිතාක් ඉක්මණින් රෙජිස්ට්‍රාර්වරයා විසින් , ඒ එක් එක් පාර්ශවය විසින් එවා ඇති පිළිතුරෙහි එක් පිටපතක් බැගින්, අනෙක් පාර්ශව වෙත යැවිය යුතු ය.

(4) පනතේ 10 වන වගන්තියේ (9) වන උපවගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව හෝ , පනතේ 27 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කාර්මික

අධිකරණයක් වෙත යොමු කරනු ලැබීමෙන් පසුව හෝ, පනතේ 34 වන වගන්තිය යටතේ අර්ථ නිරූපණය සඳහා ප්‍රශ්නයක් කාර්මික අධිකරණයක් වෙත යොමු කරනු ලැබීමෙන් පසුව හෝ හැකිතාක් ඉක්මණින් රෙජිස්ට්‍රාර්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචන පෙත්සමේ , ඉල්ලීමේ හෝ යොමුකිරීමේ පිටපත් ඔහුට අවශ්‍ය සංඛ්‍යාවක් ඔහු වෙත එවන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචනය, ඉල්ලීම හෝ යොමු කිරීම කළ තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට හෝ ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය . ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත , එසේ නියමිත පිටපත් සංඛ්‍යාවක් ඉදිරිපත් කළ යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචනයේ, ඉල්ලීමේ හෝ යොමු කිරීමේ පිටපත් තමා වෙත ලැබුණු විට , හැකිතාක් ඉක්මණින්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉන් එක් පිටපතක් , ඒ ආරාවුල, අභියාචනය, ඉල්ලීම හෝ යොමු කිරීම බලපෑ හැකි යයි ඔහු සළකන එක් එක් තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය හෝ වෙත යැවිය යුතු ය.

21. (1) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ ආරාවුලක් බේරුම්කරුවකු වෙත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත හෝ යොමු කරනු ලැබීමෙන් පසුව, හැකි තාක් ඉක්මණින්, අවස්ථාවෝචිත පරිදි බේරුම්කරු හෝ ලේකම්වරයා විසින් ආරාවුලට විශය වී ඇති කාරණා සම්බන්ධයෙන් ආරාවුලේ ඒ ඒ පාර්ශව වලට කියා සිටීමට ඇති කරුණු සම්පූර්ණයෙන් දැක්වෙන ප්‍රකාශයක, ඔහුට අවශ්‍ය විය හැකි පිටපත් සංඛ්‍යාවක් ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස , ඒ පාර්ශව වලට ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය . එකී පාර්ශව විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත , එසේ නියමිත පිටපත් සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපත් ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, බේරුම්කරු හෝ ලේකම්වරයා විසින්, එක් එක් පාර්ශවය විසින් එවන ලද ප්‍රකාශයේ එක්පිටපතක් අනෙක් පාර්ශව වෙත යවා, ඒ ප්‍රකාශ වලට පිළිවෙලින් ඒ එක් එක් පාර්ශවයේ පිළිතුරු දැක්වෙන ප්‍රකාශයක ඔහුට අවශ්‍ය විය හැකි පිටපත් සංඛ්‍යාවක්, ඔහු වෙත ඉදිරිපත් කරන ලෙස , ඒ එක් එක් පාර්ශවයට ලිඛිත දැන්වීමක් මගින් නියම

කළ යුතු ය. ඒ පාර්ශව විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත, එසේ නියමිත පිටපත් සංඛ්‍යාව ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන ඡේදයේ සඳහන් ප්‍රකාශයේ පිටපත් ලැබුණු පසු, හැකිතාක් ඉක්මණින්, අවස්ථාවෝචිත පරිදි, බේරුම්කරු හෝ ලේකම්වරයා විසින්, ඒ එක් එක් පිටපතක්, අනෙක් පාර්ශවය වෙත යැවිය හැකි ය.

1961.10.27 දින අංක 12731 දරන ගැසට් පත්‍රය

22. (1) පනතේ 34 වන වගන්තිය යටතේ වූ ප්‍රදානයක් හෝ නියෝගයක් අර්ථ නිරූපණය සඳහා ප්‍රශ්නයක් බේරුම්කරුවකු වෙත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත හෝ යොමු කරනු ලැබීමෙන් පසුව, හැකිතාක් ඉක්මණින්, බේරුම්කරු හෝ ලේකම්වරයා හෝ විසින් එම යොමු කිරීමේ පිටපත් , ඔහුට අවශය සංඛ්‍යාවක්, ඔහු වෙත එවන ලෙස, ඒ යොමු කිරීම කළ තැනැත්තනාට හෝ පුද්ගල මණ්ඩලයට හෝ ලිඛිත දැන්වීමක් මගින් නියම කළ යුතු ය . ඒ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩල හෝ විසින්, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත , එසේ නියමිත පිටපත් සංඛ්‍යාවක් ඉදිරිපත් කළ යුතු ය.

1961.10.27 දින අංක 12731 දරන ගැසට් පත්‍රය

(2) ඒ යොමු කිරීමේ පිටපත් තමා වෙත ලැබුණු විට , බේරුම්කරු හෝ ලේකම්වරයා හෝ විසින් , ඒ යොමුකිරීම බලපෑ හැකි යයි ඔහු සළකන එක් එක් තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය හෝ වෙත, ඉන් එක් පිටපතක් යැවිය යුතු ය.

නියෝගවල නියමයන් අතුරෙන් යමක් (1) වන ඡේදය යටතේ අත්හැර දමන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ නියමය හෝ නියමයන් ඒ කාරණයට හෝ ඒ හා සම්බන්ධයෙන් අදාළ නොවන්නාක් සේ සැළකිය යුතු ය.

23. (1) හදිසිතාවය නිසා හෝ වෙනත් යම් ප්‍රමාණවත් හේතුවක් නිසා, යම් කාරණයක් හා සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි 20, 21, 22 හෝ 31 වන නියෝග වල සියළු නියමයන් හෝ ඉන් යමක්, අත්හැර දැමීම යථෝචිත යයි හෝ අවශ්‍ය යයි කාර්මික අධිකරණය හෝ බේරුම්කරුවකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ අදහස් කරන අවස්ථාවක ඒ අධිකරණය හෝ බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය හෝ විසින්, ඒවා එසේ අත්හැර දමා ඒ කාරණය පිළිබඳ විභාගය පවත්වාගෙන යා හැකි ය.

(2) කාර්මික අධිකරණයක් හෝ බේරුම්කරුවකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ විසින් , යම් කාරණයක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි 20,21,22 හෝ 31 වන

1961.10.27 දින අංක 12731 දරන ගැසට් පත්‍රය

24. (1) යම් කාරණයක් කාර්මික අධිකරණයක් ඉදිරියේ විභාග කිරීම සඳහා නියම කරනු ලැබීමෙන් පසුව, හැකිතාක් ඉක්මණින්, රෙජිස්ට්‍රාර්වරයා විසින් , ඒ විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය, මෙහි පහත

නිශ්චය කොට දැක්වෙන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩල වෙත එනම් :-

(අ) ආරාවුලක් පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කාර්මික අධිකරණයක් වෙත යොමු කරනු ලැබ ඇති අවස්ථාවක ඒ ආරාවුලේ පාර්ශවයන් වෙත සහ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ අභියාචනයක්, ඉල්ලීමක් හෝ යොමු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ අභියාචනය ඉල්ලීම හෝ යොමු කිරීම කළ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය වෙත; සහ

(ආ) ඒ අභියාචනය, ඉල්ලීම හෝ යොමු කිරීම බලපෑ හැකි යැයි රෙජිස්ට්‍රාර්වරයා සලකන සෑම තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත

ලිඛිත දැන්වීමක් මගින් දැනුම් දිය යුතු ය.

(2) යම් කාරණයක් කාර්මික අධිකරණයක් ඉදිරියේ විභාග කිරීම සඳහා නියම කරනු ලැබීමෙන් පසුව ඒ විභාගය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය, රෙජිස්ට්‍රාර්වරයා විසින් හැකිතාක් ඉක්මණින් , ලිඛිත දැන්වීමක් මගින් , කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(3) (1) වන ඡේදයේ සෑම දැන්වීමක් ම මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති 'ඊ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

25. (1) යම් කාරණයක් බේරුම්කරුවකු ඉදිරියේ හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් ඉදිරියේ හෝ විභාග කිරීම සඳහා නියම කරනු ලැබීමෙන් පසුව හැකිතාක් ඉක්මණින්, බේරුම්කරු හෝ ලේකම්වරයා හෝ විසින් , ඒ විභාගය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය, මෙහි පහත නිශ්චය කොට දැක්වෙන තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය වෙත එනම් :-

(අ) ආරාවුලක්, පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ යොමු

කරනු ලැබ ඇති අවස්ථාවක, ආරාවුවුලේ පාර්ශවයන් වෙත සහ පනතේතේ 34 වන වගන්තිය යටතේතේ යොමු කිරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ

යොමු කිරීම කළ තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය වෙත; සහ

(ආ) ඒ ආරාවුල හෝ යොමු කිරීම බලපෑ හැකි යයි බේරුම්කරු හෝ ලේකම්වරයා සලකන සෑම තැනැතැතකු හෝ පුද්ගල මණ්ඩලයක් වෙත;

ලිඛිත දැන්වීමක් මගින් දැනුම් දිය යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් සෑම දැන්වීමක් ම මෙහි පළමු වන උපලේඛනයේ දක්වා ඇති “උ” ආකෘතියට සාරානුකූල විය යුතු ය.

26. කාර්මික ආරාවුලක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබීමෙන් පසුව, ඒ විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය අවස්ථාවෝචිත පරිදි බේරුම්කරු හෝ ලේකම්වරයා විසින් හැකි තාක් ඉක්මණින් , ලිඛිත දැන්වීමක් මගින්, කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

27. (අ) පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කාර්මික ආරාවුලක්, කාර්මික අධිකරණයක් වෙත යොමු කර ඇති අවස්ථාවක; හෝ

(ආ) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ , කාර්මික ආරාවුලක්, බේරුම්කරුවකු වෙත හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත හෝ යොමු කර ඇති අවස්ථාවක; හෝ

(ඇ) පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ අභියාචනයක්, ඉල්ලීමක් හෝ ප්‍රශ්නයක් කාර්මික අධිකරණයක් හෝ බේරුම්කරුවකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ වෙත යොමු කර ඇති අවස්ථාවක,

ඒ ආරාවුල, අභියාචනය, ඉල්ලීම හෝ ප්‍රශ්නය තමාගේ ස්වාර්ථය කෙරෙහි බලපාන්නා වූ කවර හෝ තැනැත්තකු විසින් , තමා එහි පාර්ශවකරුවකු කරන ලෙස අවස්ථාවෝචිත පරිදි ඒ කාර්මික අධිකරණය, බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය වෙත ඉල්ලීමක් කළ හැකිය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ තැනැත්තා පාර්ශවකරුවකු නොකළහොත් ඔහුගේ ස්වාර්ථයට එය අහිතකර ලෙස බලපෑ හැකි බවට ඒ අධිකරණය හෝ බේරුම්කරු හෝ විනිශ්චය අධිකාරය හෝ සෑහීමට පත්වුවහොත්, ඒ ඉල්ලීමට ඉඩ දෙනු ලැබිය හැකිය.

28. කාර්මික අධිකරණයක් හෝ බේරුම්කරුවකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ ඉදිරියේ ඇති නීති කෘත්‍යයක කවර හෝ පාර්ශවකරුවකු, ප්‍රමාණවත් හේතු දැක්වීමකින් තොරව, ඊට පැමිණීම හෝ නියෝජිතයකු මගින් පෙනී සිටීම හෝ පැහැර හැරියොත්, ඒ පාර්ශවකරු හෝ ඒ පාර්ශවකරු වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයකු හෝ පැමිණීම නොතකා, අවස්ථාවෝචිත පරිදි ඒ අධිකරණය, බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් එම කාරණය පිළිබඳ ව කටයුතු කරගෙන යා හැකි ය.

29. කාර්මික අධිකරණයක් විසින් හෝ බේරුම්කරුවකු විසින් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් හෝ කරන ලද තීරණයක, ප්‍රදානයක හෝ නියෝගයක ඇති යම් ලිපි දෝෂයක් හෝ වරදක් , ඒ අධිකරණය, බේරුම්කරු හෝ කම්කරු විනිශ්චය අධිකාරය විසින් නිවැරදි කරනු ලැබිය හැකි ය. තීරණය හෝ ප්‍රදානය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයෙන් පසුව එවැනි යම් නිවැරදි කිරීමක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නිවැරදි කිරීම

ද මුල් තීරණය හෝ ප්‍රදානය පළ කරනු ලැබූ ආකාරයෙන් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

30. කාර්මික අධිකරණයක්, හෝ බේරුම්කරුවකු හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ ඉදිරියේ ඇති යම් කාරණයක් පිළිබඳ විභාගයේ දී, ඒ අධිකරණය හෝ බේරුම්කරු හෝ විනිශ්චය අධිකාරය හෝ විසින් සුදුසු යැයි කල්පනා කරන අනුපිළිවෙලකට අනුව , පාර්ශවයන්ට ඔවුන්ගේ කරුණු කියා සිටින ලෙස, නියම කළ හැකි ය.

31. (1) මේ පනතේ 31 ආ වගන්තිය යටතේ ලේකම්වරයාට ඉල්ලීමක් ලැබුණු පසු, ඒ ඉල්ලීම නිසි ආකෘතියෙහි වේ නම්, ඔහු විසින් හැකිතාක් ඉක්මණින් ඒ ඉල්ලීමේ පිටපතක් , එය අදාළ වන සේවායෝජකයා වෙත යවා ඒ ඉල්ලීම අදාළ වන කාරණය පිළිබඳ ව ඔහුගේ පිළිතුර ගෙන හැර දැක්වෙන ප්‍රකාශයක්, දෙපිටපතකින් යුතු ව ඉදිරිපත් කරන ලෙස, ලිඛිත දැන්වීමක් මගින් සේවායෝජකයාට නියම කළ යුතු ය. සේවායෝජකයා විසින් ඒ ප්‍රකාශය, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත දෙපිටපතකින් යුතු ව ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදයේ සඳහන් පිටපත් ලේකම්වරයාට ලැබීමෙන් පසු , හැකිතාක් ඉක්මණින්, ලේකම්වරයා විසින් එම ප්‍රකාශයේ පිටපතක් ඉල්ලුම්කරුට යවා , ඒ පිළිබඳව ඉල්ලුම්කරුගේ පිළිතුර ගෙන හැර දැක්වෙන ප්‍රකාශයක් දෙපිටපතකින් යුතු ව ඉදිරපත් කරන ලෙස ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලුම්කරුට නියම කළ යුතු ය . ඉල්ලුම්කරු විසින් , ඒ ප්‍රකාශය, එකී දැන්වීමේ නියමිත කාලසීමාව ඇතුළත, දෙපිටපතකින් යුතු ය ඉදිරිපත් කළ යුතු ය.

32. පනතේ 31 ආ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් හෝ පනතේ 34 වන වගන්තිය යටතේ (නියෝගයක අර්ථ නිරූපණය සම්බන්ධයෙන්) කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරන ලද යොමු කිරීමක් හෝ විභාගය සඳහා නියම කිරීමෙන් පසුව හැකි තාක් ඉක්මණින් , ලේකම්වරයා විසින්, මෙහි පළමුවන උපලේඛනයේ 'උ' ආකෘතියට සාරානුකූලව විය යුතු ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලුම්කරුට සහ සේවායෝජකයාට, විභාගය සඳහා නියමිත දිනය, වේලාව සහ ස්ථානය දැනුම් දිය යුතු ය.

32 අ. කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරන ලද ඉල්ලීම් දෙකක් හෝ වැඩි ගණනක්, ඒ ඉල්ලීම් වලට අදාළ අවස්ථාගත කරුණු අනුව එකට එක්ව විභාග කිරීම උචිත යයි විනිශ්චය අධිකාරය සළකන්නේ නම් , ඒවා විනිශ්චය අධිකාරය විසින් එසේ එකට විභාග කළ හැකි ය.

33. කම්කරු විනිශ්චය අධිකාරයක සෑම නියෝගයක් ම හෝ තීන්දුවක් ම ලියවිල්ලකින් විය යුතු ය . ලේකම්වරයා විසින් නියෝගයේ හෝ තීන්දුවේ සහතික කළ පිටපතක් ඉල්ලුම්කරු වෙත සහ සේවායෝජක වෙත ඉදිරිපත් කිරීමෙන් ඒ නියෝගය හෝ තීන්දුව ගැන ඔවුන්ට දැනුම් දිය යුතු ය . ඒ නියෝගයේ හෝ තීන්දුවේ හෝ සහතික කළ පිටපතක්, ලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත ද යැවිය යුතු ය.

34. පනත යටතේ සාක්ෂිකරුවකු වෙත යවන

සෑම සිතාසියක් ම මෙහි පළමුවන උපලේඛනයේ “ඉ” ආකෘතියට සාරානුකූල ව විය යුතු ය.

34 අ. පනතේ 34 අ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම , මෙහි පළමුවන උපලේඛනයේ “ඊ” ආකෘතියට සාරානුකූල විය යුතු ය.

35. (1) පනත යටතේ පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී යම් පාර්ශවයක්, වෘත්තිය සමිතියක්, සේවායෝජකයකු හෝ සේවකයකු වෙනුවෙන් සාක්ෂි දීම සඳහා හෝ යම් ලියවිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා හෝ පෙනී සිටින ලෙස කැඳවනු ලැබූ කිසි ම සාක්ෂිකරුවකු -

(අ) ඒ නීති කෘත්‍යය බේරුම්කරුවකු ඉදිරියේ පැවැත්වෙන නීති කෘත්‍යය වන විට දී , ඒ සාක්ෂිකරුගේ බටා සහ ගමන් වියදම් පියවීමට ප්‍රමාණවත් යයි එම බේරුම්කරුට පෙනීයන ප්‍රමාණයක් , තත් කාර්යය සඳහා බේරුම්කරු නියම කළ යුතු දිනයක දී හෝ ඊට පෙර ඒ පාර්ශවය, යම් මුදල් සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් කොමසාරිස්වරයා වෙත තැන්පත් කළහොත් හෝ එම මුදල් ගෙවන බවට ඇප තැබුවහොත් මිස; හෝ

(ආ) ඒ නීති කෘත්‍යය, කාර්මික අධිකරණයක් ඉදිරයේ පැවැත්වෙන නීතිකෘත්‍ය වන විට දී , ඒ සාක්ෂිකරුගේ බටා සහ ගමන් වියදම් පියවීමට ප්‍රමාණවත් යයි ඒ අධිකරණයට පෙනී යන යම් මුදල් ප්‍රමාණයක් , තත් කාර්යය සඳහා ඒ අධිකරණය විසින් නියම කළ යුතු දිනයක දී හෝ ඊට පෙර , ඒ පාර්ශවය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් රෙජිස්ට්‍රාර්වරයා

1972.05.15 දින අංක 15010 දරන ගැසට් පත්‍රය

වෙත
තැන්
පත්
කළ
හොත්
ත්
හෝ
එම
මුදල
ගෙව
න
බවට
ඇප
තැබු
වහො
ත්
මිස;
හෝ
ඒ
නීති
කෘත්‍ය
ත්‍යය
කම්
කරු
විනිශ්
චය
අධිකා
කාරයක්
ක්
ඉදිර
යේ
පැවැත්
ත්වෙ
න
නීතිකෘ
කෘත්‍ය
ය
වන
විට දී,
ඒ
සාක්ෂි
ෂිකරු
ගේ
බටා
සහ

ගමන් වියදම් පියවීමට ප්‍රමාණවත් යැයි ඒ විනිශ්චය අධිකාරයට පෙනී යන යම් මුදල් ප්‍රමාණයක් , තත් කාර්යය සඳහා ඒ විනිශ්චය අධිකාරය විසින් නියම කළ යුතු දිනයක දී හෝ ඊට පෙර , ඒ පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් ලේකම්වරයා වෙත තැන්පත් කළහොත් එම මුදල ගෙවන බවට ඇප තැබුවහොත් මිස පෙනී සිටීමට බැඳී නොසිටින්නේ ය.

(2) මෙයට පෙරාතුව වූ ඡේදය අනුව මුදල් තැන්පත් කිරීම හෝ ඇප තැබීම යම් පාර්ශවයක් හෝ සමිතියක් හෝ සේවායෝජකයකු හෝ සේවකයකු හෝ විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, සාක්ෂිකරු වෙත යවන සිතාසියෙහි, ඔහු පැමිණ සිටීමට බැඳී නොසිටින බව නිශ්චිතව සඳහන් කළ යුතු ය.

1961.10.27 දින අංක 12731 දරන ගැසට් පත්‍රය

36. මේ නියෝග වල ප්‍රකාශිතව අන්‍යාකාර විධිවිධාන සළසා ඇති අවස්ථාවන් හි හැර, පනත යටතේ නිකුත් කරන ලද යම් දැන්වීමක්, සිතාසියක්, ආඥාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුට භාර දීම , අතින් භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් යැවීමෙන් හෝ ඒ තැනැත්තා අවසාන වශයෙන් පදිංචිව සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයේ දොරටුවෙහි ඒ දැන්වීම , සිතාසිය, ආඥාව හෝ වෙනත් ලියවිල්ල ඇලවීමෙන් හෝ සිදු කළ යුතු ය.

37. පනතෙහි හෝ මේ නියෝගවල හෝ ප්‍රකාශිතව අන්‍යාකාර විධිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, පනත යටතේ නිකුත් කරන ලද සෑම දැන්වීමක්, සිතාසියක්, ආඥාවක් හෝ වෙනත් ලියවිල්ලක්_

(අ) සේවායෝජකයකු සම්බන්ධයෙන් වන විට_

(i) සේවායෝජකයා ම වෙත; හෝ

(ii) සේවායෝජකයා වෘත්තීය සමිතියක් විසින් නියෝජනය කරනු ලබන විට , ඒ වෘත්තිය සමිතියේ සභාපති , ලේකම් හෝ යම් වෙනත් නිලධරයකු වෙත; හෝ

(iii) සේවායෝජකයා සංස්ථාපිත මණ්ඩලයක් වන විට, ඒ මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකු, කළමණාකරු හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු වෙත; හෝ

(iv) සේවායෝජකයා ව්‍යාපාපාර ආයතනයක්ක් වන විට, ඒ ව්‍යාපාපාර ආයතනයේ කවර හෝ හවුල් කරුවකු වෙත සහ

(ආ) සේවකයන් සම්බන්ධ වන විට_

(i) සේවකයන්න් , වෘත්තිතිය සමිති

යක් විසින් නියෝජනය කරනු ලබන විට , ඒ වෘත්තිය සමිතියේ සභාපති , ලේකම් හෝ වෙනත් යම් නිලධරයකු වෙත ; හෝ

(ii) අනෙකුත් අවස්ථාවන් හි දී , සේවකයන් විසින් නම් කරනු ලැබ තිබිය හැකි නියෝජිතයෙක් ඇත්නම් ඒ නියෝජිතයා වෙත හෝ එවැනි නියෝජිතයෙක් නොමැති නම් කාර්මික ආරාවුලේ පාර්ශවකරුවන් වන එක් එක් සේවකයා වෙත

භාර දෙනු ලැබිය හැකි ය.

38. (1) පනතේ කාර්යය සඳහා සේවායෝජකයන්ගෙන් පමණක් සමන්විත (සේවායෝජකයන්ගේ වෘත්තීය සමිතියක් නොවන) පාර්ශවයක් නියෝජනය කළ යුතු තැනැත්තන් සංඛ්‍යාව , මෙහි පහත දැක්වෙන ආකාරයට නිශ්චය කරන ලද සංඛ්‍යාවට නොවැඩි සංඛ්‍යාවක් විය යුතු ය.

(අ) සේවායෝජකයන් 10 දෙනෙකු හෝ 10 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ආ) සේවායෝජකයන් 10 දෙනෙකුට වැඩි සහ 25 දෙනෙකු දක්වා වන සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ඇ) සේවායෝජකයන් 25 දෙනෙකුට වැඩි සහ 75 දෙනෙකු දක්වා වන සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ඈ) සේවායෝජකයන් 75 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(2) පනතේ කාර්යය සඳහා සේවකයන්ගෙන් පමණක් සමන්විත පාර්ශවයක් නියෝජනය කළ යුතු තැනැත්තන් සංඛ්‍යාව, මෙහි පහත දැක්වෙන ආකාරයට නිශ්චය කරන ලද සංඛ්‍යාවට නොවැඩි සංඛ්‍යාවක් විය යුතු ය.

(අ) සේවකයන් 25 දෙනෙකුට හෝ 25 දෙනෙකුට අඩු සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ආ)

සේව
කයන්
න් 25
දෙනෙ
නෙකුට
වැඩි
සහ
100
දෙනෙ
නෙකු
දක්වා
වන
සංඛ්‍යා
බ්‍යාවක්
වෙනු
වෙන්
නියෝ
යෝජිත
යන්

(ඇ)

සේව
කයන්
න්
100
දෙනෙ
නෙකුට
වැඩි
සහ
400

දෙනෙකු දක්වා වන සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ඈ) සේවකයන් 400 දෙනෙකුට වැඩි සහ 750 දෙනෙකු දක්වා වන සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(ඉ) සේවකයන් 750 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් නියෝජිතයන්

(3) පාර්ශවයක්, වෘත්තීය සමිති වල කොටසක් ද එවැනි යම් වෘත්තීය සමිතියක සාමාජිකයන් නොවන සේවායෝජකයන් හෝ සේවකයන්ගේ කොටසක් ද වශයෙන් සමන්විත වන අවස්ථාවක, ඒ සේවායෝජකයන් නියෝජනය කළ යුතු තැනැත්තන් සංඛ්‍යාව මේ නියෝගයේ (1) වන ඡේදයේ ගෙන හැර දක්වා ඇති ආකාරයට නිශ්චය කළ යුතු අතර , ඒ සේවකයන් නියෝජනය කළ යුතු තැනැත්තන් සංඛ්‍යාව, මේ නියෝගයේ (2) වන ඡේදයේ ගෙන හැර දක්වා ඇති ආකාරයට නිශ්චය කළ යුතු ය.

1961.10.27 දින අංක 12731 දරන ගැසට් පත්‍රය

39. (1) ප්‍රදර්ශනය කළ යුතු යැයි පනතින් නියමිත දැන්වීමක් පරීක්ෂා කිරීමේ හෝ පනතේ විධිවිධාන පිළිපදිනු ලබන්නේ දැයි විමසා දැන ගැනීමේ හෝ පවත්නා නැතහොත් උද්ගත වේ යැයි බලාපොරොත්තු වන යම් කාර්මික ආරාවුලක් හා සම්බන්ධ හෝ ඊට අදාළකමක් ඇති යම් කාරණයක් විමර්ශනය කිරීමේ හෝ කාර්යය සඳහා, කොමසාරිස්වරයා හෝ යම් බලයලත් නිලධරයකු හෝ කම්කරු නිලධරයකු හෝ පනත යටතේ පත්කරන ලද නිලධරයකු හෝ විසින් , දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ සියළු යුක්ති සහගත වේලාවන් හි_

(අ) සේවායෝජකයන් හෝ සේවකයන් වැඩ කරන යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුළු විය හැකි ය;

(ආ) ඒ පරිශ්‍රය හෝ ස්ථානය සහ එහි ඇති යම් යන්ත්‍රසූත්‍ර , උවාරණ හෝ භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය;

(ඇ) ඒ පරිශ්‍රයේ හෝ ස්ථානයේ සිට ඔහුට හමුවන කවර හෝ තැනැත්තකුගෙන් ප්‍රශ්න කළ හැකි ය.

(2) මෙයට පූර්වයෙන් ඇති ඡේදය යටතේ බලය ලැබී ඇති පරිදි ඒ ඡේදයේ නිශ්චය කොට දැක්වෙන විස්තරයකට අයත් වන යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට, ඇතුළුවීමේ, එය පරීක්ෂා කිරීමේ හෝ සෝදිසි කිරීමේ කාර්යය සඳහා යම් නිලධරයකුට අවශ්‍ය විය හැකි , පහසුකම් සැපයීම ඒ පරිශ්‍රයක් හෝ ස්ථානයක් භාරව සිටින තැනැත්තාගේ සහ ඒ තැනැත්තාගේ සෑම අනුයෝජිතයකුගේ හෝ සේවකයකුගේ කාර්යය වන්නේ ය.

40. මෙහි දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන නිලධරයන්ට, ඒ උපලේඛනයේ අදාළ විධිවිධාන අනුව ගණන් බලන ලද පාරිශ්‍රමික, ගමන් වියදම් දීමනා සහ යැපීම් දීමනා ගෙවිය යුතු ය.

41. සාක්ෂිකරුවන්ට, මෙහි තුන්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගෙවීම් ප්‍රමාණ අනුව ගණන් බලන ලද බටා සහ ගමන් වියදම් දීමනා, ගෙවිය යුතු ය.

42. බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් හෝ කම්කරු විනිශ්චය අධිකාරයක් හෝ විසින් නියම කරන ලද ගාස්තු කිසිවක් වෙතොත් ඒවා සිවිල් නඩුවක දී දරන ලද ගාස්තු වූවාක් සේ අය කර ගත යුතු ය.

43. මේ නියෝග වල පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය නම්

මිස_

"පනත" යන්නෙන්, තදන්තර නීති ප්‍රඥප්ති මගින් සංශෝධිත පරිදි වූ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත අදහස් වේ.

"බලයලත් නිලධාරියා", "කොමසාරිස්වරයා", "අත්‍යාවශ්‍ය කාර්මික ව්‍යාපාරය" යන යෙදුම් වලට, පනතෙහි ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය.

44. 1951 සැප්තැම්බර් මස 29 වන දින අංක 10,302 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, කළින් කල සංශෝධිත, 1951 කාර්මික ආරාවුල් නියෝග, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.